BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# 2012

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**இலங்கை முதலீட்டுச் சபை**
பொருளாதார அபிவிருத்தி அமைச்சு

BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# 2012

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

BOI

SRI LANKA

# පටුන


*පිටු අංකය*

**සභාපතිතුමාගේ පණිවුඩය** **04**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම** **06**
- අරමුණු හා කාර්යභාරය 06
- දැක්ම හා මෙහෙවර 07
- අධ්‍යක්ෂ මණ්ඩලය 08
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 09

**සමාලෝචනය** **10**
- ප්‍රධාන සිදුවීම් සහ සුවිශේෂී අවස්ථා 10
- ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය 11
- ලෝක ආයෝජන ස්වරූපය - 2011 14
- ආයෝජන කාර්යසාධනය 19

**දෙපාර්තමේන්තු කාර්යසාධනය** **24**
- අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය 24
- I වන ආංශික කණ්ඩායම 24
- II වන ආංශික කණ්ඩායම 31
- III වන ආංශික කණ්ඩායම 38
- ආයෝජක සේවා 42
- නෛතික සහාය 45
- තාක්ෂණික සේවා 46
- අපනයන සැකසුම් කලාප /IP/EPP 47
- පරිසර කළමනාකරණය 48
- ඉංජිනේරු අනුමත කිරීම් සහ විශේෂ ව්‍යාපෘති 49
- කාර්මික සබඳතා 51
- මාධ්‍ය හා ප්‍රචාරණය 53
- පරිපාලනය 54
- ආරක්ෂක හා ගිනි නිවීම් 55
- මානව සම්පත් කළමනාකරණය 58
- පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශනය 62
- තොරතුරු තාක්ෂණය 63
- අභ්‍යන්තර විගණනය 64

**මූල්‍ය සමාලෝචනය** **65**
ආදායම 65
මෙහෙයුම්, පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් 66
රජයේ බදු සහ මූල්‍ය වියදම් 67
ප්‍රාග්ධන වියදම් 67
2012 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් විස්තරය 68
2012 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය 69
2012 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 70
2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 71
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 72

**විගණන වාර්තාව** **79**
විගණකාධිපතිවරයාගේ වාර්තාව 79
විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධයෙන් අදහස් දැක්වීම 101
විගණන කමිටු වාර්තාව 120

**ඇමුණුම්** **121**
කාර්යසාධනයේ සුවිශේෂී අවස්ථා 122
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17වන වගන්තිය යටතේ
අනුමත ව්‍යාපෘති වල සාරාංශය 124
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 16වන වගන්තිය යටතේ
අනුමත ව්‍යාපෘති වල සාරාංශය 125

**ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය** **126**

# සභාපති තුමාගේ පණිවුඩය



2012 වසර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවක් සනිටුහන් කරන වසරකි. ආයෝජන මණ්ඩල ඉතිහාසයේ මෙතෙක් ලබාගත් ඉහළතම විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය වන ඇමෙරිකානු ඩොලර් බිලියන 1.34 අත්පත් කර ගැනීමට අපට හැකි වූ අතර ඩොලර් බිලියනයේ සීමාව ඉක්මවා යෑමට හැකි වූ දෙවන අවස්ථාවද මෙයයි. එම නිසා සාමයේ ප්‍රතිලාභ අවසානයේදී මල් ඵල දරා ඇති බවට ද ,රට ඉහළ තලයකට ඔසවා තැබිය හැකි වන පරිදි නව පිබිදෙන ආර්ථිකයක් ඇති කිරීමේ ශක්‍යතාව පිළිබදව ද අපේක්ෂාවන් අප තුළ ඇති වේ.

අවම වශයෙන් 2% කින් හෝ එයට වඩා වැඩියෙන් හෝ දළ දේශීය නිෂ්පාදිතයට දායක වෙමින් විදේශ සෘජු ආයෝජන ආර්ථිකයේ ප්‍රධාන සංරචකයක් බවට පත් කිරීම ශ්‍රී ලංකාවේ වත්මන් අවශ්‍යතාවයි.

අපනයනය සදහා සම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අපනයනය පාදක කර ගත් සේවා, සංචාරක ව්‍යාපාරය හා ආශ්‍රිත සේවා, යටිතල පහසුකම්, උසස් අධ්‍යාපනය, අගය එකතු කළ ක්‍රමෝපායික ව්‍යාපෘති, කර්මාන්ත උද්‍යාන සංවර්ධනය සහ විශේෂ ආර්ථික කලාප සංවර්ධනය වැනි 2010 වසරේදී හඳුනාගත් ප්‍රමුඛතම අංශ අපගේ උපායමාර්ගික  කේන්ද්‍ර  ලෙස පවතී.

කෙසේ වුවද, දිගු කාලීනව ශ්‍රී ලංකාවේ ධාරිතාව වැඩිදියුණු කළ හැකි ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම පිළිබදව අවධානය යොමු කළ යුතු වේ. බ්‍රිතාන්‍යයේ පස්වන විශාලතම විශ්ව විද්‍යාලය වන "සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්ව විද්‍යාලය"  මගින් එම විශ්ව විද්‍යාලයේ ශාඛාවක් 2012 වසරේදී මීරිගමදී ස්ථාපනය කිරීමට තීරණය කර තිබීම පිළිබදව මම අතිශයින්ම සතුටු වෙමි. මෙම විශ්ව විද්‍යාලය වැනි ලෝක ප්‍රසිද්ධ වෙනත් විශ්ව විද්‍යාලවල ශාඛා ද කොළඹ  දී ස්ථාපනය කිරීමට මෙය පිටුවහලක් වනු ඇත.

ශ්‍රී ලංකාවට පර්යේෂණ හා සංවර්ධන හැකියාව ලබා දිය හැකි ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තවත් අවශ්‍යතාවකි. එම නිසා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමග එක්ව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) විසින් ස්ථාපනය කරන ලද නැනෝ තාක්ෂණ උද්‍යානය වැනි ව්‍යාපෘති මගින් මෙතෙක් කිසිදා නොතිබූ රැකියා අවස්ථාද උත්පාදනය කරනු ඇත. කුසලතා සහිත ශ්‍රී ලාංකිකයන්ට රැකියා අවස්ථාද මෙමගින් උත්පාදනය කළ හැකි වන අතර වර්තමානයේදී මෙරට මුහුණ පා ඇති විශාල ගැටළුවක් වන බුද්ධි ගලනය ද යම් මට්ටමකින් හෝ අඩු කිරීමට ද මෙය පිටුවහලක් වනු ඇත.

සමස්ත ජනගහණයට ප්‍රතිලාභ ලබාදීම සඳහා විදේශ ඍජු ආයෝජන ගලා ඒම තව දුරටත් වැඩි දියුණු කිරීම අවශ්‍ය වන බව රජයේ පාර්ශ්වයෙන් අවබෝධ කර ගැනීමද එයට සමානවම වැදගත් වේ.

එනිසා 2012 වසරේදී මෙරට අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැදගත් පියවර රාශියක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇත.

හම්බන්තොට මිරිජ්ජවිල ප්‍රදේශයේ හෙක්ටයාර් 228ක භූමි ප්‍රමාණයක මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය (Mirijjawila EPZ) ස්ථාපනය කිරීමේ කටයුතු පසුගිය වසරේදී ආරම්භ කරනු ලැබීය. මෙම කලාපය ඉදිකිරීමෙන් පසුව, හම්බන්තොට වරායට හා මත්තල ගුවන් තොටුපොළට සමීපව පිහිටා තිබීම හේතු කොටගෙන මෙම කලාපයෙන් බොහෝ ප්‍රතිලාභ ලබා ගත හැකිවනු ඇත. මෙය වාහන කොටස් එකලස් කිරීමේ කම්හල්වලටද, සැපයුම් මධ්‍යස්ථානවලටද, නැව් අලුත්වැඩියා කිරීමේ කටයුතුවලටද අතිශයින්ම යෝග්‍ය වේ.

2012 වසරේදී සූරියවැව ආයෝජන කලාපයේ කටයුතුද ආරම්භ කරනු ලැබීය. තොරතුරු තාක්ෂණ උද්‍යානය, අධ්‍යාපනික ආයතන, ක්‍රීඩා පුරවර, නේවාසික ප්‍රදේශ හා මිශ්‍ර සංවර්ධන කටයුතු ආදිය සඳහා මෙමගින් ඉඩකඩ වෙන් වේ. ත්‍රිකුණාමලයට ආසන්න සාම්පූර් ප්‍රදේශයේ බැර කර්මාන්ත කලාපයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2012 වසරේදී අනුමත කරන ලද තවත් වැදගත් ව්‍යාපෘතියකි. මෙම කලාපයේ මෙහෙයුම් කටයුතු මූල්‍යයනය කිරීම, සැලසුම් කිරීම, ඉදිකිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ වගකීම දරන ආයෝජකයකු විසින් මෙම කලාපයේ කටයුතු මෙහෙයවනු ඇත.

2012 වසරේදී, මෙම නව කලාප ස්ථාපනය කිරීමට අමතරව රුපියල් මිලියන 721 ක මුළු ආයෝජනයක් සිදු කරමින් දැනට පවතින කලාපවල යටිතල පහසුකම් නවීකරණය කිරීම හා වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආරම්භ කර තිබේ.

2012 වසරේදී ප්‍රධාන වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගි වීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එහි ප්‍රතිරූපය ඉහළ තලයකට නංවා ගැනීමට හැකිවිය. ආයෝජන පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහය වීම පිණිස මෙන්ම රැකියා අපේක්ෂිතයන්ට රැකියා ලබාගැනීමට සහය වීම පිණිස රැකියා බැංකු කවුළුවක්ද ස්ථාපනය කර තිබූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබූ ශාලාවේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රදර්ශන කුටියක් ද ඉදිකර තිබුණි.

දශක තුනකට පසුව යාපනය නගරයේ පවත්වනු ලැබූ පළමුවන වෙළඳ ප්‍රදර්ශනය වන, “යාපනය අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය” සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය. සුනිත්‍ය බලශක්තිය පිළිබඳ රටේ ප්‍රධානතම ප්‍රදර්ශනය වන, “විදුල්කා 2012” ප්‍රදර්ශනය සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ ප්‍රදර්ශනය වන “එක්ස්පෝ 2012” ප්‍රදර්ශනය සඳහාද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය.

එම නිසා, පසුගිය 2012 වසර ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටුකළ වසරක් බවද ආයෝජකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ වඩාත් හිතකර සහ ප්‍රියමනාප පරිසරයක් සැකසීම සඳහා පදනම දැමූ වසරක් බවද සඳහන් කිරීම නිවැරදිය.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකාවේ නිශ්චිත ප්‍රදේශවලදී කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, සමායෝජනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම සඳහා රජයේ ප්‍රමුඛතම නියෝජිතායතනය ලෙස කටයුතු කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) ලෙස නම් කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 1978 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්ථාපනය කරනු ලැබීය. සංවර්ධනය පිළිබඳ මූලික ආකෘතිය වූයේ බදු සහන හා වෙනත් පහසුකම් සපයනු ලබන අපනයන ප්‍රවර්ධන කලාප ලෙස හඳුන්වනු ලබන විශේෂිත ප්‍රදේශ වෙන් කිරීමයි. කටුනායක හා බියගම ප්‍රදේශවල මෙම කලාප මුලින්ම ස්ථාපනය කරනු ලැබූ අතර පසුව ක්‍රමයෙන් තවත් කලාප මෙයට එකතු කරනු ලැබීය. වර්තමානයේ දී සමස්ත වශයෙන් මෙවැනි කලාප 12ක් ස්ථාපනය කර තිබේ.

සමස්ත දිවයිනම ආවරණය කිරීමේ අරමුණින් එහි විෂය පථය පුළුල් කරමින් පාර්ලිමේන්තුවේ දී සම්මත වූ පනතක් මගින් 1992 දී මහ කොළඹ ආර්ථික කොමිසම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලෙස වෙනස් කරනු ලැබීය. එයට පෙර කටුනායක, බියගම හා කොග්ගල ප්‍රදේශවල මේ දක්වා ස්ථාපනය කර ඇති අපනයන සැකසුම් කලාප සඳහා වෙන් කරනු ලැබූ විශේෂ ප්‍රදේශවලට පමණක් එහි බලතල සීමා වී ඇත.

කාර්මික අපනයන ක්ෂේත්‍රයේ විදේශ හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය, සමායෝජනය හා ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු නියෝජිතායතනයක් ලෙස කටයුතු ආරම්භ කරමින් සේවා අංශය මෙන්ම යටිතල පහසුකම් අංශය සඳහා ද ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සමායෝජනය කිරීම සහ පහසුකම් සැපයීම යන එහි වත්මන් කාර්ය භාරය වෙතට ආයෝජන මණ්ඩලය ක්‍රමයෙන් ප්‍රවිෂ්ට විය.

### අපගේ අරමුණු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන අරමුණුවලින් අවධාරණය කරනු ලබන්නේ විශේෂයෙන් ම රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්වය තුළින් ආර්ථික සංවර්ධනය අභිවර්ධනය කිරීම හා ඇති කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම , දේශීය ආයෝජන හා විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපැයීමේ ප්‍රභව විවිධාංගීකරණය කිරීම හා අපනයන ඉපයීම් වැඩි දියුණු කිරීම, නව්‍යතා ප්‍රවර්ධනය, නව තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම හා නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙන්ම දිවයින පුරා ආයෝජන ප්‍රවර්ධන කලාප (IPZS) ස්ථාපනය කිරීමයි .

### අපගේ කාර්ය භාරය

අපගේ කාර්ය භාරය වන්නේ රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහය දක්වමින් ප්‍රමුඛතම අංශ සඳහා ආයෝජන අවස්ථා ඉලක්ක කිරීම හා ආකර්ෂණය කිරීම මෙන්ම ජාතික වර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා දායකත්වය සපයමින් විදේශීය සෘජු ආයෝජන මට්ටම ක්‍රමයෙන් වැඩි දියුණු කිරීමයි.

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන , යටිතල පහසුකම්, සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මාන්තය, තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සේවා හා වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති ආරම්භ කිරීමට අදහස් කරන ආයෝජකයන් හා සම්බන්ධතා පවත්වන පළමුවන ආයතනය ලෙස ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. අවශ්‍ය වන තොරතුරු හා මඟපෙන්වීම් ව්‍යාපෘති අයදුම්පත් භාරදීමට පෙර ලබා දෙනු ලබන අතර වෙනත් නියෝජිතායතනවලින් අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන අවස්ථාවල ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය සමායෝජන කටයුතු සිදු කරයි.

දිරි ගැන්වීම් මත සහන අනුමත කිරීම හා ලබාදීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදාළ අංශවල ආයෝජනය කිරීම සඳහා ලැබෙන අයදුම් පත් තක්සේරු කිරීම ද සිදු කරයි. එමෙන්ම අමුද්‍රව්‍ය හා සංරචක මත පැනවිය හැකි බදු නිදහස් කිරීම් හා තනතුරු දරන විදේශීය පුද්ගලයන් සඳහා වීසා නිකුත් කිරීම වෙනුවෙන් ආගමන බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සිදු කරයි.

ව්‍යාපෘති චක්‍රයේ ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා ආයෝජන මණ්ඩලය මගින් ආයෝජකයන්ට සහය ලබාදෙනු ලබන අතර ආනයන/ අපනයන නිෂ්කාශන ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම හා ඒ සඳහා සහභාගී වීම, ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය සඳහා රේගු නිෂ්කාශන ලබා දීම හා නිමි භාණ්ඩ අපනයනය කිරීම තුළින් සාර්ථක ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ද ආයෝජන මණ්ඩලය සහය ලබා දෙයි.

සමස්ත ආයෝජන සහ /හෝ අපනයන ඉපයීම්වල සීඝ්‍ර වැඩිවීමක් ලබාගැනීම සඳහා අවශ්‍ය වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආයෝජකයන්ට සුදුසු පරිශ්‍ර ලබා දීම පිණිස සියළු යටිතල පහසුකම් ලබා දෙමින් ආයෝජක ප්‍රවර්ධන කලාප සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු සිදු කරයි.

# දැක්ම

"ආර්ථික සමෘද්ධිය තුළින් ශ්‍රී ලාංකික සියළු ජනතාවගේ සුභ සාධනය සහතික කිරීම."

# මෙහෙවර

"රජයේ මුදල් හා පිස්කල් ප්‍රතිපත්තීන්ට ගැළපෙන පරිදි, ඉලක්කගත අංශයන්හි දේශීය හා විදේශීය ආයෝජනයන් ඇත්පත් කර ගැනීම තුළින් ජාතික සංවර්ධනය ළඟා කර ගැනීම."

# අධ්‍යක්ෂ මණ්ඩලය
# 2012



එම්.එම්.සී. පර්ඩිනැන්ඩෝ මහතා
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්



ජේ. ඩී. බණ්ඩාරනායක මහතා
සාමාජික



ඒශන ද සිල්වා මහතා
සාමාජික



සංජීව වික්‍රමනායක මහතා
සාමාජික



අනුර ජයසිංහ මහතා
සාමාජික

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

| | |
|---|---|
| **එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩෝ මහතා** | සභාපති/අධ්‍යක්ෂ ජනරාල් |
| **ආචාර්ය අයි.එන්. සමරප්පුලි මහතා** | විධායක අධ්‍යක්ෂ (පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන) |
| **ශිවාන් ඩී. ද සිල්වා මහතා** | විධායක අධ්‍යක්ෂ (යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපන අංශය) |
| **ඩී.පී. ආරියසිංහ මහතා** | විධායක අධ්‍යක්ෂ (සංචාරක කර්මාන්ත, තොරතුරු තාක්ෂණ / දැනුමැති සේවා හා කෘෂිකාර්මික අංශය) |
| **එස්.බී.එෆ්. ද සිල්වා මහතා** | විධායක අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| **ඩබ්.ඒ.එච්.ආර්. ප්‍රනාන්දු මහතා** | විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැතීන් හා විශේෂ ව්‍යාපෘති) |
| **පී.කේ. වල්ගම මිය** | විධායක අධ්‍යක්ෂ (නීති) |
| **පී.ජේ. පනාපිටිය මහතා** | විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැතීන් හා විශේෂ ව්‍යාපෘති) |
| **යූ. සිරිගම්පොල මහතා** | විධායක අධ්‍යක්ෂ (කටුනායක අපනයන සැකසුම් කලාපය) |
| **වයි.ජී. රාජපක්ෂ මිය** | විධායක අධ්‍යක්ෂ (ඇඟලුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |
| **ටී.ඒ.ජේ. එදිරිසිංහ මහතා** | විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂවරු

| | |
|---|---|
| **කේ.පී.වී.ඩී. ප්‍රනාන්දු මහතා** | අධ්‍යක්ෂ (මහා පරිමාණ ව්‍යාපෘති) |
| **ඩී.එස්. සමරසිංහ මහතා** | අධ්‍යක්ෂ (මාධ්‍ය) |
| **එන්. වීරසේකර මිය** | අධ්‍යක්ෂ (ආයෝජන සේවා) |
| **සී.පී. මලල්ගොඩ මිය** | අධ්‍යක්ෂ (පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන) |
| **එච්.එම්. ජයසුන්දර මහතා** | අධ්‍යක්ෂ (මධ්‍යම ප්‍රාදේශීය කාර්යාලය) |
| **යූ.ජේ. වීරසිංහ මහතා** | අධ්‍යක්ෂ (වයඹ ප්‍රාදේශීය කාර්යාලය) |
| **එම්.ඒ.එස්. පෙරේරා මිය** | අධ්‍යක්ෂ (පරිසර) |
| **එම්.කේ. ගරුසිංහ මහතා** | අධ්‍යක්ෂ (නව කලාප) |
| **ආර්.එම්. වීරකෝන් මිය** | අධ්‍යක්ෂ (ලේකම් කාර්යාලය) |
| **එන්. ද සිල්වා මෙනවිය** | අධ්‍යක්ෂ (යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපන අංශය) |
| **ජේ.පී.සී. ජයලත් මහතා** | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) |
| **එස්.පී.ද එස්. මුතුකුමාරණ මෙනවිය** | අධ්‍යක්ෂ (මූල්‍ය) |
| **ඒ.කේ. ජයසිංහ මහතා** | අධ්‍යක්ෂ (සීතාවක අපනයන සැකසුම් කලාපය) |
| **එම්.එස්.පී. සමරකෝන් මිය** | අධ්‍යක්ෂ (නීති - රාජ්‍ය හා පුද්ගලික සහයෝගිතා ඒකකය) |
| **ඩබ්.ඒ.එෆ්. ජයසිරි මහතා** | අධ්‍යක්ෂ (කාර්මික සබඳතා) |
| **එම්.කේ.ඩී. ලෝරන්ස් මහතා** | අධ්‍යක්ෂ (බියගම අපනයන සැකසුම් කලාපය) |
| **බ්‍රිගේඩියර් ඩී.ඒ. අමුණුගම මහතා** | අධ්‍යක්ෂ (ආරක්ෂක) |
| **ඒ.කේ.ඒ. මහින්ද මහතා** | අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| **ජේ. ගුණසේකර මහතා** | අධ්‍යක්ෂ (කොග්ගල අපනයන සැකසුම් කලාපය) |
| **ඒ.ආර්. කරුණාරත්න මහතා** | අධ්‍යක්ෂ (මානව සම්පත්) |
| **ආර්.එම්.යූ. සෙනරත් මහතා** | අධ්‍යක්ෂ (තාක්ෂණික පරිපාලනය) |
| **එම්. රාමනායක මහතා** | අධ්‍යක්ෂ (ආයෝජන සේවා කලාප) |
| **එන්.එන්. කුමාරතුංග මහතා** | අධ්‍යක්ෂ (ඇඟළුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |
| **ඩබ්.යූ.කේ.එම්.ඒ. විජයකුලතිලක මහතා** | අධ්‍යක්ෂ (ඇඟළුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |

# සමාලෝචනය

## ප්‍රධාන සිදුවීම් හා සුවිශේෂී අවස්ථා

- ඉතිහාසයේ ඉහළම විදේශ සෘජු ආයෝජන මට්ටම වාර්තා කරමින් ඇමරිකානු ඩොලර් බිලියන 1.34 ක ආයෝජන ප්‍රමාණයක් ලබාගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත්විය.

- මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2012 වසරේදී පැවැත්වූ ජාතික හරිත සම්මාන උළෙලේදී රාජ්‍ය ආයතන අංශයේ ලෝකඩ සම්මානය (තෙවන ස්ථානය) දිනාගැනීමට බියගම අපනයන සැකසුම් කලාපය සමත්විය.

- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC ආයතනය) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රථම නැනෝ තාක්ෂණ උද්‍යානය සඳහා පදනම සකස් කරනු ලැබී ය. දේශීය මෙන්ම ගෝලීය සමාගම් සමඟද එක්ව සාමූහික නවෝත්පාදන ක්‍රියාවලියක් තුළින් නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා සෑම ව්‍යාපාරයකටම අවස්ථාව සැලසීමට මෙම නැනෝ තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය මගින් කටයුතු සලසා ඇත.

- කර්මාන්ත ශාලා ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් සංවර්ධනය කරන ලද බිම් කැබලි පිළිබඳව ආයෝජකයින්ගේ වැඩිවන ඉල්ලුම සපුරාලීමේ අරමුණින් සාම්පූර්, මිරිජ්ජවිල, සූරියවැව හා මුලතිව් යන ප්‍රදේශවල නව ආයෝජන කලාප ස්ථාපනය කිරීමේ මූලික කටයුතු ආයෝජන මණ්ඩලය මගින් සිදු කරනු ලැබී ය.

- මිශ්‍ර සංවර්ධනය, සුඛෝපභෝගි මහල් නිවාස සංකීර්ණ, සාප්පු හා කාර්යාල සංකීර්ණ මෙන් ම, බහු ආංශික හෝටල් සංකීර්ණ , අන්තර්ජාතික විශ්ව විද්‍යාල මගින් මෙහෙයවනු ලබන අධ්‍යාපනික හා පුහුණු ආයතන මෙන්ම පර්යේෂණ සංවිධානද, බැර කාර්මික කලාපවල මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහාද, ඇමරිකානු ඩොලර් මිලියන 4850ක මුළු ආයෝජනයක් සහිතව 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ව්‍යාපෘති 05ක් සඳහා වූ ගිවිසුම්වලට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අත්සන් තබනු ලැබී ය.

- රු. බිලියන 2.09ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් විදුලි සංදේශන විකාශන පහසුකම් පාරිභෝගිකයින්ට ලබාදීම පිණිස චන්ද්‍රිකා පද්ධතියක් සැලසුම් කිරීම හා මෙහෙයවීම සඳහා වූ පළමුවන ව්‍යාපෘතියට ශ්‍රී ලංකා ආයෝජනය මණ්ඩලය විසින් අත්සන් තබනු ලැබී ය.

# ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය

### ආයෝජන පිළිබඳව ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂා

### සුවිශේෂී අවස්ථා

මුල් විදේශ සෘජු ආයෝජන වාර්තා බිඳ හෙළමින් ඇමෙරිකානු ඩොලර් බිලියන එකකට වඩා වැඩි විදේශ සෘජු ආයෝජන ඉපයීම් සීමාවට ළඟාවීමට 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට හැකිවිය.

- ඇමෙරිකානු ඩොලර් මිලියන 1338ක් වන මෙතෙක් වාර්තා වූ ඉහළම ආයෝජන ප්‍රමාණය ලබා ගැනීමට හැකි විය.
- දිවයිනේ සාමාන්‍ය භූ දර්ශනයද වෙනස් කරමින් යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉතා ඉහළ ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය.
- දේශීය ආයෝජන ප්‍රවාහය ඇ.ඩො. මිලියන 608ක් දක්වා වැඩිවිය (විදේශ සෘජු ආයෝජන වලින් 45%ක් පමණ).

### විදේශ සෘජු ආයෝජන (FDI)

විදේශ ආයෝජන හා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය අතර ඉතා ප්‍රබල සම්බන්ධතාවක් පවතී. යම් රටකට ආර්ථික සංවර්ධනයේ ඉලක්කගත අනුපාතික අත්පත් කර ගැනීම සඳහා විදේශ සෘජු ආයෝජන විශාල වශයෙන් එම රට තුළට ගලා ඒම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාධනීය ප්‍රයත්න වලින් අනතුරුව 2011 වසරේ දී වාර්තා වූ ඇමෙරිකන් ඩොලර් මිලියන 1,066 ප්‍රමාණය හා සැසඳීමේදී එයට වඩා 26% ක වැඩිවීමක් වන ඇමරිකන් ඩොලර් මිලියන 1,338 ක වාර්තාගත විදේශීය සෘජු ආයෝජන (FDI) ප්‍රවාහයක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකිවිය. පසුගිය වසරේ දී ක්‍රියාත්මක වූ ශක්තිමත් ආයෝජන කාර්යසාධනයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙතෙක් ලබාගැනීමට හැකි වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය 2012 වසරේ දී ආකර්ෂණය කර ගැනීමට මෙරට සමත් විය.

### සමාලෝචිත වර්ෂය පිළිබඳ කෙටි සටහනක්

අවිනිශ්චිත ගෝලීය ආර්ථික තත්ත්ව යටතේ වුවද, වෙනත් කිසිදු වසරකට වඩා වැඩි විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වන ඇ.ඩො.මිලියන 1,338ක් ආකර්ෂණය කර ගැනීමට 2012 වසරේදී ශ්‍රී ලංකාව සමත් විය. නිෂ්පාදන, සේවා/යටිතල පහසුකම් හා කෘෂිකාර්මික අංශ සඳහා අනුමත කරනු ලැබූ ආයෝජනවලින් මෙය සමන්විත වේ. ඇ.ඩො.මිලියන 308ක් වූ නිෂ්පාදන අංශය, ඇ.ඩො.මිලියන 427ක් වූ සේවා අංශය, ඇ.ඩො..මිලියන 596ක් වූ යටිතල පහසුකම් අංශය හා ඇ.ඩො.මිලියන 7ක් වූ කෘෂිකාර්මික අංශයේ සමස්ත දායකත්වය මගින් 2012 වසරේ දී ලබාගත් මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වන ඇ.ඩො.මිලියන 1,338 සමන්විත වේ.

යම් රටක ආයෝජකයන් සමෘද්ධිමත් කිරීම සඳහා එම රටට ඇති හැකියාව පිළිබඳව දේශීය ව්‍යාපාර ප්‍රජාව තබා ඇති විශ්වාසයේ ස්ථිරසාර සලකුණක් වශයෙන් දේශීය ආයෝජන රට තුළට ගලා ඒම 2011 වසරට සාපේක්ෂව 42%ක වැඩිවීමක් ලෙස 2012 වසරේදී සටහන් කිරීමට ලැබීම ඉමහත් ප්‍රීතියකි. මහින්ද චින්තන ඉදිරි දැක්මේ දක්වා ඇති පරිදි දේශීය ආයෝජන සක්‍රීය ලෙස ප්‍රවර්ධනය කිරීමේ රජයේ අඛණ්ඩ ප්‍රයත්නයටද මෙය අනුගත වේ.

ආර්ථික වටිනාකම් දාමය මගින් දැනට පවත්නා කර්මාන්තවල පරතර පියවීම තුළින් පරිසර හිතකාමී ව්‍යාපාරික වාතාවරණයක් ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් ලෙස ස්ථාපනය කිරීමේ ප්‍රයත්නයද ඇතුළත්ව ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ රජයේ ක්‍රමෝපායික වැඩපිළිවෙළ මගින් මෙම විශිෂ්ට ජයග්‍රහණය ලබාගැනීමට හැකි විය.

නිෂ්පාදන හා සේවා පිළිබද ගෝලීය හා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස මේ වන විට ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් ලබා ඇති අතර ආයෝජන අවස්ථා වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම මගින් දැනුම තීව්‍ර හා නවෝත්පාදන පදනම් කර ගත් ඉහළ මට්ටමේ අගය එකතු කළ කර්මාන්ත වෙත රට විස්ථාපනය කිරීමේ කාර්ය භාරය වේගවත් කළ හැකිවනු ඇත .

## නිෂ්පාදන අංශයෙහි ආයෝජනය කිරීම

ගෝලීය විදේශ ඍජු ආයෝජන ගලා ඒම අඩුවීම හෝ විදේශ ආයෝජන එක තැන රැඳී තිබීම මෙන්ම තරගකාරිත්වය වැඩි වෙමින් පවතින ගෝලීය පරිසරය හේතුවෙන්ද 2012 වසරේදී අභියෝග රැසකට මුහුණපෑමට ශ්‍රී ලංකාවට සිදුවිය. එම අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයේ වුවද නිෂ්පාදන අංශය සඳහා සැලකිය යුතු මට්ටමින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය.

2011 වසරේ දී ව්‍යාපෘති 77ක් සඳහා වූ රුපියල් මිලියන 89,667ක ආයෝජන ප්‍රමාණය හා සැසඳීමේදී රුපියල් මිලියන 95,882ක ආයෝජන ඇතුළත් නිෂ්පාදන ව්‍යාපෘති 100ක් 2012 වසරේදී අනුමත විය. නිෂ්පාදන අංශයට 2012 වසරේ දී ලැබුණු මුළු විදේශ ඍජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 308ක් විය (මුළු විදේශ ඍජු ආයෝජන වලින් 23%ක්) .

මෙරටේ නිෂ්පාදන අංශය පරිවර්තිත අවධියක් හා ප්‍රති ව්‍යුහගත කිරීමේ අවධියක් පසු කරමින් සිටියි. අගය අඩුවෙන් එකතු කළ ක්‍රියාකාරකම්වල ආර්ථික වැදගත්කම අඩුවෙමින් පවතින අතර කර්මාන්තවල ආයෝජකයෝ අගය අඩුවෙන් එකතු කළ අංශවල ආයෝජනය කිරීම අඩු කිරීමටද, වර්ධනය සඳහා නව්‍ය අවස්ථා සලසා දෙන ඉහළ අගයක් එකතු කළ ක්‍රියාකාරකම්වල පුළුල් ලෙස ආයෝජනය කිරීමටද අපේක්ෂා කරති. මෙම නව ව්‍යාපාරික ක්‍රමෝපාය ඇති කිරීම මගින් ඉහළ නිපුණතා සහිත රැකියා නියුක්තිය සඳහා වෙළෙඳපොළක් උත්පාදනය වන අතර ඉහළ ආදායම් ලැබෙන ආර්ථිකයන් සංවර්ධනය කිරීමටද එමගින් අවස්ථාව සැලසේ.

විශේෂයෙන්ම පෙරටු පිරිවැය අඩුකිරීමේ අරමුණින් අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ආයෝජකයන් වෙත පහසුකම් සැලසීම සඳහා විවිධ පියවර ගැනීම හා විවිධ කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් රජය අඛණ්ඩ ව කටයුතු කරයි.

පවත්නා කාර්මික උද්‍යානවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ දී මෙන්ම සූරියවැව ව්‍යාපෘතිය ඇතුළු නව කලාප සංවර්ධනය කිරීමේදී හා වැඩිදියුණු කිරීමේදී රජයට සහාය ලබාදීමේ අරමුණින් ව්‍යාපෘති කළමනාකරණය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඉහළ අනුපාතයකින් පවත්වා ගැනීමට මෙමගින් දායකත්වය ලැබී තිබේ.

## සේවා /යටිතල පහසුකම් අංශයේ ආයෝජනය කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඇති කිරීම සඳහා සහය වීමේ අරමුණින් සේවා /යටිතල පහසුකම් අංශය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ රජයේ ප්‍රයත්නය 2012 වසරේදී අතිශයින්ම සාර්ථක වූ අතර මෙම දශකය තුළ එම අංශයෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය තවදුරටත් පුළුල් කිරීමටද අපේක්ෂා කෙරේ. 2012 වර්ෂයේ දී රුපියල් මිලියන 591,156 ක් වූ අනුමත (පුළුල් කිරීම් ද ඇතුළත් ව ව්‍යාපෘති 125ක් මගින්) ආයෝජන ප්‍රමාණයක් තුළින් මෙම සේවා /යටිතල පහසුකම් අංශය ආර්ථිකයට එහි දායකත්වය ලබා දෙනු ලැබී ය. 2012 වසරේ දී සේවා/යටිතල පහසුකම් අංශයට ලැබුණු මුළු විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 1,023ක් විය (මුළු විදේශ ඍජු ආයෝජන වලින් 76.5%ක් ).

හෝටල් හා සංචාරක කර්මාන්ත ව්‍යාපෘති, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, සහාය සේවා, ප්‍රවාහනය, බලශක්ති, විදුලි සංදේශ, සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනික සේවා ඇතුළු පුළුල් පරාසයක විහිදෙන සේවාවලින් මෙම අංශය සමන්විත වේ.

රජයේ ආධාරක ප්‍රතිපත්ති පිළිබඳව ලැබෙන ධනාත්මක ප්‍රතිචාර සේවා/යටිතල පහසුකම් අංශයෙහි සිදු කරන ආයෝජන ප්‍රමාණය ඉහළ යාම මගින් පිළිබිඹු කෙරෙන අතර මෙම අංශයේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් ඒ සඳහා පහසුකම් සැලසීම පිළිබඳවද එමගින් පිළිබිඹු කෙරේ.

## කෘෂිකර්ම අංශයෙහි ආයෝජනය කිරීම

2012 වර්ෂයේ දී, ව්‍යාපෘති 07ක් සඳහා රුපියල් මිලියන 9,369ක් වටිනා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට කෘෂිකර්ම අංශය සමත් විය. කෘෂිකර්ම අංශය සඳහා ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 7ක් විය (මුළු විදේශීය සෘජු ආයෝජන වලින් 0.5%ක්).

2012 වසරේ දී කෘෂිකර්ම අංශය සඳහා ආකර්ෂණය වූ රුපියල් මිලියන 9,369න්, 87%ක් (රුපියල් මිලියන 8,137ක්) විදේශ ප්‍රභව වලින් ලැබී තිබේ. මුළු ආයෝජනය රුපියල් මිලියන 8,712 ක් වූ ධීවර කර්මාන්තය හා කිරි නිෂ්පාදන උප අංශ හා සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති දෙකක් කෘෂිකර්ම අංශයට ලැබී තිබිණි. කෘෂිකර්ම අංශය සඳහා ලැබුණු මුළු ආයෝජනවලින් 93%ක් මෙම ව්‍යාපෘති සඳහා ආයෝජනය කර තිබුණි.

ගෝලීය හා කලාපීය සාර්ව ආර්ථික හා සමාජයීය සංවර්ධනය පිළිබඳව සලකා බලමින්, ආර්ථිකය තුළ පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා පරිසර හිතකාමී ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමට රජය අදහස් කර තිබේ. ආයෝජකයින් බවට පත්විය හැකි තනි පුද්ගලයන්ට අවශ්‍ය වන මානව ප්‍රාේග්ධනය සැපයීම තුළින් මෙන්ම ආර්ථික වටිනාකම් දාමයේ පරතර පියවීම සඳහා සුවිශේෂී විදේශ වෙළෙඳපොළ සඳහා නිෂ්පාදන සැකසීම, තාක්ෂණික ක්‍රම හා සේවා සැපයීම ඉලක්ක කරමින් තරගකාරිත්වයේ නව ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත ලබාගත හැකි ආකාර පිළිබඳ සොයා බැලීම තුළින් අතිශය වැදගත් කාර්ය භාරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉටු වේ.

## ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීම

### "Doing Business" (ව්‍යාපාරවල නිරතවීම) ශ්‍රේණිගත කිරීම් - 2012

අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව (IFC) සමඟ සහයෝගීතාවෙන් ලෝක බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ලෝක "Doing Business" (ව්‍යාපාරවල නිරතවීම) ශ්‍රේණිගත කිරීම්වල දී, 2011 වසරේ දී ලබාගත් 102 වන ස්ථානයෙන් ඉදිරියට පැමිණ, 2012 වසරේ දී රටවල් 183ක් අතරින් 89 වන ස්ථානයට ළඟා වීමට ශ්‍රී ලංකාව සමත් විය. ව්‍යාපාරික ශ්‍රේණිගත කිරීමේදී ඉහළ තත්ත්වයකට පැමිණීමට හැකි වූ ප්‍රධාන හේතු වූයේ ආයෝජකයන්ගේ ආරක්ෂනය ශක්තිමත් කිරීම හා ව්‍යාපාර මත පනවනු ලැබූ බදු අඩුකිරීමය.

2012 වසරේදී, ව්‍යාපාර පිරිවැටුම් බද්ද හා සමාජ ආරක්ෂණ දායක මුදල් අහෝසි කිරීම මගින් සහ සංස්ථා ආදායම් බද්ද , එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බදු අනුපාත අඩුකිරීම මගින් ව්‍යාපාර සඳහා ගෙවිය යුතු බදු පිරිවැය අඩු කිරීමට ශ්‍රී ලංකාව පියවර ගනු ලැබී ය.

### ලෝක බැංකු සැපයුම් කාර්යසාධන දර්ශකය

සැපයුම් අංශයේ අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම්වල 137 වන ස්ථානයේ සිට 2012 ලෝක බැංකු සැපයුම් කාර්යසාධන දර්ශකයේ 81 වන ස්ථානයට ළඟා වීමට ශ්‍රී ලංකාව සමත් විය.

රේගු, යටිතල පහසුකම්, අන්තර්ජාතික නැව් බඩු තොග, සැපයුම් සේවාවල ගුණාත්මකභාවය හා නිපුණත්වය, ගති නිරීක්ෂීම, අනුරේඛන පිටපත් කිරීම හා කාලෝචිත බව ආදී ක්ෂේත්‍ර වල ශ්‍රී ලංකාව මගින් සිදුකර ඇති වැඩිදියුණු කිරීම් හේතුවෙන් මෙම දර්ශකයේ පෙරට යෑමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ.

### සංචාරක කර්මාන්තය


ලෝක ප්‍රසිද්ධ එක්සත් රාජධානියේ "කොන්ඩෙ නාස්ට් ට්‍රැවලර්" සඟරාව මගින් 2012 වසරේදී සංචාරය කිරීම සඳහා වඩාත් සුදුසු, වඩාත් උණුසුම් නව නිවාඩු ගමනාන්ත අතර තුන්වන ස්ථානය" ලෙස ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කර තිබේ. රටෙහි ජාතික උරුම සහ ජීවා පිහිටි ස්ථාන, වන ජීවීන්, සශ්‍රීක භූ දර්ශන, නොකිලිටි වෙරළ ආදිය වර්ණනා කරමින් "නැෂනල් ජියෝග්‍රැෆික් ට්‍රැවලර්" සඟරාව 2012 වසරේ ලෝක සංචාරකයන් සඳහා සුදුසු ගමනාන්ත අතරින් වඩාත් සුදුසුම ගමනාන්ත 06 අතරට ශ්‍රී ලංකාව ද ඇතුළත් කර තිබේ.

# ලෝක ආයෝජන ස්වරූපය- 2011

### විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම හා බැහැරට ගලා යෑම

2011 වසරේ දී ලෝක ආර්ථිකයේ ඇති වුණු විවිධ කැළඹීම් මධ්‍යයේ වුවද, ගෝලීය විදේශ සෘජු ආයෝජන ගලා ඒම (FDI) ඇමෙරිකන් ඩොලර් බිලියන 1,524 ක් ලෙස වාර්තා වූ අතර එය 2010 වසරට සාපේක්ෂව 16% ක වැඩි වීමකි. එය ආර්ථික අර්බුදයට පෙර සාමාන්‍ය විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහය වූ ඇමෙරිකානු ඩොලර් බිලියන 1472 ද ඉක්මවා යමින් 4% ක වැඩි වීමක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, 2007 වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 1971ක් ලෙස උච්චතම මට්ටමේ පැවති ගෝලීය විදේශිය සෘජු ආයෝජන ගලා ඒමට වඩා අඩු මට්ටමක, එනම් 23% ක වැනි ප්‍රතිශතයක තවදුරටත් පවතී.

2011 වසරේ විදේශ සෘජු ආයෝජන ගැලීම 2010 වසරට සාපේක්ෂව 16% කින් වැඩි වූ අතර අර්බුදයට පෙර සාමාන්‍යයට වඩා 4%කින් ආන්තික ලෙස වැඩි වූ අතර 2007 ඉහළම අගයට වඩා 23%ක් අඩුවෙන් පැවතුණි.




(මූලාශ්‍රය: උන්ක්ටාඞ්, ලෝක ආයෝජන වාර්තාව, 2012)

### විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම

සංවර්ධනය වෙමින් පවතින ආර්ථික හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන ගැලීම් 12%කින් වැඩි වූ අතර සංවර්ධිත ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන ගැලීම් 21%කින් වැඩි විය.

- ❖ ගෝලීය වශයෙන් විදේශ සෘජු ආයෝජන වැඩි වීමට හේතු විවිධ වුවද, සංවර්ධිත ආර්ථික, සංවර්ධනය වෙමින් පවතින ආර්ථික හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථික[1] යන ප්‍රධාන ආර්ථික කණ්ඩායම් ආවරණය කරමින් විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම 2011 වසරේදී ඉහළ වර්ධනයක් සහිතව පුළුල් ලෙස ව්‍යාප්ත විය .


- ❖ කාර්මික සංවර්ධනයේදී , ප්‍රධාන වශයෙන්ම කලින් වැඩි දියුණු නොකළ ප්‍රදේශ සම්බන්ධ ව්‍යාපෘති අඛණ්ඩව වැඩිවීම තුළින්, සංවර්ධනය වෙමින් පවතින හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම ඇමෙරිකානු ඩොලර් බිලියන 777 ක වාර්තාගත මට්ටමකට ළඟාවෙමින් 12% ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. 2011 වසරේදී, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම ඇමෙරිකානු ඩොලර් බිලියන 617 සිට 684 දක්වාද, පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම ඇමෙරිකානු ඩොලර් බිලියන 74 සිට 92 දක්වාද වැඩි විය.

- ❖ 21% ක තරම් ඉහළ මට්ටමින් විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම පිළිබඳව සංවර්ධිත ආර්ථිකවලින්ද වාර්තා විය. එම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූයේ විදේශ ට්‍රාන්ස් නැෂනල් සමාගම් මගින් දේශ සීමාන්තර සම්බන්ධ වීම් හා අත්පත් කර ගැනීමය.

1. ගිණිකොණදිග යුරෝපය සහ පොදු රාජ්‍යමණ්ඩලීය ස්වාධීන ජනපද (CIS) සහිත රටවල්

❖ 2010 වසරේදී ඇ.ඩො.බිලියන 619 ක් වූ විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම හා සැසඳීමේදී ඇ.ඩො. බිලියන 748 ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට සංවර්ධිත ආර්ථික සමත් විය.


කලාපීය වශයෙන් වි.සෘ.ආ.ගලා ඒම (2006-2011) ඇ. ඩො. බිලියනවලින්




2011 වසරේ ලෝක විදේශ සෘජු ආයෝජනවලින් අඩකටත් වඩා එනම් ඇමෙරිකානු ඩොලර් බිලියන 776ක් ආකර්ෂණය කර ගැනීමට සංවර්ධනය වෙමින් පවතින ආර්ථික හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථික එක්ව සමත් විය.

(මූලාශ්‍රය උන්ක්ටාඩ් 2012 ලෝක ආයෝජන වාර්තාව- 2012)

❖ 2010 වසරේදී, ඉතිහාසයේ ප්‍රථම වරට ගෝලීය විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම්වලින් 50% ක ප්‍රමාණය ඉක්මවීමට සංවර්ධනය වෙමින් පවතින ආර්ථික හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සමත් වූ අතර 2011 වසරේදීද එම ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගැනීමට එම රටවල්වලට හැකි විය.




සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල මුළු විදේශ සෘජු ආයෝජන වලින් 65% ආකර්ෂණය කර ගැනීමට ආසියාව හා ඕෂේනියාව සමත් විය.

මූලාශ්‍රය - උන්ක්ටාඩ්, 2012 ලෝක ආයෝජන වාර්තාවේ 1.1 ඇමුණුම් වගුව මත පදනම් වන අතර සහ විදේශ සෘජු ආයෝජන/TNC දත්ත පදනම (www.unctad.org/fdistatistics)

(අ) 2011 වසරේ විදේශ සෘජු ආයෝජන රට තුළට ගැලීම්වල විශාලත්වය මත පදනම් වෙමින් ශ්‍රේණිගත කර ඇත.
සටහන: 2011 වසරේදී 8 වන මට්ටමට ළඟා වූ බ්‍රිතාන්‍ය වර්ජියානු දූපත් ලැයිස්තුවෙන් ඉවත් කර ඇත.

2010 වසරට සපේක්ෂව 15%ක වැඩිවීමක් වන ඇමෙරිකානු ඩොලර් බිලියන 227ක් ආකර්ෂණය කර ගැනීමට ඇමෙරිකා එක්සත් ජනපදය සමත් විය.

- ❖ විශාලතම විදේශ සෘජු ආයෝජන ලබන්නන් පිළිබඳ ගෝලීය ශ්‍රේණිගත කිරීම් මගින් ප්‍රමුඛතම සත්කාරක රටවල් 20 අතරින් 7 ක්ම සංවර්ධනය වෙමින් පවතින හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකයන්ට අයත් වීම මගින් එම කණ්ඩායම් වඩාත් ප්‍රියමනාප සත්කාරක රටවල් ලෙස ඉස්මතු වීම තහවුරු කෙරේ.

- ❖ විශාලතම විදේශීය සෘජු ආයෝජන ලබන්නා ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය එම ස්ථානයේම රැඳී සිටීමට සමත්ව සිටින අතර 2011 වසරේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 124 ක් ලබා ගනිමින් චීනය දෙවන විශාලතම විදේශීය සෘජු ආයෝජන ලබන්නා ලෙස තම ස්ථාවරය රැක ගැනීමට සමත් විය.

- ❖ කෙසේ වුව ද, සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික මගින් ලබාගන්නා මුළු විදේශීය සෘජු ආයෝජනයෙන් 62% ක් ආකර්ෂණය කර ගැනීමට සමත් වූ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකවල ඉතාම වැදගත් විදේශීය සෘජු ආයෝජන ලබන්නා වන්නේ ආසියානු කලාපයයි. ඇමෙරිකානු ඩොලර් බිලියන 424 ක් ආකර්ෂණය කර ගැනීමට ආසියාව හා ඕෂේනියා කලාප සමත්ව සිටියි.

- ❖ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික මගින් ලබාගත් මුළු විදේශීය සෘජු ආයෝජන අතරින් 32% ක් වන ඇමෙරිකානු ඩොලර් බිලියන 217ක ප්‍රමාණයක් ලතින් ඇමෙරිකානු හා කැරිබියන් කලාපය මගින් ලබාගෙන තිබේ.

- ❖ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකයන් මගින් ලබා ගන්නා ලද මුළු විදේශීය සෘජු ආයෝජන අතරින් 32% ක් හා ආසියානු කලාපයේ විදේශීය සෘජු ආයෝජන ගලා ඒම්වලින් 52% ක් වන ඇමෙරිකානු ඩොලර් බිලියන 219 ක විදේශීය සෘජු ආයෝජන ලබාගැනීම මගින් ආසියානු හා ඕෂේනියා කලාපයේ විදේශීය සෘජු ආයෝජන සඳහා ඉතාම වැදගත් උප කලාපය බවට පත්වීමට නැගෙනහිර ආසියාව සමත්ව සිටියි.

- ❖ 2010 වසර හා සැසඳීමේ දී 26%ක පමණ වර්ධනයක් සහිතව සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකවලට ගලා එන විදේශීය සෘජු ආයෝජනවලින් 17% ක් ආකර්ෂණය කර ගැනීමට සමත් වූ වඩාත් වැදගත් උප කලාපය වන්නේ ගිනිකොණදිග උප කලාපයයි.

- ❖ 2011 වසරේ දී "ASEAN" රටවලට විදේශීය සෘජු ආයෝජන ගලා ඒම්වලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 64ක් (2010 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 49 හා සැසඳීමේදී ) ප්‍රධාන වශයෙන් සිංගප්පූරුවට ලැබුණු අතර ඇමෙරිකානු ඩොලර් බිලියන 19 ක් (2010 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 14 හා සැසඳීමේදී) ඉන්දුනීසියාවටද, ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් (2010 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 9 හා සැසඳීමේ දී) මැලේසියාවට ද ලැබුණි.

- ❖ 2011 වසරේදී තායිලන්තය, වියට්නාමය හා පිලිපීනය යන රටවල්වල විදේශීය සෘජු ආයෝජන ගලා ඒම් අනුපිළිවෙළින් 2% , 7% හා 3% ක් ලෙස අඩු වී තිබුණි.

- ❖ 2010 වසරේ දී ලැබුණු ඇමෙරිකානු ඩොලර් බිලියන 32ක හා සැසඳීමේදී හා 2011 වසරේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 39ක් ලබාගනිමින් විදේශීය සෘජු ආයෝජන ගලා ඒම්වල 22%ක වැඩිවීමක් අත්පත් කර ගැනීමට දකුණු ආසියාව සමත් විය. එමගින් ආසියානු කලාපයේ විදේශ සෘජු ආයෝජන ගලා ඒම් 9% ක් ලෙස වාර්තා විය.

සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන ගැලීම් වලින් 3% පමණක් ආකර්ශණය කර ගැනීමට දකුණු ආසියාව සමත් විය.

- ❖ ඉන්දියාව (2010 වසරේ ඇමරිකානු ඩොලර් බිලියන 24 හා සැසඳීමේ දී) ඇමරිකානු ඩොලර් බිලියන 32ක් ද, ඉරානය (2010 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.6 හා සැසඳීමේදී) ඇමෙරිකානු ඩොලර් බිලියන 4.2ක් හා බංග්ලාදේශය (2010

වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 0.9 හා සැසඳීමේ දී) 1.13ක් ලෙස විදේශීය සෘජු ආයෝජන ගලා ඒම්වල කැපී පෙනෙන වර්ධනයක් ඇතිකර ගැනීමට සමත් විය.

❖ දකුණු ආසියානු විදේශ සෘජු ආයෝජන ගලා ඒම්වලින් අනුපිළිවෙළින් 11% හා 3%ක් ලබාගත් ඉරානය හා ආජන්ටිනාව යන රටවල්වලට වඩා ඉදිරියට යමින් දකුණු ආසියාවේ විදේශ සෘජු ආයෝජන ගලා ඒම්වලින් 81% ක් ආකර්ෂණය කර ගැනීමට ඉන්දියාව සමත් විය.

**විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම්**


❖ 2011 වසරේ දී ගෝලීය විදේශීය සෘජු ආයෝජන පිටතට ගලා යෑම් පෙර වර්ෂයට වඩා 17% ක වැඩිවීමක් වූ ඇමරිකානු ඩොලර් බිලියන 1,694 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, එය 2007 වසරේ වාර්තා වූ ඉහළම විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇමරිකානු ඩොලර් බිලියන 2,198ට වඩා අඩු 23% ප්‍රතිශතයේ තවදුරටත් රැඳී පවතී.

ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යැම් වලින් 73% ක් වන විශාලතම කොටස සංවර්ධිත ආර්ථිකයන්ට හිමිවේ.

❖ විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම්වල අක්‍රමවත් රටාවක් කලාප අතර පැවතුණි.


❖ 2011 වසරේදී ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම්වලින් 73% ක් වන ඇමෙරිකානු ඩොලර් බිලියන 1,237ක් සඳහා දායක වන්නේ සංවර්ධිත ආර්ථිකයන් සහිත රටවල් ය. 2010 වසරෙන් පසුව සංවර්ධිත ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් 25% කින් වර්ධනය විය.

කලාපීය මට්ටමින් විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් (2006-2011) ඇමෙරිකානු ඩොලර් බිලියන වලින්




(මූලාශ්‍රය - උන්ක්ටාඩ් 2012 ලෝක ආයෝජන වාර්තාව- 2012)

2010 වසරට සාපේක්ෂව , සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් 4% කින් පහතට වැටුනු අතර 2011 වසරේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 384 කට ළඟා වීමට එම රටවල් සමත් විය. පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් 19% ක වර්ධනයක් සහිතව ඇමෙරිකානු ඩොලර් බිලියන 73 කට ළඟා විය.




මූලාශ්‍රය - උන්ක්ටාඩ්, 2012 ලෝක ආයෝජන වාර්තාවේ 1.1 ඇමුණුම් වගුව මත පදනම් වන අතර සහ විදේශ සෘජු ආයෝජන/TNC දත්ත පදනම (www.unctad.org/fdistatistics)
(අ) 2011 වසරේ විදේශ සෘජු ආයෝජන රට තුළට ගැලීම්වල විශාලත්වය මත පදනම් වෙමින් ශ්‍රේණිගත කර ඇත.

සටහන:2011 වසරේදී 8 වන මට්ටමට ළගා වූ බ්‍රිතාන්‍ය වර්ජියානු දූපත් ලැයිස්තුවෙන් ඉවත් කර ඇත.

පිලිවෙලින් එක්සත් රාජධානිය සහ ජපානය සෘජු විදේශ ආයෝජන පිටතට ගලා යෑම 168% සහ 104% කින් ඉහල නංවා තිබේ.

❖ ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතම ආර්ථික 20 අතර ඇමෙරිකානු ඩොලර් බිලියන 397 ක සීමාවට ළඟා වෙමින් 1 වන ස්ථානයේ රැඳී සිටීමට ඇමරිකානු එක්සත් ජනපදය සමත්ව සිටින අතර ඇමෙරිකානු ඩොලර් බිලියන 124ක් සමඟ දෙවන ස්ථානයේ රැඳී සිටීමට ජපානය ද, ඇමෙරිකානු ඩොලර් බිලියන 107ක් සමඟ 3 වන ස්ථානයේ රැඳී සිටීමට එක්සත් රාජධානියද සමත් විය.

❖ 2010 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 40 හා සැසඳීමේ දී 2011 වසරේදී 168%ක වැඩිවීමක් වාර්තා කරමින් විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම්වල ඉහළම වර්ධනයක් වාර්තා කිරීමට එක්සත් රාජධානිය සමත් විය.

❖ 2010 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 56 හා සැසඳීමේ දී 104%ක වැඩිවීමක් වාර්තා කිරීමට ජපානයද සමත් වූ අතර පූර්ව වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 304 හා සැසඳීමේ දී 31%ක වර්ධනයක් අත් කර ගැනීමට ඇමෙරිකා එක්සත් ජනපදයද සමත් විය.

❖ 2010 වසරේ දී අනුපිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් බිලියන 95ක් හා ඇමෙරිකානු ඩොලර් බිලියන 69ක් ලෙස ඉතිහාසයේ ඉහළ ම විදේශීය සෘජු ආයෝජන පිටතට ගලා යාමක් ලබාගැනීමට හොංකොං (චීනය) හා චීනය සමත් විය. එහෙත් 2011 දී 14%ක් හා 6%ක් ලෙස විදේශීය සෘජු ආයෝජන අඩුවීමක් එම රටවලින් වාර්තා විය.

❖ පූර්ව වර්ෂයේ ඇමරිකානු ඩොලර් බිලියන 62 ක් වූ විදේශීය සෘජු ආයෝජන පිටතට ගලා යෑම් හා සැසඳීමේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 73ක් ලබා ගනිමින් 4%ක කොටසක් අත්පත් කර ගනිමින් 2011 වසරේ දී විදේශ සෘජු ආයෝජන සම්බන්ධයෙන් පිළිගැනීමට ලක් වූ සත්කාරක රටවල් ලෙස ඔවුන්ගේ තත්ත්වය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවලට හැකි විය.

❖ ඕස්ට්‍රේලියාව, ලක්සම්බර්ග්, අයර්ලන්තය හා ඉන්දියාව ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලින් පහතට දමමින් එක්සත් රාජධානිය, ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය හා නෝර්වේ යන රටවල් 2011 වර්ෂයේදී ප්‍රමුඛතම ආර්ථික 20 අතරට එක් විය.

# ආයෝජන කාර්යසාධනය

## සාපේක්ෂ වැදගත්කම අනුව ව්‍යාපාතිවල විස්තර

- **2012 වර්ෂයේ දී අනුමත කරන ලද ව්‍යාපාති හා අත්සන් තබනු ලැබූ ගිවිසුම්**

2012 වර්ෂයේ දී අනුමැතිය ලබාදුන් මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 232ක් වූ අතර, එය 2011 වර්ෂයට සාපේක්ෂව 45%ක වැඩිවීමකි. අනුමැතිය ලබාදුන් ව්‍යාපෘතිවල තක්සේරු කරන ලද මුළු ආයෝජන ප්‍රවාහය ඇමෙරිකානු ඩොලර් මිලියන 5,458 (රුපියල් මිලියන 696,406) ක් වූ අතර, එය පූර්ව වර්ෂය හා සැසඳීමේ දී 64%ක වැඩිවීමකි. 2012 වසර සඳහා අනුමත වූ ව්‍යාපෘතිවලින් උත්පාදනය වන බවට තක්සේරු කරන ලද රැකියා අවස්ථා සංඛ්‍යාව 55,120ක් වන අතර, එය පූර්ව වර්ෂය හා සැසඳීමේ දී 13%ක වැඩිවීමකි.

1 වන වගුව - 2012 වර්ෂයේ දී අනුමත වූ ව්‍යාපෘතිවල ආයෝජන හා සේවා නියුක්තියේ දායකත්වය - අංශවලට අනුව

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන සඳහා දායකත්වය % | සේවා නියුක්තිය සඳහා දායකත්වය % |
|---|---|---|---|
| **සේවා/යටිතල පහසුකම්** | **111** | **84%** | **53%** |
| සාප්පු හා කාර්යාල සංකීර්ණ | 16 | 25% | 8% |
| හෝටල්, අවන්හල් සේවා හා විනෝදාස්වාදය සපයන සංකීර්ණ | 28 | 18% | 14% |
| කාර්මික වතු සංවර්ධනය (බැර කර්මාන්ත කලාපය) | 1 | 13% | 9% |
| නිවාස හා දේපළ සංවර්ධන | 14 | 7% | 8% |
| වෙනත් | 52 | 21% | 13% |
| **නිෂ්පාදන** | **75** | **13%** | **32%** |
| **කෘෂිකර්මය** | 7 | 1% | 2% |
| **පවතින ව්‍යාපෘති පුළුල් කිරීම** | 39 | 2% | 13% |
| **මුළු ගණන** | **232** | **100%** | **100%** |

2012 වර්ෂයේ දී අනුමත වූ මුළු ආයෝජන අතරින් සේවා/යටිතල පහසුකම් අංශය එහි ඉහළ ම දායකත්වය 84% ක් ලෙස සලකුණු කළ අතර නිෂ්පාදන අංශය 13% ක් හා කෘෂිකර්ම අංශය 1%ක් ලෙස දායක වී ඇත. අනුමත කරන ලද මුළු ආයෝජන ප්‍රමාණයෙන් පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා ඉතිරි 2% දායක වී තිබේ. සාප්පු හා කාර්යාල සංකීර්ණ (25%) , හෝටල්, අවන්හල් සේවා හා විනෝදාස්වාදය සපයන සංකීර්ණ (18%), බැර කර්මාන්ත කලාපය (13%), නිවාස හා දේපළ සංවර්ධන (7%) ආදිය සේවා හා යටිතල පහසුකම් අංශයට ඇතුළත් වේ.

2012 වර්ෂයේදී අනුමත වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කරන ලද සේවා නියුක්තියෙන් 53% ක් සේවා/යටිතල පහසුකම් අංශයේ ද, 32% ක් නිෂ්පාදන අංශයේ ද, 2% ක් කෘෂිකර්ම අංශයේද උත්පාදනය කිරීමට අපේක්ෂිතය. අනුමත ව්‍යාපෘති මගින් ඇස්තමේන්තු කළ මුළු සේවා නියුක්තියෙන් 13% ක් පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම මගින් උත්පාදනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 වර්ෂයේදී , ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 163ක් වන අතර 2011 වසර හා සැසඳමේදී 9%ක වර්ධනයක් (රුපියල් අනුව) අත්පත් කර ගනිමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 3178ක් (රුපියල් මිලියන 405,493ක්) මෙම ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘති මගින් රැකියා අවස්ථා 38,000කට වඩා වැඩියෙන් උත්පාදනය කරනු ඇත.

### ❖ 2012 වර්ෂයේ දී ඉදිකිරීම්/ක්‍රියාත්මක කිරීම් ආරම්භ කළ ව්‍යාපෘති

2012 වර්ෂයේදී නව ව්‍යාපෘති 105ක් ද, පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම් 4ක් ද, ඒවායේ ක්‍රියාත්මක කිරීම්/ඉදිකිරීම්ද ආරම්භ කරනු ලැබීය. ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කරනු ලැබූ මුළු ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,065ක් (රුපියල් මිලියන 135,935ක්) වූ අතර, අපේක්ෂිත රැකියා උත්පාදනය 17,000කි.

2 වන වගුව:- 2012 වර්ෂයේ ඉදිකිරීම්/ ක්‍රියාත්මක කිරීම් ආරම්භ කරන ලද ප්‍රමුඛත්වය ලද ව්‍යාපෘති 10
(ඇස්තමේන්තු ගත ආයෝජන මත පදනම් ව)

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපාරික ක්‍රියාකාරකම | ඇස්තමේන්තු ගත ආයෝජන (රු. මි.) | ඇස්තමේන්තු ගත සේවා නියුක්ති සංඛ්‍යාව | පිහිටීම |
|---|---|---|---|---|
| ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (පුද්) සමාගම. | සුඛෝපභෝගී හෝටලය | 44,880 | 432 | කොළඹ |
| ෂැන්ග්‍රි-ලා ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්) සමාගම. | සුඛෝපභෝගී හෝටලය | 13,200 | 495 | හම්බන්තොට |
| මාස් පැබ්‍රික්ස්(පුද්) සමාගම . | පාවහන් | 10,519 | 1,419 | කෑගල්ල |
| හවුස් ඔෆ් පැශයින්ස් මෙගා මෝල් (පුද්) සමාගම . | අතිවිශාල සාප්පු සංකීර්ණය | 4,500 | 405 | කොළඹ |
| සොෆ්ට්ලොජික් සිටි හොටෙල්ස් (පුද්) සමාගම. | තරු පහේ හෝටලය | 3,754 | 269 | කොළඹ |
| වරුන් බෙවරේජර්ස් ලංකා (පුද්) සමාගම. | බීම වර්ග | 2,863 | 290 | |
| ඩබුර් ලංකා (පුද්) සමාගම. | බීම වර්ග | 2,783 | 122 | ගම්පහ |
| වසන් හෙල්ත්කෙයාර් ලංකා (පුද්) සමාගම. | අක්ෂි රෝහල | 2,775 | 700 | කොළඹ |
| සුප්‍රීම්සැට් (පුද්) සමාගම. | විදුලිසංදේශනය සැපයීමට චන්ද්‍රිකා පද්ධතිය | 2,090 | 68 | කොළඹ |
| මෙගා වෙන් බයෝඑනර්ජි (පුද්) සමාගම. | ඩෙන්ඩ්‍රෝ බලාගාරය | 1,713 | 74 | මොණරාගල |

### ❖ 2012 වර්ෂයේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති

2012 වර්ෂයේදී මුළු ව්‍යාපෘති 80 ක (නව ව්‍යාපෘති 77ක හා ව්‍යාපෘති පුළුල් කිරීම් 3ක) වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත මුළු ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 255ක් (රුපියල් මිලියන 32,563ක්) වූ අතර එමගින් 16,000 කට වඩා වැඩි රැකියා අවස්ථා උත්පාදනය කිරීමටද අපේක්ෂිත ය. 2012 වර්ෂයේ දී ,වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති 80න් ව්‍යාපෘති 41ක් නිෂ්පාදන අංශයට ද, ව්‍යාපෘති 37ක් සේවා අංශයට ද, ව්‍යාපෘති 02ක් කෘෂිකර්ම අංශයට ද අයත් විය. සේවා අංශයේ ව්‍යාපෘති 37ට හෝටල් ව්‍යාපෘති 14ක් හා විදුලි බල ව්‍යාපෘති 6 ක් ද ඇතුළත්ය.

### ❖ 2012 වර්ෂයේ ආකර්ෂණය කර ගත් විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය

විදේශ සෘජු ආයෝජනවලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 01කට වඩා රටට ලැබුණු දෙවන අනුක්‍රමික වසර වූයේ 2012 වසර ය. 2011 වර්ෂයේදී ලබාගත් විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,066 හා සැසඳීමේදී 26%ක වැඩිවීමක් වන මෙතෙක් වාර්තා වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,338ක ආයෝජන ප්‍රමාණයක් මෙම වසරේ දී වාර්තා විය.


2012 වර්ෂයේ මුළු විදේශ සෘජු ආයෝජනවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 308ක් (23%ක්) වන ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය නිෂ්පාදන අංශයට ලැබී තිබුණු අතර දුරකථන හා විදුලි සංදේශ අංශය සඳහා

ඇමෙරිකානු ඩොලර් මිලියන 242ක් (18%) ද , වරාය සංවර්ධනය සඳහා ඩොලර් මිලියන 202ක (15%ක) විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ද ලැබී තිබුණි.

තවද, 2012 වර්ෂයේදී ගුවන් ගමන් සේවා සඳහා ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 175ක් (13%ක්) වූ අතර, හෝටල් ව්‍යාපෘති සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 117ක් (9%ක්) ලැබී තිබුණි.


❖ **විදේශ සෘජු ආයෝජනවල ආංශික සංයුතිය -2012**

| අංශය | වි. සෘ.ආ. (ඇ ඩො.මි.වලින්) |
|---|---|
| නිෂ්පාදන | 308 |
| කෘෂිකාර්මික සේවා | 7 |
| දුරකථන හා විදුලි සංදේශ ජාලය | 242 |
| වරාය සංවර්ධන | 202 |
| ගුවන් ගමන් සේවා | 175 |
| හෝටල් හා අවන්හල් | 117 |
| ඉන්ධන, ගෑස් , පෙට්රෝලියම් හා වෙනත් | 66 |
| නිවාස හා දේපළ සංවර්ධනය හා සාප්පු සංකීර්ණ | 56 |
| බලශක්ති උත්පාදනය | 30 |
| තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාරික කාර්ය බාහිර ආයතනවලින් ඉටුකර ගැනීම | 26 |
| වෙනත් සේවා | 109 |
| මුළු ගණන | **1,338** |



❖ විදේශ සෘජු ආයෝජනවල ප්‍රධාන ප්‍රභව - 2012

| රට | වි.සෘ.ආ. (ඇ.ඩො.මි.වලින් ) |
|---|---|
| හොංකොං | 259 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 214 |
| චීනය | 185 |
| ඉන්දියාව | 160 |
| සිංගප්පූරුව | 88 |
| මුරුසිය | 66 |
| නෙදර්ලන්තය | 56 |
| මැලේසියාව | 47 |
| එක්සත් රාජධානිය | 38 |
| ලක්සම්බර්ග් | 37 |
| බ්‍රිතාන්‍ය වර්ජිනියානු දූපත් | 33 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 27 |
| ජපානය | 26 |
| කොරියන් ජනරජය | 18 |
| ඔස්ට්‍රේලියාව | 15 |
| ස්විට්සර්ලන්තය | 14 |
| කැනඩාව | 14 |
| වෙනත් රටවල් | 41 |
| මුළු ගණන | 1,338 |




2012 වසරේදී විදේශ සෘජු ආයෝජනවල විශාලතම ප්‍රභවය වූයේ ඇ.ඩො.මි. 259ක් ලැබූ හොංකොං රාජ්‍යයයි. එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඇ.ඩො.මි. 214 ක් ලබා ගනිමින් විදේශ සෘජු ආයෝජනවල දෙවන විශාලතම ප්‍රභවය බවට පත් විය. චීනය ඇ.ඩො.මි.185ක් ද, ඉන්දියාව ඇ.ඩො.මි.160 ක් ද, සිංගප්පූරුව ඇ.ඩො.මි 88ක් ද, මුරුසි දිවයින ඇ.ඩො.මි. 66ක් ද, නෙදර්ලන්තය ඇ.ඩො.මි. 56ක් ද, මැලේසියාව ඇ.ඩො.මි.47ක් ද, එක්සත් රාජධානිය ඇ.ඩො.මි. 38ක් ද , ලක්සම්බර්ග් ඇ.ඩො.මි. 37ක් ද, බ්‍රිතාන්‍ය වර්ජීනියානු දූපත් ඇ.ඩො.මි. 33ක් ද, ඇමෙරිකා එක්සත් ජනපදය ඇ.ඩො.මි. 27 ක් ද ලබාගැනීමට සමත් විය. 2012 වර්ෂයේ ලැබූ මුළු විදේශ සෘජු ආයෝජනවලින් 90%ක් ලබාගැනීමට මෙම රටවල් දොළහ සමත් විය.


### ❖ උපලබ්ධි වූ සමුච්චිත ආයෝජන

2012 වර්ෂය අවසානයේදී උපලබ්ධි වූ සමුච්චිත ආයෝජනය රුපියල් බිලියන 1,281ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 24%ක වැඩිවීමකි .උපලබ්ධි වූ ආයෝජනය වන රුපියල් බිලියන 1,281න් 65%ක් (රුපියල් බිලියන 828කින්) විදේශීය සංරචකය නිරූපණය කරන අතර, ඉතිරි 35% (රුපියල් බිලියන 435) දේශීය පුද්ගලික ආයෝජනය නිරූපණය කරයි.

උපලබ්ධි වූ සමුච්චිත ආයෝජනවලින් 73%ක් යටිතල පහසුකම් හා සේවා අංශය සඳහා වන අතර, ඉතිරි 27% ඇඟලුම් ක්ෂේත්‍රය ඇතුළත් වන නිෂ්පාදන අංශය සඳහා වේ.

### ❖ සේවා නියුක්තිය (සමුච්චිත)

2012 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතිවල මුළු සමුච්චිත සේවා නියුක්තිය 457,986ක් ලෙස වාර්තා විය. මෙය 2011 වර්ෂයේ අවසානය වන විට මුළු සමුච්චිත සේවා නියුක්තිය (උදාහරණයක් ලෙස 450,913 ) සමග සැසඳීමේදී 2%ක වැඩිවීමකි (සේවා නියුක්තිය 8,000 කින් පමණ වැඩිවීමකි ).




ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතිවල මුළු සමුච්චිත සේවා නියුක්තියෙන් **62%**ක් රෙදිපිළි හා ඇගළුම් අංශ වලින් වන අතර, **13%**ක් වෙනත් නිෂ්පාදන අංශ වලිනි.**8%**ක් ප්‍රාදේශීය වැඩසටහන් හා අපනයන සඳහා යොමු වූ අංශයෙනි. මුළු සමුච්චිත සේවා නියුක්තියෙන් **17%**ක් අනෙකුත් සියලු ම අංශ වලින්,එනම් (කෘෂිකර්මාන්තය,අධ්‍යාපනය, සංචාරක කර්මාන්තය, උපයෝගිතා, යටිතල පහසුකම් හා දැනුමැති සේවා වලින්)

# දෙපාර්තමේන්තුමය කාර්යසාධනය

## අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් සමායෝජනය කෙරේ.

අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම, රැස්වීම් වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර සංසරණය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අදාළ අංශ වෙත දැනුම් දීම පිළිබඳ කර්තව්‍ය ඉටුකිරීම ලේකම් කාර්යාලයට පැවරී තිබේ. 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් හා විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක්ද පවත්වා තිබේ. කළමනාකරණ හා ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට හා ආශ්‍රිත තොරතුරු රැස්කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධ ඉදිරි කටයුතු ඉටු කිරීම පිළිබඳ ව තහවුරු කිරීම සම්බන්ධයෙන් ද ලේකම් කාර්යාලය වගකීම උසුලයි. 2012 වර්ෂය තුළ දී කළමනාකරණ කමිටු රැස්වීම් 12ක් පවත්වා ඇත.

2012 වර්ෂයේ දී, ආයෝජකයන්ට ඔවුන්ගේ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමැතිය නොපමාව ලබාගැනීම සඳහා රජයේ සංවිධානවල නිලධාරීන්ගේ සමායෝජනය ඇති ව අවශ්‍ය සියලු කටයුතු එකම ස්ථානයකින් ඉටුකර ගැනීම සඳහා රැස්වීම් 6ක් අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබී ය. ඒ අනුව, 2012 වර්ෂයේදී අවශ්‍ය සියලු කටයුතු එකම ස්ථානයකින් ඉටුකර ගැනීමේ රැස්වීම් 6ක් පවත්වනු ලැබූ අතර, ගැටළු 39ක් පිළිබඳවද සාකච්ඡා කරනු ලැබී ය. එයින් ගැටළු 12ක් විසඳිය හැකි වූ අතර සමහර ගැටළු අළුත් ස්ථාන ලබාගැනීම හේතු කොට ගෙන හා ඇතැම් කටයුතු අවසන් කිරීම හේතු කොට ගෙන ඉවත් කරන ලදි. අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

සභාපතිවරයාට/අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය සහාය ලබාදෙමින් සංවිධානය තුළ , බාහිර නියෝජිතායතන හා පුද්ගලික අංශයේ සංවිධානවල ක්‍රියාකාරකම්වල විවිධ අංශ සමායෝජනය කිරීමද මෙම අංශය මගින් සිදු කරනු ලබන තවත් කාර්යයකි. වාර්ෂික වාර්තාව පළකිරීම සඳහා අදාළ වන පරිදි විවිධ අංශ වලින් තොරතුරු ඉල්ලා සිටීම හා ලැබෙන තොරතුරු විශ්ලේෂණය කිරීම පිළිබඳවද මෙම අංශය වගකිව යුතු ය.

අභ්‍යන්තර අංශ වලින් තොරතුරු සම්පාදනය කිරීම හා පාර්ලිමේන්තුවේ ප්‍රශ්නවලට, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා ප්‍රශ්නවලට හා බාහිර සංවිධාන වලින් ලැබෙන විවිධ විමසීම්වලට කාලීන ප්‍රතිචාර ඉදිරිපත් කිරීමද මෙම ලේකම් කාර්යාලයේ වගකීමකි. ලිපි හුවමාරු හා රැස්වීම් පිළිබඳව සමායෝජන කටයුතු සිදු කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය ඇති කිරීමේ සම්බන්ධිකරණ ස්ථානය ලෙසද අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය කටයුතු කරයි. කැබිනට් සංදේශ, ප්‍රතිපත්තිමය ලේඛන/වාර්තා කෙටුම්පත් කිරීමේ කටයුතුවල හා ව්‍යාපෘති හා සම්බන්ධ අවහිරතා ඉවත් කිරීමට ආයෝජකයන් හමුවීම ආදී කටයුතුවල ද මෙම අංශය නිරත වෙයි.

## 1 වන ආංශික කණ්ඩායම

(සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මය සහ තොරතුරු තාක්ෂණ/දැනුමැති සේවා)

1 වන ආංශික කණ්ඩායම සංචාරක ව්‍යාපාරය හා විනෝදාත්මක සේවා, කෘෂිකර්මය හා තොරතුරු තාක්ෂණ/ දැනුමැති සේවා යන ප්‍රධාන අංශ 3න් සමන්විත වේ.

(අ) විමසීම්/අයදුම් කිරීමේ අදියරේ සිට ව්‍යාපෘතියේ මුළු කාලසීමාව මුළුල්ලේම ආයෝජකයන්ට අවශ්‍ය සියලුම පහසුකම් සැපයීම ආංශික කණ්ඩායම් මගින් මඟ පෙන්වනු ලබන ආංශික කේන්ද්‍රයේ ප්‍රමුඛතම අරමුණයි.

(ආ) ආයෝජන ප්‍රමුඛතා හඳුනාගැනීමට හා ආයෝජන අවස්ථා ප්‍රතිගාමී ලෙස ප්‍රවර්ධනය කිරීමට අදාළ වන අංශයේ රේඛීය අමාත්‍යාංශය /අදාළ නියෝජිතායතන සමග මෙම කණ්ඩායම් කටයුතු කරනු ඇත. ආයෝජනය කිරීමට අපේක්ෂා කරන ආයෝජකයන් යම්කිසි අංශයක ආයෝජනය කිරීමට තීරණය කළ විට මෙම කණ්ඩායම් ඔවුන්ගේ අංශයේ සියලුම ආයෝජකයින් සඳහා සම්බන්ධතා කළමනාකරුවන් වශයෙන් ව්‍යාපෘති ඇගයීමේ සිට

ක්‍රියාත්මක කිරීම දක්වා ද පශ්චාත් ආයෝජන සම්බන්ධයෙන්ද කටයුතු කරති. ඔවුන්ට අදාළ වන අංශයේ පාර්ශ්වකරුවන් සමග ප්‍රබල සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ද අංශය පිළිබඳව පුළුල් දැනුමක් ලබාගැනීමටද එමගින් ඔවුන්ට හැකි වේ.

2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබුණු ව්‍යාපෘති අයදුම්පත්‍ර පිළිබඳ විස්තර

| විස්තරය | සංචාරක ව්‍යාපාරය | කෘෂිකර්මාන්තය | තොරතුරු තාක්ෂණ / දැනුමැති සේවා | මුළු ගණන |
|---|---|---|---|---|
| ලැබුණු නව අයදුම් පත්‍ර | 47 | 20 | 07 | 74 |
| පුළුල් කිරීම් සහිතව ලබාගත් ව්‍යාපෘති අනුමත කිරීම් | 28 | 13 | 07 | 48 |
| ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති | 15 | 9 | 07 | 31 |
| මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති | 14 | 3 | 01 | 18 |



සමුද්‍රා බීච් රිසෝට්ස් (පුද්) සමාගම, හිද්දරුව,කොස්ගොඩ.

ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කළ/සාකච්ඡා මට්ටමේ ඇති ප්‍රධාන ව්‍යාපෘති

### 1. අයි ටී සී ලිමිටඩ්

ඉන්දියාවේ අයි ටී සී ලිමිටඩ් ආයතනය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු, ඇමරිකානු ඩොලර් මිලියන 140 ක ආයෝජනයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති යෝජනාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාරදෙනු ලැබීය. මෙම ව්‍යාපෘතිය කොළඹ, ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානයට කලින් අයත්ව තිබූ ඉඩමේ කොටසක ස්ථාපනය කරනු ලැබේ. ඉහළ තත්ත්වයේ නවාතැන් පහසුකම් සහිත කාමර 300ක තරු පහේ හෝටලයක්, ඉතා සුපිරි මට්ටමේ සාප්පු සංකීර්ණයක් හා ව්‍යාපාරික ස්ථානවලින්ද මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. එමෙන්ම, මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කර තිබේ. මෙම ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාපිළිවෙළට අනුකූලව, 2013 ජනවාරි මාසයේදී පාර්ලිමේන්තුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගනු ලැබී ය. ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරන ලද සමාගම වන වෙල්කම් හොටෙල්ස් ලංකා පුද්ගලික සමාගම ගෘහ නිර්මාණාත්මක ඇඳීම් අවසන් කිරීමේ නියැළී සිටියි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2013 ජූනි මාසයේදී ආරම්භ කිරීමට නියමිතය.

2 . සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම

සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම විසින් (හයට් රිජන්සි හෝටලය නැවත ප්‍රකෘතිමත් කිරීමයි.) ඇමෙරිකානු ඩොලර් මිලියන 158 ක ආයෝජනයක් සහිතව කොළඹ 03හි ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇති බහු ආංශික හෝටල් සංකීර්ණයකි. අදාළ අමාත්‍යාංශ සමග පැවැත් වූ උපදේශනාත්මක සාකච්ඡාවලින් අනතුරුව මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගන්නා ලදී. කාමර 475ක් පමණ ,සේවා සඳහා යොදා ගත හැකි බද්ධ නිවාස 90 ක්, විවිධ අවන්හල්, ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස සඳහා සැකසූ ශාලා හා ස්පා පහසුකම්, ස්කයි ලොබිය, මංගල උත්සව හා රැස්වීම් ශාලා පහසුකම් ආදියෙන් සමන්විත වන සියලු නවීන පහසුකම් සහිත තට්ටු 30කින් සැදුම්ලත් සුඛෝපභෝගී නාගරික ව්‍යාපාරික හෝටලයක් කොළඹ, ගාලු පාරේ ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබේ. කොළඹ හයට් රීජන්සි යන වෙළෙඳ නාමය යටතේ "හයිට් හොටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස්" මගින් මෙම හෝටලය කළමනාකරණය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේ පවතින අතර, 2014 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සඳහා සූදානම් කෙරේ.

**1 වන ආංශික කණ්ඩායම් අයත් අංශවල විෂය පථය යටතට ගැනෙන ආයෝජන පිළිබඳව සොයා බැලීමට 2012 වසර තුළ පහත සඳහන් ප්‍රධාන සමාගම්/කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණියහ.**

**සංචාරක ව්‍යාපාර අංශය**

1. ඉන්දියාවේ ගමනාන්ත 80ක හෝටල් 100කට වඩා ඇති ඉන්දියාවේ දෙවන විශාලතම හෝටල් දාමය වන ඉන්දියාවේ අයි ටී සී ලිමිටඩ් ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ පැවති සාකච්ඡා වටයෙන් අනතුරුව තරු පහේ හෝටලය/මිශ්‍ර සංවර්ධනය සඳහා ඔවුන්ගේ පළමු ජාත්‍යන්තර ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීමට තීරණය කළහ. ඉන් අනතුරුව, 2012 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළහ.

2. බේරුවල ප්‍රදේශයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 83ක ආයෝජනයක් සහිතව මහා පරිමාණ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් LOLC ලෙෂර් ලිමිටඩ් මගින් ඉදිරිපත් කරනු ලැබීය. සේවා සැපයීම හා සම්බන්ධ බද්ධ නිවාස, තට්ටු නිවාස සංකීර්ණයක් හා සාප්පු/විනෝදාස්වාදය සඳහා වන සංකීර්ණයක්ද සමඟ කාමර 500 ක් සහිත අන්තර්ජාතික පිළිගැනීමක්ද සහිත වෙළෙඳ නාමයක් යෙදූ සම්පූර්ණයෙන් සමෝධානික තරු පහේ නිවාඩු නිකේතනයකින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. එම ව්‍යාපෘතිය වසර 3 1/2 කින් සම්පූර්ණ වීමට නියමිතය.

3. ඩුබායි හා එක්සත් අරාබි එමීර් රටවල්වල ක්‍රියාත්මක වන "එම්එස් ඇන්ඩ් එන් ලයිෆ්ස්ටයිල්ස්" මගින් තරු පහේ "වෙල්නස් රිසෝර්ට්" සැලසුම් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීය. මෙය ඇමරිකන් ඩොලර් මිලියන 31 ක් ආයෝජනය කරමින් "නිව් ලයිෆ් රිසෝර්ට්ස් එල්එල්සී" නමින් 100% ක් විදේශීය හිමිකම ඇතිව හම්බන්තොටදී ආරම්භ කිරීමට අපේක්ෂිතය. සුඛෝපභෝගී කාමර 45කින් මෙන්ම සියලුම නූතන පහසුකම් සහිත සංචාරක නිවාස 10කින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.

4. හම්බන්තොට, තංගල්ලේ ඇමෙරිකන් ඩොලර් මිලියන 40.5 ක ආයෝජනයක් සිදු කිරීමේ අපේක්ෂාවෙන් කාමර 158 ක සුඛෝපභෝගි සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා ආසියා පැසිපික් කලාපයේ සංචාරකයන්ට ආගන්තුක සත්කාර හා විවේක ගැනීම සඳහා පහසුකම් සපයන විශාලතම සමාගම්වලින් එකක් වන තායිලන්තයේ "මයිනර් ඉන්ටර්නැෂනල් පීසීඑල් සමාගම", "හේමාස් හෝල්ඩින්ස් පීඑල්සී" හි අනුබද්ධිත සමාගමක් වන "පීස් හෙවෙන් රිසෝර්ට්ස් ලිමිටඩ්" සමඟ ඒකාබද්ධව ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබී ය.

5. ලෝකයේ වඩාත් විචිත්‍රවත් වූ ස්ථාන සංවර්ධනය කිරීම පිළිබඳව ප්‍රසිද්ධියක් ලබා ඇති සුඛෝපභෝගී සංචාරක නිවාස වතුවල හිමිකරුවන් වන ඇ.එ. ජ. යේ "ඇනී විලාස් ඉන්ටර් නැෂනල්" සමාගම විසින් දික්වැල්ල ප්‍රදේශයේ ඇමරිකන් ඩොලර් මිලියන 8ක ආයෝජනයක් සහිත ව සුඛෝපභෝගී සංචාරක නිවාස සහිත නිවාඩු නිකේතනයක් සැලසුම් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබී ය.

6. කොළඹ 07, වෝඩ් පෙදෙසේ ඇමෙරිකන් ඩොලර් මිලියන 17ක ආයෝජනයක් සමඟ කාමර 70 ක් හා සේවා සැපයීම හා සම්බන්ධ බද්ධ නිවාස 28 ක් සහිත තරු 4 සුඛෝපභෝගි නිවාඩු නිකේතනයක් ඉදිකිරීමට දිවයිනේ සුඛෝපභෝගී හෝටල් 11ක් හිමි ශ්‍රී ලංකාවේ විශාලතම හෝටල් දාමයෙන් එකක් වන "ජෙට්වින් ග෴ප් සමාගම" තවත් ව්‍යාපෘති අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබීය. ව්‍යාපෘතිය මේ වන විට ඉදි කිරීමේ අදියරේ පවතින අතර 2014 වසරේදී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

7. ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක ආයෝජනයක් සහිතව අන්තර්ජාතික ගොල්ෆ් පිටියක් සැලසුම් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමට ස්වීඩන් සමාගමක් වන "ෆෙරුගෝම්" හා ඔවුන්ගේ දේශීය නියෝජිතායතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. කුච්චවේලි, පාසිකුඩා හා නැගෙනහිර වෙරළබඩ වෙනත් ස්ථාන නැරඹීමෙන් අනතුරුව එම සමාගම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සංචාරක ව්‍යාපාර අංශය සමඟ සාකච්ඡා පවත්වනු ලැබීය.

8. සාකච්ඡා වාර කීපයක් පැවැත්වීමෙන් අනතුරු ව බංගලාදේශයේ "පෙනින්සියුලා චිතගොන්"හි ජ්‍යෙෂ්ඨ නිලධාරීහු 2012 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ආයෝජනය මණ්ඩලයට පැමිණියහ. ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් ආයෝජනය කරමින් තරු හතරේ හෝටලයක් හා විනෝදාස්වාදය /ආගන්තුක සත්කාර සපයනු ලබන මධ්‍ය ස්ථානයක් සැලසුම් කිරීම සඳහා ඔවුහු ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ ප්‍රදේශ විශේෂයෙන් නැරඹූහ.

9. දකුණු කොරියාවේ, "ජුන්ජින් පියුරි ඉන්ටර්නැෂනල්" සමාගම

10. ඉන්දුනීසියාවේ බාලි, උටාමා හි "පී.ටී. පැනොරාමා ඩිවලොප්මන්ට්" සමාගම

11. හයිද්‍රාබාද් හි, "සැරෝවර් ග෴ප්" හි මන්ජීරා හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්" සමාගම

12. කැනඩාවේ "සිටිමැක්ස් හොටෙල්" සමාගම

13. BHD, SDN, "සුපර්ලෝන් වර්ල්ඩ්වයිඩ්" සමාගම

**කෘෂිකාර්මික අංශය**

1. ඇ.එ. ජ. යේ "ෆයින් හිල් ස්ට්‍රීම් කැපිටල් එල්එල්සී" සමාගම නියෝජනය කරමින් කිරි නිෂ්පාදන අංශයේ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට දූත පිරිසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

2. 100% ක් විදේශීය ආයෝජන සහිතව ඇමරිකානු ඩොලර් මිලියන 22 ක් ආයෝජනය කර රැකියා අවස්ථා 500 ක් උත්පාදනය කරමින් දික්ඕවිට ප්‍රදේශයේ ධීවර කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතියක් සැලසුම් කිරීම සඳහා "නිච්ලන් ෆිශරි (පුද්) සමාගමේ" නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ.

3. හොංකොං රාජ්‍යයේ "පෙන්ෆීල්ඩ් ලිමිටඩ්" සමාගම කන්තලේ සීනි කර්මාන්තය අත්පත් කර ගැනීම සඳහා ලංසුවක් ඉදිරිපත් කරනු ලැබී ය.

4. ඇමෙරිකානු ඩොලර් මිලියන 2 කට වඩා වැඩි ස්ථාවර ආයෝජනයක් සිදු කරමින් අනුරාධපුරයේ ස්ථාපනය කිරීමට නියමිත වී මෝලක් සැලසුම් කිරීම සඳහා "ඇග්ස්ටර් ගේන්ස්" (පුද්) සමාගම ඉදිරිපත්ව සිටියි.

5. දඹුල්ලේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතව පවතින ඇමෙරිකානු ඩොලර් මිලියන 4කට වඩා වැඩි ආයෝජනයක් සහිතව කිරි සැකසුම් කම්හලක් ඉදිකිරීමට " සීඅයිසී ඇග්‍රි බිස්නසස්" (පුද්) සමාගම ඉදිරිපත්ව සිටියි.

**තොරතුරු තාක්ෂණ/දැනුම් සේවා අංශය**

1. ඇමෙරිකානු ඩොලර් මිලියන 4.4ක් ආයෝජනය කරමින් හා නව රැකියා අවස්ථා 100ක් උත්පාදනය කරමින් විදේශ රටවල ලියාපදිංචි කළ සමාගම් සඳහා ව්‍යාපාරික කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා හා දැනුමැති කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා සඳහා වන අපනයන වෙළෙඳපොළ සඳහා පරිගණක මෘදුකාංග සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් ඕස්ට්‍රේලියාවේ " බිස්නස් පේමන්ට් සර්විසස් (පුද්) සමාගම" විසින් ඉදිරිපත් කරනු ලැබී ය.

2. ඇමෙරිකානු ඩොලර් මිලියන 1.25ක ආයෝජනයක් සිදු කරමින් හා රැකියා අවස්ථා 200ක් උත්පාදනය කරමින් අපනයන වෙළෙඳපොළ වෙනුවෙන් මානව සම්පත් හා ව්‍යාපාරික කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා සැපයීම සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට එක්සත් රාජධානියේ ආයෝජකයෙකු විසින් අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබී ය.

3. 500කට වැඩි සේවකයන් සංඛ්‍යාවක් උපයෝගී කර ගනිමින් අපනයන වෙළෙඳපොළ සඳහා තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාරික කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා පිළිබඳ ව්‍යාපෘතියක් සැලසුම් කිරීම සඳහා එක්සත් රාජධානියේ "බාර්ක්ලේස් කැපිටල් සමාගම" සාකච්ඡා පවත්වනු ලැබීය.

4. මූල්‍ය ආයතන, සංස්ථා හා කර්මාන්ත සුවිශේෂී සිරස් වෙළෙඳපොළ වෙනුවෙන් ව්‍යවසාය ගෙවීම් කාර්යාවලි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රමුඛ ආයතනයක් වන ඕස්ට්‍රේලියාවේ "ජෙකෝප් පේමන්ට් සොලියුෂන්ස් (පුද්) සමාගම" විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 4.4 ක ආයෝජනයක් සිදු කිරීමේ අපේක්ෂාවෙන් හා රැකියා අවස්ථා 100 ක් සැපයීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව තුළ දැනුමැති කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා මෙහෙයවීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

5. "එස්.එල්.කේ. ග්ලෝබල් බී.පී.ඕ. සර්විසස් (පුද්) සමාගම" මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 3 ක් ආයෝජනය කරමින් හා රැකියා අවස්ථා 500ක් උත්පාදනය කරමින් අපනයන වෙළෙඳපොළ සඳහා ව්‍යාපාරික කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා හා මහජනතාව හා කෙළින්ම සම්බන්ධ නොවන සේවා සැලසුම් කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබී ය.

**1 වන ආංශික කණ්ඩායමේ විදේශීය ප්‍රවර්ධන මෙහෙවර**

2012 වසර තුළදී 1 වන ආංශික කණ්ඩායම විසින් කිසිදු විදේශීය මෙහෙවරක් සැලසුම් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ සිදු කරනු නොලැබීය.

**දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවට කැඳවනු ලැබූ විදේශීය දූත පිරිස්**

1. "කටාර් හෝල්ඩිං සමාගම" හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා මෙන්ම ශ්‍රී ලංකා රජය සමඟ අනෙකුත් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන ෂීක් බින් කලිෆා අල් තානිගේ ප්‍රධානත්වයෙන් කටාර් රාජ්‍යයේ නියෝජිතයන් පිරිසක් දෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ.

2. මැලේසියානු ශ්‍රී ලංකා සංවිධාන සමුළුව (FOMSO) ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳ ශක්‍යතාව සොයා බැලීමට 2012 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාවට/ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

3. සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වන ඉන්දියානු කර්මාන්ත සංධානය ව්‍යාපාරික දූත පිරිසක් 2012 මාර්තු මස 27-30 අතර කාලසීමාවේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. පවත්නා ආයෝජන අවස්ථා පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලැබීය. නිෂ්පාදන, ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්, තොරතුරු තාක්ෂණය,තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය, සුව සත්කාරය, ඉලෙක්ට්‍රොනික උපකරණ අපනයනය හා ආනයනය, සංචාරක ව්‍යාපාරය හා සත්කාරක සේවා අංශය වැනි නව්‍ය ව්‍යාපාරික අවස්ථා පිළිබඳව සොයා බැලීම සඳහා සාකච්ඡා පවත්වනු ලැබීය.

4. එක්සත් රාජධානියේ " බාර්ක්ලේස් කැපිටල් හෝල්ඩින්ස්" සමාගමේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. තොරතුරු තාක්ෂණ/ව්‍යාපාරික කාර්යාවලි බාහිර ආයතනවලින් ඉටු කරවා ගැනීමේ සේවා සම්බන්ධයෙන් ආයෝජනය කිරීමේ අවස්ථා සොයා බැලීම සඳහා 2012 අප්‍රේල් මාසයේදී සාකච්ඡා පවත්වනු ලැබීය.

5. ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝර්නියාවේ "ග්ලෝබල් එලයන්ස්" සමාගමේ නියෝජිතයන් පිරිසක් ශ්‍රී ලංකාවේ ගෝලීය මෙහෙයුම් කාර්යාලයක් සැලසුම් කිරීම සඳහා පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳව සොයා බැලීමට 2012 අප්‍රේලේ මාසය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

6. පිලිපීනයේ කෘෂිකාර්මික, කැණීම්, විදුලිබල හා බලශක්ති, සංචාරක කර්මාන්තය හා විවේකය ගත කිරීම සහ අධ්‍යාපනය යන අංශ නියෝජනය කරමින් පස් දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට 2012 මැයි මාසය තුළදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

7. මැලේසියාවේ වාණිජ හා කර්මාන්ත පිළිබඳ ජාතික මණ්ඩලයේ වෙළෙඳ හා ආයෝජන නියෝජිත පිරිසක් 2012 ජූලි මාසයේ 16 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

8. ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට හා ශ්‍රී ලංකාවේ සමාගම් සමඟ හවුල් ව්‍යාපාරවලට ඇතුළත් වීමේ අභිප්‍රායෙන් 2012 සැප්තැම්බර් මාසයේදී ආර්ථික සංවර්ධනය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකානු තානාපති ගරු ජෙෆ් ඩොයිෂ් මහතා , ඒඑන්සී ජාතික සමායෝජක හා ඒඑන්සී හි නිලධාරීන් 30 දෙනෙකු හා දකුණු අප්‍රිකානු ව්‍යවසායකයන්ගෙන් සැදුම්ලත් ඉහළ බලතල සහිත නියෝජිත පිරිසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. මෙම දකුණු අප්‍රිකානු සංචාරක නියෝජිත පිරිස ඉදිකිරීම් කර්මාන්තය , ප්‍රවාහනය, සත්කාරක සේවා/සංචාරක ව්‍යාපාරය, ඉංජිනේරු කෘෂිකර්මාන්තය, තොරතුරු තාක්ෂණ හා මෘදුකාංග සංවර්ධනය ඇතුළු පුළුල් පරාසයක ව්‍යාප්ත වූ අංශ නියෝජනය කරනු ලැබීය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නව වැදෑරුම් ප්‍රමුඛතා අංශ, ක්‍රමෝපායික අවබෝධතා ව්‍යාපෘතිද ඇතුළු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප හා දිවයිනේ දැනට පවතින නිදහස් ව්‍යාපාරික පරිසරය පිළිබඳව ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැඩ බලන විධායක අධ්‍යක්ෂ විසින් විශේෂයෙන් විස්තර කරනු ලැබී ය.

9. ප්‍රමුඛ පෙළේ කර්මාන්තකරුවන් කීප දෙනෙකු ද ඇතුළු ඉන්දියානු කර්මාන්ත සංධානයේ (CII) සාමාජිකයන් 13කින් සමන්විත නියෝජිත පිරිසක් 2012 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. ශ්‍රී ලංකාව විසින් ආයෝජකයන්ට ලබාදෙන අවස්ථා පිළිබඳව හා ශීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින ව්‍යාපාරික පරිසරය පිළිබඳවද, ආයෝජනය කළ හැකි ප්‍රමුඛතා අංශ හා ආයෝජකයන්ට පිරිනමනු ලබන දිරි දීමනා පිළිබඳව ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විස්තර සපයනු ලැබීය. ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණ කර්මාන්තය, බලශක්ති අංශයේ ව්‍යාපෘති, සමෝධානික ව්‍යාපාරික පුරවර සංවර්ධනය කිරීම ඇතුළත්ව නිශ්චල දේපළ, වායු සමීකරණ හා බීම නිෂ්පාදනය වැනි අංශවල ආයෝජනය කිරීමට ඉන්දියානු සමාගම්වලට පවතින හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ පැවති සාකච්ඡාවල දී අවධානය යොමු කරනු ලැබීය.

**1 වන ආංශික කණ්ඩායමේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**

1. ආයෝජන ක්ෂේත්‍රය පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා කටාර් රාජ්‍ය අතර සහයෝගිතාවෙන් ඇති කර ගත් එකඟතාවක් මත ජනවාරි මාසය තුළදී "කටාර් හෝල්ඩින්ස් සමාගම" හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබී ය.

2. නව්‍ය ආයෝජන ව්‍යාපෘති හා දැනටමත් පවතින සමාගම් සඳහා 2011 අයවැය මගින් හඳුන්වා දී ඇති නව්‍ය ආයෝජන දිරිගැන්වීම් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් 2012 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය/1 වන ආංශික කණ්ඩායම විසින් මැලේසියානු ආයෝජන සංසදය සංවිධානය කරනු ලැබීය. මණ්ඩලයේ වෙනත් අදාළ නිලධාරීන් සමඟ මැලේසියානු සහයෝගීතාව සහිත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මැලේසියානු සමාගම් හා වෙනත් සමාගම් ද මැලේසියානු මහ කොමසාරිස්වරයා ඇතුළු රජයේ ප්‍රධාන

නිලධාරීන්ද මෙම අවස්ථාවට සහභාගි වූහ. වැඩ බලන විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉටු කරන පහසුකම් සැපයීමේ කාර්යභාරය පිළිබඳව සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ප්‍රශ්නෝත්තර විචාරයකට පසු ව සිදු කරනු ලැබී ය.

3. 1 වන ආංශික කණ්ඩායමේ නිලධාරීහු 2012 මාර්තු/අප්‍රේල් කාල සීමාව තුළ පවත්වනු ලබන "මෙගා එක්ස්පෝ 2012" ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් සහභාගී වූහ. ප්‍රදර්ශනය නැරඹීමට යාමට පෙරාතුව බොහෝ දූත පිරිස් සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හුවමාරු කරගත් අතර ආංශික පදනම මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ විශේෂ සාකච්ඡා වාර කිහිපයක්ම සූදානම් කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනය පැවති කාල සීමාව තුළ සිංගප්පූරු, මැලේසියානු, කැනේඩියානු හා ඉන්දියානු දූත මණ්ඩල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැමිණි අතර ප්‍රතිලාභ සහිත වඩාත් යහපත් දිරි ගැන්වීමේ දීමනා ව්‍යුහ සමග ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී ඇති ආයෝජන සඳහා උපස්ථම්භක වන පරිසරය පිළිබඳව කරුණු සැපයීමේ මාහැඟි අවස්ථාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබී තිබුණි.

4. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ "ඉන්වෙස්ට්‍රේඩ්" ආයෝජන හා වෙළඳ ප්‍රදර්ශනය හා සමගාමීව 1 වන ආංශික කණ්ඩායම මගින් 2012 අප්‍රේල් 26 දින සිට 28 දින දක්වා පැවැත් වූ තෙදින සම්මන්ත්‍රණය සඳහා ඉන්දියානු වෙළඳ නිලධාරීන් පැමිණ සහභාගී වූ අතර "ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා" යන මැයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් ද සිදු කරනු ලැබීය. ඉදිකිරීම් අංශයෙන් ඉන්දියානු සමාගම් 50කට වැඩි සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර වෙනත් ඉන්දියානු පාර්ශ්ව කරුවන් හා වෙනත් උනන්දුවක් දක්වන සංචාරක පාර්ශ්ව සමග ව්‍යාපාරික රැස්වීම්වලටද සහභාගි විය.

5. සංවිධායකයන් විසින් කරන ලද ආරාධනයකට අනුව ශිෂ්‍යත්වයක් ලබා දැනට සිංගප්පූරුවේ රැඳී සිටින විධායක අධ්‍යක්ෂ (1 වන අංශය) 2012 මැයි මාසයේදී සිංගප්පූරුවේ, සිංගප්පූරු- ශ්‍රී ලංකා ව්‍යාපාරික සංගමය මගින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ආයෝජන බලගැන්වීම" යන මැයෙන් ශ්‍රී ලංකා ව්‍යාපාරික සංගම යේ ආයෝජකයින් සඳහා පැවැත්වූ සම්මන්ත්‍රණ මාලාව සඳහා සහභාගි වී කරුණු ඉදිරිපත් කරනු ලැබීය. මෙහිදී ආයෝජන සඳහා උපස්ථම්භක වන ශ්‍රී ලංකාවේ පරිසරය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය භාරය මෙන්ම ශ්‍රී ලංකාවේ දැනට පවත්වාගෙන යනු ලබන වඩාත් වැදගත් ව්‍යාපෘති පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මෙන්ම රටේ සංවර්ධනය සඳහා එමගින් ඉටුවන ධනාත්මක බලපෑම පිළිබඳව ද සවිස්තරාත්මකව හා අලංකාර ලෙස කරුණු ඉදිරිපත් කරනු ලැබීය.

6. 2012 ජූලි මාසයේදී පැවැත්වූ වරාය, වෙළෙඳ හා සැපයුම් සම්මේලනයේදී දකුණු ආසියානු කලාපයේ ප්‍රධාන සමුද්‍ර හා නාවික මධ්‍යස්ථානය බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාව සතු විභවය පිළිබඳව සවිස්තරාත්මක අන්දමින් හා ආකර්ෂණීය අන්දමින් කරුණු ඉදිරිපත් කරනු ලැබීය. වැඩ බලන විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) මෙම සැසියේ ප්‍රධාන දේශකයා ලෙස සහභාගි වූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැදගත්කම හා පශ්චාත් යුද්ධ සමය තුළ නිර්මාණය වී ඇති ආයෝජන සඳහා උපස්ථම්භක වන පරිසරය පිළිබඳව ද, එම කරුණු ඉදිරිපත් කිරීමේදී ඔහු විසින් අවධාරණය කරනු ලැබීය.

7. 2012 දෙසැම්බර් මාසයේ දී පැවැත්වූ " 2012 වසරේ ගෝලීය වෙළෙඳ විශිෂ්ටතා සම්මාන" ඉදිරිපත් කිරීම සම්බන්ධ කටයුතුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය/ 1 වන ආංශික කණ්ඩායම නිරත වූ අතර මෙය ශ්‍රී ලංකා නාවිකයන්ගේ ඇකඩමිය, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ හා ගුවන් සේවා අධිකාරිය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එක්ව සංවිධානය කරනු ලැබී ය. අතීතයේදී වැදගත් කාර්ය භාරයක් ඉටු කළ එමෙන්ම අනාගතයේදී ද සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂිත, විශේෂයෙන් අපනයනය වෙත නැඹුරු වූ නිෂ්පාදන හා සේවා සම්බන්ධව ඉහළ කාර්යසාධනයක් සහිත සමාගම් හඳුනාගෙන එම සමාගම්වලට මහජන වේදිකාවකදී සම්මාන ප්‍රදානය කිරීම මෙම අවස්ථාවේ ප්‍රධාන අභිප්‍රාය විය. සම්මානලාභී ආයතන වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් විය.

8. ආංශික කණ්ඩායම් සාමාජිකයන්ගේ සහාය ඇතිව පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය මගින් සකස් කර ප්‍රකාශයට පත්කර ඇති සවිස්තරාත්මක ආයෝජන තොරතුරු අන්තර්ගත වන අංශ නවයක පොත් පිංච සමඟ ආයෝජන මගපෙන්වීම් සංග්‍රහය ප්‍රවර්ධන මෙවලමක් වශයෙන් අනාගත ආයෝජකයන් සඳහා ලබාදීමට නියමිතය.

9. දැනට ක්‍රියාත්මකව පවතින සංචාරක ව්‍යාපෘති වේගවත් කිරීම සඳහා මෙන් ම අවහිරතා ඉවත් කිරීම සඳහා ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පැවැත්වූ එකම ස්ථානයෙන් අදාළ සියලු සේවා ලබාගැනීමේ ඒකකයේ සංචාරක අංශ රැස්වීම සඳහා සංචාරක අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ක්‍රමවත් ලෙස සහභාගි වූහ.

10. ප්‍රමුඛ පෙළේ ගෝලීය කළමනාකරණ උපදේශන ව්‍යාපාර සමාගමක් වන "ඒ.ටී.කියර්නි" සමාගම මගින් අනෙකුත් ප්‍රමුඛ පෙළේ දැනුමැති සේවා සපයන සමාගම්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ප්‍රමිතියකට අනුව සසඳා ඇගයීම සඳහා ඔවුන්ගේ සොයා ගැනීම් 2012 මාර්තු මාසයේ දී ඉදිරිපත් කරනු ලැබීය. තරගකාරී ලෙස ප්‍රමිතියකට අනුව සැසඳීමක් සිදුකර ඇගයීම: ශ්‍රී ලංකා දැනුමැති සේවා වාර්තාව, තොරතුරු තාක්ෂණ අංශය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක්. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ /තොරතුරු තාක්ෂණ අංශයේ සම්පත් දායකයෙකු ලෙස මේ සම්බන්ධයෙන් විශාල දායකත්වයක් අංශ ප්‍රධානියා විසින් 2011 වසර තුළදී ලබා දෙනු ලැබීය.

## 2 වන ආංශික කණ්ඩායම

### යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපනය

යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපනය යන ප්‍රධාන අංශ තුනෙන් 2 වන ආංශික කණ්ඩායම සමන්විත වේ.

(අ) විමසීම්/අයදුම් කිරීමේ අදියරේ සිට ව්‍යාපෘතියේ මුළු කාලසීමාව මුළුල්ලේම ආයෝජකයන්ට අවශ්‍ය සියලුම පහසුකම් සැපයීම ආංශික කණ්ඩායම් මගින් පෙන්වනු ලබන ආංශික කේන්ද්‍රයේ ප්‍රමුඛතම අරමුණයි.

(ආ) ආයෝජන ප්‍රමුඛතා හඳුනාගැනීමට හා ආයෝජන අවස්ථා ප්‍රතිගාමී ලෙස ප්‍රවර්ධනය කිරීමට අදාළ වන අංශයේ රේඛීය අමාත්‍යාංශය /අදාළ නියෝජ්‍යායතනය සමග මෙම කණ්ඩායම් කටයුතු කරනු ඇත.

ආයෝජනය කිරීමට අපේක්ෂා කරන ආයෝජකයන් යම්කිසි අංශයක ආයෝජනය කිරීමට තීරණය කළ විට මෙම කණ්ඩායම් ඔවුන්ගේ අංශයේ සියලුම ආයෝජකයින් සඳහා සම්බන්ධතා කළමනාකරුවන් වශයෙන් ව්‍යාපෘති ඇගයීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා ද පශ්චාත් ආයෝජන සම්බන්ධයෙන්ද කටයුතු කරති. ඔවුන්ට අදාළ වන අංශයේ පාර්ශ්වකරුවන් සමග ප්‍රබල සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ද, අංශය පිළිබඳව පුළුල් දැනුමක් ලබාගැනීමටද එමගින් ඔවුන්ට හැකි වේ.

2012 ජනවාරි - දෙසැම්බර් දක්වා ලැබුණු ව්‍යාපෘති අයදුම්පත් පිළිබඳ විස්තර

| විස්තරය | යටිතල පහසුකම් | උපයෝගිතා | අධ්‍යාපනය | මුළු |
|---|---|---|---|---|
| ලැබුණු නව අයදුම්පත් | 37 | 16 | 05 | 58 |
| පුළුල් කිරීම් සමග අනුමත කරන ලද ව්‍යාපෘති | 34 | 15 | 01 | 50 |
| අත්සන් තබනු ලැබූ ගිවිසුම් | 24 | 09 | 02 | 35 |
| ක්‍රියාත්මක කිරීමේ අදියර ආරම්භ කරන ලද ව්‍යාපෘති | 13 | 18 | 02 | 33 |
| මෙහෙයුම් අදියර ආරම්භ කරන ලද ව්‍යාපෘති | 03 | 05 | 04 | 12 |



ඇවික් ඉන්ටර් නැෂනල් * කැටික්

**ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කරනු ලැබූ/සාකච්ඡාමය අදියරේ පවතින ප්‍රධාන ව්‍යාපෘති**

1. ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආයෝජනයක් සමඟ මීරිගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කලාපයට යාබදව පිහිටි ඉඩමේ "සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්ව විද්‍යාලයේ" (UCLAN) ශාඛා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. UCLAN හි ගෝලීය පුළුල් කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස ගෝලීය ආර්ථික කටයුතු ඉටු කිරීම පිළිබඳව ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරනු ලැබූ "මනා නිපුණත්වයක් ලබාගත් උපාධිධාරීන් බිහිකිරීම" පිළිබඳව සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්ව විද්‍යාලය වගකීමෙන් බැඳී සිටියි. විද්‍යා, තාක්ෂණ, ව්‍යාපාර අධ්‍යයන හා මානව ශාස්ත්‍ර යන පීඨ හතර තුළින් උපාධි අපේක්ෂකයන් සඳහා උපාධි හා පශ්චාත් උපාධි පිරිනමමින් එක්සත් රාජධානියේ ප්‍රමිතියෙන් යුත් උසස් අධ්‍යාපන අත්දැකීම් ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම සඳහා මෙම විශ්ව විද්‍යාල ශාඛාව ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරනු ලැබේ. වෘත්තීය අරමුණු, උචිත බව හා සේවා යෝජනීය බව (රැකියාවක නිරත වීමේ හැකියාව) පිළිබඳව මෙම විෂයමාලා මගින් විශේෂයෙන් අවධාරණය කෙරේ. මීරිගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අක්කර 120 ක විශාලත්වයෙන් යුත් යෝජිත ඉඩම එක්සත් රාජධානියේ "සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්ව විද්‍යාලය" සඳහා වසර 99 කට බදු දෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කරනු ලැබී ය.

   2013 ජනවාරි මාසයේදී මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය. එමෙන්ම මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර 2014 සැප්තැම්බර් මාසයේදී පළමු උපාධි අපේක්ෂක කණ්ඩායම ලෙස 550ක් පමණ බඳවා ගැනීමටද ඔවුහු අපේක්ෂා කරති.

   ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමේ අපේක්ෂාවෙන් 2012 වසර තුළ පහත සඳහන් වන ප්‍රධාන සමාගම්/කණ්ඩායම් ශ්‍රී ලංකාවට සංචාරය කළහ.

**අධ්‍යාපන අංශය**

1. **රැෆල්ස් එඩියුකේෂන් කෝපරේෂන් ලිමිටඩ්**

ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක ආයෝජනයක් සිදු කර මීගමුවේ උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීමේ අපේක්ෂාවෙන් සිංගප්පූරුවේ "එම්/එස් රැෆල්ස් එඩියුකේෂන් කෝපරේෂන් ලිමිටඩ්" මගින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබී ය.

ආසියා පැසිපික් කලාපයේ විශාලතම පුද්ගලික අධ්‍යාපන ආයතන සමූහයෙන් එකක් වන්නේ සිංගප්පූරුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති " එම්/එස් රැෆල්ස් එඩියුකේෂන් කෝපරේෂන් ලිමිටඩ්" ආයතනයයි. රටවල් 13ක පිහිටි පුරවර 30ක විද්‍යාල 33ක් මෙහෙයවන අධ්‍යාපන ආයතන සමූහයක් ලෙස මෙම අවස්ථාව වන විට මෙම සමාගම සංවර්ධනය වී තිබේ. 21,300කට වඩා වැඩි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් "රැෆල්ස් එඩියුකේෂන් කෝපරේෂන් ලිමිටඩ්" හි තෘතීයක වැඩසටහන්වලට ලියාපදිංචි වී සිටිති.

ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙන්ම දකුණු ආසියාතික රටවලින් පැමිණි අන්තර්ජාතික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීමේ අරමුණින් මෙම යෝජිත ව්‍යාපෘතිය ස්ථාපනය කරනු ලැබේ. ව්‍යාපාර පරිපාලනය, ආගන්තුක සත්කාරය හා සංචාරක ව්‍යාපාරය, ගණකාධිකරණය, මනෝ විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හා තාක්ෂණය ආදී පදනම් ඩිප්ලෝමාවල සිට උපාධි හා පශ්චාත් උපාධි මට්ටම දක්වා වන පුහුණු මොඩියුලයන් සැපයීමට එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

**යටිතල පහසුකම් අංශය.**

1. **ක්‍රිෂ් ට්‍රාන්ස්වර්ක්ස් කලම්බු (පුද්) සමාගම**

ඇමෙරිකානු ඩොලර් මිලියන 450ක ආයෝජනයක් සිදු කිරීමේ අපේක්ෂාවෙන් ඉන්දියාවේ "ක්‍රිෂ් සමූහ ආයතනය" ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය පිහිටුවීමට යෝජිතව ඇත්තේ අක්කර 04, රූඩ් 01, පර්චස් 06 ක විශාලත්වයක් ඇති කොළඹ 01 හි පිහිටි "ට්‍රාන්ස්වර්ක්ස් චතුරස්‍රය" හි ය. වසර 99 බදු පදනම මත මෙම ඉඩම මෙම සමාගමට බදු දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා එම්/එස් ක්‍රිෂ් සමූහ ව්‍යාපාරය අතර අවබෝධතා ගිවිසුමක් 2012/07/30 දින අත්සන් තබනු ලැබීය. 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ මෙම ව්‍යාපෘතිය සලකා බලනු ලැබේ. මෙම ඉඩමේ පිරිවැය සඳහා ඉඩමේ වටිනාකමින් 80% ක් නාගරික සංවර්ධන අධිකාරියට මෙම සමාගම මගින් ලබා දී ඇත. ඉඩමේ පිරිවැයෙන් 30%ක් ආවරණය වන සංස්කෘතික උරුමයක් සහිත පරිශ්‍රය සඳහා බදු ගිවිසුමක් මෙම සමාගම මගින් දැනටමත් අත්සන් තබා ඇත. එක් එක් කුළුණේ මහල් 70 ක ගොඩනැගිලි සහිත කුළුණු හතරකින් මෙම සංකීර්ණය සමන්විත වේ. කුළුණු තුනක අති සුඛෝපභෝගී බද්ධ නිවාස සංකීර්ණවලින්ද, හතරවන කුළුණේ සිල්ලර සාප්පු සංකීර්ණයකින්ද, කාර්යාල සංකීර්ණ හා සුපිරි පාරිභෝගිකයින් සඳහා වූ තරු හතේ හෝටලයකින්ද මෙය සමන්විත වේ. සංස්කෘතික උරුමයක් සහිත ගොඩනැගිල්ල එහි සංස්කෘතික ගති ලක්ෂණ එලෙසම පවතින පරිදි පුනරුත්ථාපනය කරනු ලැබේ. වඩාත් කැපී පෙනෙන හෝටලයකට පුනරුත්ථාපනය කරනු ලබන සංකීර්ණය මගින් ඉඩකඩ සැපයෙනු ඇත. සියලුම අති නවීන පහසුකම්වලින් හා අනවශ්‍ය ලෙස වඩාත් ඉස්මතු නොවී සේවා සපයනු ලබන නව්‍ය සංවර්ධිත ස්පා මධ්‍යස්ථානයකින් හා නව්‍ය සංවර්ධිත ව්‍යාපාර මධ්‍යස්ථානයකින් ද මෙම සංකීර්ණය සමන්විත වනු ඇත.

2. **ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම**

අමෙරිකානු ඩොලර් බිලියන 4 ක ආයෝජනයක් සහිතව ත්‍රිකුණාමලයේ සාම්පූර් ප්‍රදේශයේ බැර කාර්මික කලාපයක් ස්ථාපනය කිරීම සඳහා "ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම (SLGIPL)" මගින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීය. අපේක්ෂිත මට්ටමින් ආයෝජකයින් කලාපය තුළට ආකර්ෂණය කර ගැනීමට හා ආයෝජන සඳහා පහසුකම් සැලසීමට හැකිවන පරිදි අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම්, විවේක ගැනීමේ හා විනෝදාස්වාදය ලබා ගැනීමේ පහසුකම් සහිතව පදිංචිවීම සඳහා නවීන නිවාස, ගැඹුරු දිය කඩන හා භාණ්ඩ තොග රැස්කිරීමේ අංගණ ස්ථාපනය කිරීම, අභ්‍යන්තරික මාර්ග, බලශක්ති අවශ්‍යතා ලබා

දීම, ජල සැපයුම, අප ජලාපවහන පද්ධතිය, අප ජල පවිත්‍රාගාරය ඇතුළත්ව අවශ්‍ය භෞතික හා සමාජීය යටිතල පහසුකම් සපයමින් දළ වශයෙන් අක්කර 818 ක පැතිරුණු ප්‍රදේශයක් ආවරණය කරමින් ත්‍රිකුණාමලේ සාම්පූර් ප්‍රදේශයේ බැර කර්මාන්ත සඳහා විශේෂිත කලාපයක් සංවර්ධනය කිරීම, මෙහෙයවීම හා කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් පිළියෙළ කර තිබේ. මෙම යෝජිත බැර කාර්මික කලාපය මගින් මෙම ප්‍රදේශයේ ආර්ථිකමය භූ දර්ශනය පවා වෙනස් කරනු ලබන අතර රටේද ආර්ථිකමය භූ දර්ශනය එමගින් පුළුල් ලෙස වෙනස් වනු ඇත. එමනිසා, මෙම ව්‍යාපෘතිය 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන පනත යටතේ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සලකනු ලැබේ.

3. **ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා සමාගම**

"ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා සමාගම" විසින් 2012/09/25 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. ඇමෙරිකානු ඩොලර් මිලියන 64.25 ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කොළඹ 3 ප්‍රදේශයේ කුළුණු 3 කින් සමන්විත වන මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ විය.

4. **ජී.වී.ආර් (පුද්) සමාගම**

ඇමෙරිකානු ඩොලර් මිලියන 34.7 ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් මහනුවර ප්‍රදේශයේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සඳහා 2012/12/20 දින ජී.වී.ආර්. (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

5. **හැව්ලොක් සිටි (පුද්) සමාගම.**

ඇමෙරිකානු ඩොලර් මිලියන 210 ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කොළඹ 06 මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමට 2012.12.31 දින හැව්ලොක් සිටි (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

6. **ඉම්පීරියල් බිල්ඩර්ස් (පුද්) සමාගම**

ඇමෙරිකානු ඩොලර් මිලියන 25.6ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කොළඹ 2 කොම්පඤ්ඤවීදියේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමට 2012.10.10 දින ඉම්පීරියල් බිල්ඩර්ස් (පුද්) සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් තබනු ලැබීය. කොළඹ නගර සංවර්ධනයේ කොටසක් ලෙස මෙම ව්‍යාපෘතිය මෙහෙයවීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය "කොම්පඤ්ඤවීදිය නැවත සංවර්ධනය කිරීම" ලෙස හැඳින්වේ. මෙම යෝජනාව යටතේ අක්කර 3ක ඉඩමක පවුල් 470ක් සඳහා බද්ධ නිවාස හා වෙළඳ ඒකක 136ක් ඉදිකිරීමට මෙම සමාගම විසින් සැලසුම් සකස් කර තිබේ.

7. **කෙප්පෙල් සිටි ඩිවලොප්මන්ට්ස් (පුද්) සමාගම**

ඇමෙරිකානු ඩොලර් මිලියන 65.58ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කොළඹ 13 හි බද්ධ නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට 2012.11.30 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ කෙප්පෙල් සිටි ඩිවලොප්මන්ට්ස් (පුද්) සමාගම විසින් ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

**උපයෝගිතා අංශය**

1. **සුප්‍රීම් සැට් (පුද්) සමාගම**

රු. බිලියන 2.09ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් පාරිභෝගිකයන් සඳහා විදුලි සංදේශ විකාශන පහසුකම් ලබා දීම සඳහා චන්ද්‍රිකා පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහාත් මෙහෙයවීම සඳහාත් සුප්‍රීම් සොලූෂන්ස් (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට අත්සන් තබනු ලැබීය. ව්‍යාපෘති මූලාරම්භයේ දී ව්‍යාපෘති සමාගම විසින් දැනටමත් කක්ෂගත කර ඇති චීන චන්ද්‍රිකාවක කොටසක බදු අයිතිය ලබාගත් අතර චීන බැංකුවකින් ලබාගන්නා ලද ණයක් මගින් එම බදු මුදල මූල්‍යකරණය කරනු ලැබීය.

මහනුවර කාර්මික උද්‍යානයේ දී පෑරීචි නවාතැන්පොළක් 2013 වසර තුළ දී ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ පරිපූරක ගිවිසුමක් ඔවුන් විසින් දැනටමත් අත්සන් තබා තිබේ.

2. **රිනිව්ගන් එන්වයරන්මන්ට් ප්‍රොටෙක්ෂන් කෝට්ටේ (පුද්) සමාගම**

රු. බිලියන 3.56ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කඩුවෙල දී අපද්‍රව්‍ය වලින් බලශක්ති මෙගාවොට් 10ක් නිපදවීමේ කම්හලක් ස්ථාපනය කිරීම සඳහා ඉන්දියාවේ රිනිව්ගන් එන්වයරන්මන්ට් ප්‍රොටෙක්ෂන් කෝට්ටේ (පුද්) සමාගමට අනුමැතිය ලබා දෙනු ලැබීය.

3. **කිතුල්ගල හයිඩ්‍රෝ පවර් (පුද්) සමාගම**

කිතුල්ගල හයිඩ්‍රෝ පවර් (පුද්) සමාගම විසින් රු. බිලියන 1.38ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් කිතුල්ගල මෙගාවොට් 7.3ක ජල විදුලි බලාගාරයක් ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

4. **එස්කැස් ඔවාලා (පුද්) සමාගම**

එස්කැස් ඔවාලා (පුද්) සමාගම විසින් රු. මිලියන 860ක් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් මාතලේ මෙගාවොට් 2.8 ක ක්ෂුද්‍ර ජල විදුලි බලාගාරයක් ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

**2 වන ආංශික කණ්ඩායම මගින් භාරගන්නා ලද විදේශීය ප්‍රවර්ධන කාර්යයන්**

1. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) හා ඔසාකා ප්‍රාන්ත රජය සමඟ සහයෝගීතාවයෙන් 2012 මාර්තු 12 දින සිට 16 වන දින දක්වා ජපානයේ දී ආයෝජන ප්‍රවර්ධන කාර්යයක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් විය. "UNIDO" මගින් ටෝකියෝ නගරයේ දී ඔවුනොවුන් අතර රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලද අතර ඔසාකා වාණිජ හා කාර්මික මණ්ඩලය හා ඔසාකා ප්‍රාන්ත රජයේ ඔසාකා අන්තර්ජාතික ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය මගින් 2012 මාර්තු මස 15 වන දින ආයෝජන සංසදයක් සංවිධානය කරනු ලැබීය.

   මෙම කාර්යයේ අරමුණ වූයේ ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ආයෝජකයන් හඳුනා ගැනීම හා වර්තමාන ව්‍යාපාරික පරිසරය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඔවුන්ට පිරිනමනු ලබන ප්‍රතිලාභ පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමයි. ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ආයෝජකයන් හඳුනා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ දී ආයෝජනය කිරීම සඳහා එම විභව්‍ය ආයෝජකයන්ව දිරිමත් කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉදිරි කටයුතු සිදු කරනු ලැබීය. ජපානයෙන් ලැබෙන ආයෝජන සමායෝජනය කිරීම භාරව සිටින නිලධාරියා මෙම වැඩසටහනේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කළේය.

2. චීනයේ වාණිජ කටයුතු අමාත්‍යාංශය හා අන්තර් ජාතික වෙළදාම හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ චීන ඇකඩමිය (CAITEC) මගින් සංවිධානය කරන ලද චීන - දකුණු ආසියානු ජාතීන්ගේ ආයෝජන සහයෝගීතාවය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා චීනයට සංචාරය කළහ. චීනයෙන් ලැබෙන ආයෝජන සමායෝජනය කිරීම භාරව සිටින නිලධාරියා මෙම වැඩසටහනේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජන කරනු ලැබීය.

**2 වන ආංශික කණ්ඩායම මගින් රට තුළට කැඳවනු ලැබූ දූත මණ්ඩල**

1. මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියක ආයෝජනය කිරීම පිළිබඳ යෝජනාවක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2012 ජනවාරි මාසයේ දී සී පී සෝලර් සමාගම නියෝජනය කරමින් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත චීන දූත පිරිසක් පැමිණියහ. මෙම දූත මණ්ඩලයේ උපදේශකවරයා ලෙස හිටපු ශ්‍රී ලංකා චීන තනාපතිවරයා වන ෂෑන්ග් වෙන් ලී මහතා සහභාගී විය. ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා, කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා, සුනිත්‍ය බලශක්ති අධිකාරියේ හා ලංකා විදුලිබල මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ව හමු වීම මෙම දූත පිරිසේ අභිප්‍රාය විය .

2. ආයෝජනය සඳහා ලබා ගත හැකි ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කිරීමට "පවර් චයිනා" සමාගමේ සාමාජිකයන් හයදෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ. මෙම දූත පිරිස සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘතිවල හා ඩෙන්ඩ්‍රෝ බලාගාරවල ආයෝජනය කිරීම පිළිබඳව ඉමහත් උනන්දුවක් දැක්වූහ.

3. චීනයේ පෙට්‍රෝලියම් හා රසායනික කර්මාන්ත සම්මේලනයෙන් සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වන දූත පිරිසක් පෙට්‍රෝලියම් හා රසායන කර්මාන්ත නිෂ්පාදන ක්ෂේත්‍රයේ වෙළඳ හා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2012 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියහ.

4. බර කිරීමේ උපකරණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීමට ලුහු කර්මාන්ත පිළිබඳ ජාතික කවුන්සලයේ සාමාජිකයෙකු සහ චීන බර කිරීමේ උපකරණ සංගමයේ සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත (සමාගම් 23ක්) දූත පිරිසක් 2012 ජූනි මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. මෙම දූත පිරිසේ සාමාජිකයෝ ශක්‍යතාවක් ඇති හවුල් ව්‍යාපාර අවස්ථා සම්බන්ධයෙන් දේශීය ආයතනවල හා ඒ හා සමාන ආයතනවලද අදාළ රජයේ නියෝජිතායතනවල ද නිලධාරීන්ව හමු වී සාකච්ඡා පැවැත්වූහ.

5. "යුන්නන් ප්‍රොවින්ෂල් එනර්ජි ඉන්වෙස්ට්මන්ට් ගෲප් (පුද්) සමාගමේ"උප සමාගමක් වන වයි.පී.අයි.සී අන්තර්ජාතික බලශක්ති සහයෝගීතා හා සංවර්ධන (පුද්) සමාගමෙන් චීන දූත පිරිසක් ශ්‍රී ලංකාවේ බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමේ විභවයන් පිළිබඳව සොයා බැලීමට ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ආරම්භ කිරීම පිළිබඳ ඔවුන්ගේ අභිප්‍රාය දැක්වෙන ලිපියක් ද ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාට ඉදිරිපත් කළහ.

6. චීනයේ දියා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් සමූහ ව්‍යාපාරයේ සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත චීන දූත පිරිසක් නිශ්චල දේපළ සංවර්ධනය හා සංචාරක ව්‍යාපාරය පිළිබඳ ක්ෂේත්‍රවල ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට 2012 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ . 2009 වසරේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ ඉදිරි කටයුතු සොයා බැලීමේ අරමුණින් මෙම සංචාරය සැලසුම් කරනු ලැබීය.

7. කාම්බෝජයේ පූජ්‍ය ජෝර්ජ් ලින්ගේ නායකත්වයෙන් යුත් ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රමුඛ පෙළේ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වූ බෞද්ධ දූත පිරිසක් ආයෝජන අවස්ථා සොයාබැලීමට මෙන්ම 2013 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතව ඇති ආසියානු බෞද්ධ සංස්කෘතික උත්සවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ද 2012 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

8. වුහාන් පළාතේ ප්‍රමුඛ පෙළේ ආයෝජන සමාගම් නියෝජනය කරමින් චීනයේ "වුහාන් ඩන්ගායි සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි ඉන්ඩස්ට්‍රීස් සමූහ ව්‍යාපාරයේ" චීන දූත කණ්ඩායමක් ඖෂධ සම්බන්ධ ක්ෂේත්‍ර, පශු සම්පත් සංවර්ධනය, කැණීම් කටයුතු, සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ව්‍යාපෘති, දේපළ සංවර්ධනය ආදී ක්ෂේත්‍රවල ආයෝජන හැකියාවන් පිළිබඳව සොයා බැලීමට දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන කාර්යාංශය ආදී ආයතනවලින් සංචාරක දූත කණ්ඩායම සඳහා සවිස්තරාත්මක වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස "හියුමන්වෙල් හෙල්ත් කෙයාර්" සමූහ ව්‍යාපාරය මගින් ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ස්ථාපනය කිරීම පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදනය නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කරනු ලැබීය.

9. ජපාන විදේශ වෙළඳ සංවිධානයේ (JETRO) කොළඹ කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබූ පරිදි 2012 නොවැම්බර් 22 වනදා ශ්‍රී ලංකාවට පැමිණි දූත මණ්ඩලයක සාමාජිකයන් 30 දෙනෙකු හමු වීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකිවිය. ජපානයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (JCCI) මගින් සංවිධානය කරන ලද ඉහළ මට්ටමේ ජපාන ව්‍යාපාරික දූත මණ්ඩලයක් සඳහා 2012 දෙසැම්බර් 6 වනදා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී "ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා" පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබීය. 17 වන ශ්‍රී ලංකා - ජපාන හා ජපාන - ශ්‍රී ලංකා ව්‍යාපාරික සහයෝගිතා කමිටුවල ඒකාබද්ධ රැස්වීමට සමගාමීව මෙම ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබීය.

10. නිෂ්පාදන අංශයේ ආයෝජන අවස්ථා සොයා බැලීම සඳහා බුසාන් වාණිජ මණ්ඩලයේ සාමාජිකයන් 32කින් සමන්විත දූත පිරිසක් 2012 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

11. ප්‍රවාහනය/ දුම්රිය මාර්ග ආශ්‍රිත ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2012 අප්‍රේල් මාසයේ දී කොරියාවේ ප්‍රවාහන අමාත්‍යාංශයේ සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

12. මත්තල අන්තර්ජාතික ගුවන්තොටුපොළ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් ඇතිව ගුවන් සේවා හා සම්බන්ධ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කිරීමට “INCHEON ඉන්ටර්නැෂනල් එයාර්පෝර්ට් සංස්ථාවේ” සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

13. 2012 මාර්තු මස එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා ව්‍යාපාරික දූත ගමන

එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරන ලද ව්‍යාපාරික දූත මණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය 2012 “එක්ස්පෝ” ප්‍රදර්ශනය අතරතුර දී සිදු විය. මෙම දූත මණ්ඩලය ආචාර්ය ක්‍රිස් නෝනිස් විසින් මෙහෙයවනු ලැබූ අතර තොරතුරු තාක්ෂණය, අධ්‍යාපන, සංචාරක ව්‍යාපාරය, යටිතල පහසුකම් සංවර්ධනය ආදී අංශ පිළිබඳ උනන්දුවක් දක්වන විවිධාංගීකරණය වූ ක්ෂේත්‍ර වලට අදාළ වන සමාගම්වලින් යුක්ත විය.

14. 2012 මාර්තු මස බෙල්ජියම් ව්‍යාපාරික දූත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය

බ්‍රසල්ස් නගරයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් එක්ස්පෝ - 2012 ප්‍රදර්ශනය අතරතුර දී මෙම දූත පිරිස සඳහා මෙම ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කළහ. මෙම බෙල්ජියම් සමාගම් සංචාරක ව්‍යාපාරය, නිශ්චල දේපල, අගය එකතු කළ තේ, කොකෝවා නිෂ්පාදන, ස්වර්ණාභරණ, කෘෂිකර්මාන්තය, තොරතුරු තාක්ෂණය, යටිතල පහසුකම්, සංචාරක ව්‍යාපාරය, රූපලාවන්‍ය ද්‍රව්‍ය, රෙදිපිළි හා ඇඟලුම් යන අංශ වලින් සමන්විත විය.

15. “එක්ස්පෝ 2012” ප්‍රදර්ශනය හා සමගාමීව රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබූ පරිදි ඉතාලියේ ව්‍යාපාරික දූත පිරිසක් 2012 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියහ. මෙම දූත පිරිස රෙදිපිළි/ ඇඟලුම් හා සංචාරක ව්‍යාපාරය වැනි අංශ පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වූහ.

**2 වන ආංශික කණ්ඩායමේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**

(අ) විශේෂයෙන්ම ජර්මනිය, ජපානය, කොරියාව හා යුරෝපීය ප්‍රජාවට අයත් රටවලින් පැමිණ දැනටමත් මෙරට ආයෝජන කටයුතුවල නිරත වන ආයෝජකයන් සමග පහසුකම් සැපයීම පිළිබඳ රැස්වීම් පැවැත්වීම 2වන ආංශික කණ්ඩායමේ නිලධාරීන් විසින් සමායෝජනය කරනු ලැබීය. අදාළ විදේශීය දූත මණ්ඩල (ජර්මානු තානාපති කාර්යාලය, ජපාන තානාපති කාර්යාලය, ජපාන විදේශ වෙළඳ සංවිධානය හා යුරෝපීය වාණිජ මණ්ඩලය) සමඟ සමීප සහයෝගිතාවෙන් මෙම සංසදය සංවිධානය කරනු ලැබීය.

(ආ) ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ විෂය පථය යටතේ පවතින ශ්‍රී ලංකාව/ප්‍රංශය, ඉතාලිය/ බ්‍රිතාන්‍ය සමග ව්‍යාපාරික කටයුතු සඳහා වූ ශ්‍රී ලංකා කවුන්සලය , බෙනෙලක්ස් / ශ්‍රී ලංකාව , චීනය/ ශ්‍රී ලංකාව , ජපානය/ ශ්‍රී ලංකාව ,කොරියාව/ ශ්‍රී ලංකාව යන ව්‍යාපාරික කවුන්සිල සමග පැවති රැස්වීම්වලට II වන ආංශික කණ්ඩායම ක්‍රමවත්ව සහභාගී විය.

(ඇ) “එක්ස්පෝ 2012” ප්‍රදර්ශනය සංවිධානය කිරීමේ දී, II වන ආංශික කණ්ඩායම එම කටයුතු සඳහා සහභාගී විය. එමෙන්ම II වන ආංශික කණ්ඩායම ව්‍යාපාරික සංසදයේ සංවිධාන කමිටුවේ ප්‍රධාන සාමාජිකයෙකු ද වේ. මෙම ව්‍යාපාරික සංසදයේ දී දේශීයව “ඔමෙගා ලයින්” ලෙස දේශීයව හැඳින්වෙන ඉතාලියේ කැල්සිඩෝනියාවේ සභාපති වන ආචාර්ය සැන්ඩ්‍රෝ වෙරොනෙසි මහතා විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරාධනය පරිදි කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබීය.

## 3 වන ආංශික කණ්ඩායම

2012 වසර තුළදී අපනයන හා දේශීය යන වෙළඳපොළ දෙවර්ගය සඳහා සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන සැකසීම පිළිබඳ යෝජනාවලට හා අපනයන වෙළඳපොළ හා අන්තරාල වෙළඳාම සඳහා සේවා සැපයීම සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබීය. ආයෝජනය හා පහත දක්වා ඇති නීති/රෙගුලාසිවල සඳහන් කර ඇති වෙනත් මෙහෙයුම් නිර්ණායක පාදක කර ගනිමින් නව්‍ය ව්‍යාපෘති හා දැනට පවතින ව්‍යාපෘති පුළුල් කිරීම යන දෙවර්ගය ම සඳහා අනුමැතිය ලබා දෙනු ලැබීය.

I. දේශීය ආදායම් පනත
II. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත
III. ක්‍රියාකාරී මධ්‍යස්ථාන මෙහෙයුම් වලට අදාළ වන මූල්‍ය පනත

ඒ අනුව අවම වශයෙන් රු. මිලියන 50ක් සහිත ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳ ව සලකා බලනු ලැබීය. කෙසේ වුවද, ක්‍රියාකාරී මධ්‍යස්ථාන හා සම්බන්ධ ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා අවසාන මාර්ගෝපදේශ හා රෙගුලාසි පිළිබඳව මෙතෙක් අවසන් තීරණයක් ගෙන නොමැත.

3වන අංශයේ සමස්ත කාර්යසාධනය පහත දක්වා ඇති පරිදි සාරාංශ ගත කර ඇත.

අංශයෙහි ක්‍රියාත්මක අදියර

| කාර්ය තත්ත්වය | ඇඟලුම් | ප්‍රාදේශීය හා සේවා | නිෂ්පාදන | අංශයේ මුළු ගණන | ශ්‍රී.ල.ආ.ම මුළු ව්‍යාපෘති ගණන | අංශයේ කාර්ය තත්වය |
|---|---|---|---|---|---|---|
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 02 | 04 | 19 | 23 | 59 | 39% |
| අනුමත කර ගිවිසුම් අත්සන් කිරීමට නියමිත ව්‍යාපෘති | 06 | 03 | 51 | 60 | 177 | 34% |
| ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති | 05 | 24 | 42 | 71 | 126 | 56% |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති | 02 | 27 | 29 | 58 | 99 | 59% |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | 465 * | 228 | 382 | 1075 * | 1733 * | 62% |
| එකතුව | **480** | **286** | **523** | **1287** | **2194** | **59% **** |

* ඇඟළුම් කම්හල් 200 යටතේ මෙහෙයවනු ලබන ව්‍යාපෘති 148ක් ඇතුළත්ව

** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 59% ක් (1287) සඳහා 3 වන අංශය මගින් දායකත්වය සපයයි.

### 3 වන අංශයේ කාර්යසාධනය

| මුළු අපනයන (ඇ.ඩො.මි. වලින්) | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | ජාතික | | ශ්‍රී.ලං.ආ.ම.වටිනාකම % | ජාතික වටිනාකමෙන් ප්‍රතිශතයක් ලෙස ශ්‍රී. ලං. ආ. ම. | ජාතික වටිනාකමින් (කාර්මික) ප්‍රතිශතයක් ලෙස ශ්‍රී. ලං. ආ. ම. |
| | මුළු වටිනාකම | කාර්මික වටිනාකම | | | |
| 2001 | 4,817 | 3,712 | 3,083 | 64% | 83% |
| 2002 | 4,699 | 3,634 | 3,123 | 66% | 86% |
| 2003 | 5,133 | 3,977 | 3,492 | 68% | 88% |
| 2004 | 5,757 | 4,518 | 3,858 | 67% | 85% |
| 2005 | 6,347 | 4,952 | 4,355 | 69% | 88% |
| 2006 | 6,883 | 5,385 | 4,699 | 68% | 87% |
| 2007 | 7,640 | 5,967 | 5,170 | 68% | 87% |
| 2008 | 8,111 | 6,159 | 5,330 | 66% | 87% |
| 2009 | 7,085 | 5,305 | 4,563 | 64% | 86% |
| 2010 | 8,570 | 6,154 | 5,175 | 60% | 84% |
| 2011 | 10,559 | 7,992 | 6,572 | 62% | 82% |
| 2012 | 9,774 | 7,371 | 6125 | 63% | 83% |

විදේශීය සෘජු ආයෝජන (FDI) සඳහා ආංශික දායකත්වය (ඇ.ඩො.මි. වලින්)

| | ඇඟලුම් | ප්‍රාදේශීය හා සේවා | නිෂ්පාදන | එකතුව | ශ්‍රී.ලං.ආ.ම. යේ මුළු වි.සා.ආ. ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| වි.සෘ.ආ.(FDI) | 74.17 | 39.46 | 182.181 | 295.811 | 1146.756 |

### අංශ මත පදනම් වූ කාර්යසාධනය

1) **ඇඟළුම් අංශය**

2012 දෙසැම්බර් මාසය අවසානයේ දී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 465ක් පමණ විය. දිවයිනේ ප්‍රධාන අපනයන ආදායම් උපයනු ලැබුවේ ඇඟලුම් අංශයෙනි. 2012 වර්ෂය සඳහා මුළු ජාතික අපනයනවලින් 41% ක් වූ ඇඟලුම් අපනයන ආදායම ඇ.ඩො. බිලියන 3.9ක් විය.

### 2012 වර්ෂයේ කාර්ය සාධනය

2012 වර්ෂය අවසානයේ දී ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති අයදුම්පත්‍රවල කාර්ය තත්වය පහත දක්වා ඇත.

| මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන වලින්) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශ | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | - | - | - | - | - |
| වාණිජ මෙහෙයුම් සිදුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | - | - | - | - | - |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 05 | 327.500 | 1,370.096 | 1,697.596 | 4,373 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 01 | - | 533.016 | 533.016 | 1,030 |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | - | - | - | - | - |
| එකතුව | **06** | **327.500** | **1903.112** | **2,230.612** | **5,403** |

**උතුරු හා නැගෙනහිර පළාත්වල පුළුල් කිරීම්**

"නැගෙනහිර නවෝදය" හා "උතුරු වසන්තය" වැඩසටහන් යටතේ උතුරු හා නැගෙනහිර පළාත්වල ආයෝජන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පියවර ගෙන තිබේ. 2011/ 2012 වසර වලදී අතිරේක ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දක්වා ඇත. කර්මාන්තශාලා ඉදිකිරීමේ අදියරේ පවතී.

| සමාගමේ නම | අතිරේක ගිවිසුම් | ආයෝජනය (ඇ.ඩො.මිලියන වලින්) | සේවා නියුක්තිය (සංඛ්‍යාත්මකව) | පිහිටීම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| බ්‍රැන්ඩික්ස් ඇපරල්ස් ලිමිටඩ් | 31/03/2011 | 9.00 | 600 | මඩකලපුව | ක්‍රියාත්මක වෙමින් පවතී |
| මාස් ඇක්ටිව් (පුද්) සමාගම | 21/07/2011 | 3.00 | 500 | කිලිනොච්චිය | -එම - |
| ෆර්ගසම් ගාර්මන්ට් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | 15/09/2011 | 2.30 | 500 | මන්නාරම | - එම - |
| ටයිමෙක්ස් ගාර්මන්ට්ස් ලිමිටඩ් | 15/09/2011 | 2.30 | 500 | මන්නාරම | -එම - |
| ඔමෙගාලයින් (පුද්) සමාගම | 30/03/2011 | 20.00 | 990 | වවුනියාව | -එම - |
| යුනිවෙලා (පුද්) සමාගම | 12/01/2012 | 4.9 | 600 | කිලිනොච්චිය | -එම - |
| එකතුව | | **41.5** | **3690** | | |

2) **ප්‍රාදේශීය වැඩසටහන් හා අපනයන සේවා අංශය**

| මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | - | - | - | - | - |
| වාණිජ මෙහෙයුම් අපේක්ෂිත ව්‍යාපෘති | - | - | - | - | - |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 01 | 5,368.00 | 8.540 | 5,376.540 | 136 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 03 | 1,036.71 | 3,907.200 | 4,943.907 | 300 |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 04 | 9,940.60 | 1,898.250 | 11,838.850 | 374 |
| එකතුව | **08** | **16,345.31** | **5,813.990** | **22,159.297** | **810** |

පහත දැක්වෙන උප අංශ යටතේ අනුමත කරනු ලැබූ ව්‍යාපෘතිවලින් මෙම අංශය සමන්විත වේ.

I. අපනයන පාදක සේවා
II. ප්‍රාදේශීය වැඩසටහන් (ව්‍යවසාය වැඩසටහන් 300 හා උතුරු හා නැගෙනහිර සංවර්ධන වැඩසටහන්)
III. ක්‍රියාකාරී මධ්‍යස්ථාන මෙහෙයුම් සඳහා වන ව්‍යාපෘති

2012 වර්ෂයේ විදේශ සෘජු ආයෝජන සඳහා වූ ආංශික ඉලක්කය ඇමරිකානු ඩොලර් මිලියන 34.54කි. උපලබ්ධි වූ විදේශ සෘජු ආයෝජන වටිනාකම ඇ.ඩො.මි. 39.88කි. 2012 වර්ෂයේ දී අංශයේ සියලුම ව්‍යාපෘති සඳහා සත්‍ය ආයෝජනය රු. මිලියන 57,367 ක් පමණ විය.

**අපනයන සේවා හා ප්‍රාදේශීය වැඩසටහන්**

ප්‍රාදේශීය මෙහෙයුම් මූලස්ථාන, කළමනාකරණ උපදේශන, මුහුදු නැව් බඩු සේවා, මුද්‍රණ හා ප්‍රකාශන සේවා, නාවික සේවා, මෝටර් රථ සේවා හා වෙනත් සේවා ආදී වශයෙන් අපනයන සේවා යටතේ අනුමත කරනු ලැබූ කර්මාන්ත ප්‍රභේද යටතේ මෙහෙයවනු ලබන ව්‍යාපෘති 60ක් පමණ තිබේ.

2012 දෙසැම්බර් 31 වනදා වන විට ව්‍යවසාය වැඩසටහන් 300 යටතේ බල පැවැත්වෙන අනුමැති සංඛ්‍යාව 205ක් විය. සමාගම් 162ක් ක්‍රියාකාරීව පවතී. ව්‍යවසාය වැඩසටහන් 300 ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව 2012 මාර්තු 31 වනදා වන විට අවසන් විය.

2012 දෙසැම්බර් 31 වනදා වන විට උතුරු හා නැගෙනහිර සංවර්ධන වැඩසටහන යටතේ බල පැවැත්වෙන ව්‍යාපෘති අනුමැතිවල එකතුව 30ක් විය. මේ සඳහා තක්සේරු කරන ලද ආයෝජන ප්‍රමාණය රු. මිලියන 8280.24ක් වූ අතර රැකියා උත්පාදනය 4378ක් විය (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව 02, වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව - 12, දැනට මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ව්‍යාපෘති සංඛ්‍යාව - 16කි).

**ක්‍රියාකාරී මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු සඳහා වන ව්‍යාපෘති**

මූල්‍ය පනත යටතේ හඳුන්වා දී ඇති මෙහෙයුම් නිර්ණායක පාදක කර ගෙන පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී මධ්‍යස්ථානවල පහත සඳහන් ක්‍රියාකාරකම් පිළිබඳ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබේ.

I. ආනයනය කිරීම, සුළු පිරිසැකසුම් කටයුතු කිරීම හා නැවත අපනයනය කිරීමේ නියැළෙන අන්තරාල වෙළඳ කටයුතු
II. ශ්‍රී ලංකාවට භාණ්ඩ රැගෙන ඒමකින් තොරව වෙනත් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කළ හැකි ප්‍රති නැව්ගත කිරීමේ ව්‍යාපාරය .
III. විදේශ නිෂ්පාදකයන්ට ගනුදෙනුව ආරම්භයේදීම මුදල් ගෙවීමේ සේවා සැපයීම.
IV. මූල්‍ය කළමනාකරණ සැපයුම් දාමය හා බිල්පත් කටයුතු සඳහා ගනුදෙනුකරුවන් පෙරමුණ ගැනීම පිළිබඳ කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු
V. ශ්‍රී ලංකාව තුළ බහු-රාජ්‍ය ඒකාබද්ධවීම් වැනි සැපයුම් සේවා සැපයීම.

මිරිජ්ජවිල කලාපයේ ව්‍යාපාර සමග නිෂ්පාදන හා ආනයන අපනයන මධ්‍යස්ථානවල වෙළඳ කටයුතු හා අපනයන සේවා සඳහා ව්‍යාපෘති යෝජනා 05ක් අනුමත කර තිබේ.

## 3) නිෂ්පාදන අංශය

| මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | - | - | - | - | - |
| වාණිජ මෙහෙයුම් අපේක්ෂිත ව්‍යාපෘති | 18 | 9,116.520 | 7,809.840 | 16,926.360 | 3,094 |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 11 | 16,040.580 | 11,654.898 | 27,695.478 | 859 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 14 | 6,612.940 | 5,948.678 | 12,561.618 | 2,123 |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 19 | 33,943.670 | 3,034.956 | 36,978.626 | 2,522 |
| එකතුව | **62** | **65,713.710** | **28,448.372** | **94,162.082** | **8,598** |



දඹුර් ලංකා (පෞද්) සමාගම –
යකදාගල වතුයාය,
කොටදෙණියාව





2012 වර්ෂයේදී රු. බිලියන 94.20ක සුවිශාල ආයෝජනයක් සහිත ව්‍යාපෘති යෝජනා හැට දෙකක් (62) ලැබුණු අතර ඉන් රු. බිලියන 65.70ක ප්‍රමාණයක් විදේශීය මූලාශ්‍රයන්ගෙන් වන අතර 8598ක රැකියා ප්‍රමාණයක් උත්පාදනය කිරීමට අපේක්ෂිතය. මෙම වර්ෂය තුළ ව්‍යාපෘති 17ක් වාණිජ කටයුතු ආරම්භ කරන ලදී.

2012 වර්ෂයේදී හම්බන්තොට වරාය සංකීර්ණයෙහි ක්‍රියාත්මක වීමට නියමිත වූ සුවිශාල ආයෝජනයන්ගෙන් සමන්විත ඇතැම් මහා පරිමාණ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදී ඇත. සී/ස ලංකා සීනි පිරිපහදු කිරීමේ (පෞද්) සමාගම යනු ඇමරිකානු ඩොලර් මිලියන 220 ක සුවිශාල ආයෝජනයකින් යුත් සම්පූර්ණයෙන්ම ඉන්දියානු හිමිකාරීත්වය සහිත සමාගමකි. හම්බන පෙට්‍රෝ කෙමිකල්ස් සමාගමද පොලිමර් රේසිං නිෂ්පාදනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 141.19ක ආයෝජනයකින් යුතුවන ඉන්දියානු හිමිකාරීත්වය සහිත සමාගමකි.

සී/ස ටෝකියෝ නැගෙනහිර සිමෙන්ති සමාගම විසින්ද ඇමරිකානු ඩොලර් මිලියන 63.12ක ආයෝජනයක් සමඟ සිමෙන්ති නිෂ්පාදනය කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම සඳහා ආනයන ප්‍රතිස්ථාපන බාණ්ඩය යටතේ ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. පාවහන් නිෂ්පාදනයේදී කොටස් සපයනු ලබන සහ ඇමරිකා එක්සත් ජනපදය (NIKE ආයතනය) සමඟ එක්ව පාවහන් කර්මාන්තය සඳහා සේවා සැපයීම සිදුකරනු ලබන මාස් ෆැබ්රික් උද්‍යානයෙහි ඇමරිකානු ඩොලර් මිලියන 78.5ක ආයෝජනයක් සිදුකොට ඇත.

2012 වර්ෂය සඳහා අපේක්ෂිත වූ මුළු FDI ඉලක්කය ඇමරිකානු ඩොලර් මිලියන172.62ක් වූ අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 182.181ක ප්‍රමාණයක් අත්පත් කරගන්නා ලදී. 2011 වර්ෂය සමඟ සැසඳීමේදී මෙය 52.27%ක වර්ධනයක් විය.

## ආයෝජක සේවා දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන වගන්තිය/කොටස යටතේ අනුමත ව්‍යාපාර වල ආනයන/ අපනයන සඳහා අවසර ලබාදීම මෙන්ම, පහත දක්වා ඇති ආයෝජක හා සම්බන්ධ කටයුතු ලබාදීම සඳහාත් ආයෝජක සේවා දෙපාර්තමේන්තුව වගකීම් දරනු ලැබේ.

* ආනයන/ අපනයන භාණ්ඩ තොග භෞතිකව පරීක්ෂාවට ලක් කිරීම
* උප-කොන්ත්‍රාත්තු, හුවමාරු, ප්‍රති-ආනයන සහ ප්‍රති-අපනයන මෙහෙයවීම
* ඇඟලුම් අපනයනයෙහිදී යුරෝපා හවුලේ රටවලට ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම
* ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වල ආනයන සහ අපනයන සම්බන්ධයෙන් සංඛ්‍යාන දත්ත සකස් කිරීම
* ආනයන සහ අපනයන සම්බන්ධ රජයේ බදු එකතු කිරීම
* විදේශිකයන් සඳහා මෙතෙර වීසා (expatriate visa) නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබාදීම (කලාපයන්හි ව්‍යාපාර සම්බන්ධයෙනි)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් විසින් ආනයනය සහ අපනයනය සම්බන්ධ රේගු ප්‍රකාශන (CUSDECs) ලිපි ලේඛන කටයුතු වල අනුමත කිරීම් සිදුකරනු ලබන මධ්‍යස්ථාන පහක් මෙම දෙපාර්තමේන්තුව යටතේ කොළඹ, කටුනායක, බියගම, කොග්ගල සහ පල්ලේකැලේ යන ස්ථානයන්හි ස්ථාපිත කොට ඇත. කෙසේ නමුදු, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කර්මාන්තවල භාණ්ඩ ආනයන හා අපනයන භෞතිකව පරීක්ෂාවට ලක් කෙරෙන සහතික කිරීමේ මධ්‍යස්ථාන 12ක් දිවයින පුරා ස්ථාපිත කොට ඇත.


ශ්‍රී ලංකා රේගුවෙහි සහාය ඇතිව ආයෝජක සේවා දෙපාර්තමේන්තුව විසින් වෙබ් පාදක කොටගත් ASYCUDA WORLD නැමති රේගු පරිගණක පද්ධතියේ නව වෙළුම 2012දී සියළුම ලේඛනගත කිරීම් සහ සහතික කරගැනීමේ මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරන ලදී. ASYCUDA WORLD පරිගනක පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, DTI පහසුකම හරහා ඉලෙක්ට්‍රොනික ආකාරයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත සියළු ආනයන සහ අපනයනයන්හි රේගු ප්‍රකාශන (CUSDECs) ලබා දීමෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර විසින් නැව්ගත කිරීම් සිදුකරන ලදී. එයට අමතරව, ආනයන අපනයන මෙහෙයුම් පද්ධතිය (IEMS) යටතේ පෙර-ගෙවුම් ගිණුමක් හරහා ස්වයංක්‍රියව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවා ගාස්තු ගෙවීමට කටයුතු සම්පාදනය කොට ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි සේවා ගාස්තු නිසි කළට ගෙවීම සඳහා ආයෝජකයින් වෙත ඊ-ගෙවීම් (විද්‍යුත් ගෙවීම්) පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මුදල් දෙපාර්තමේන්තුව මගින් සිදුකරමින් පවතී.

ආනයන සහ අපනයන වල වටිනාකම (රු. මිලියන)





| ස්වරූපය | 2011 | 2012 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 486,495.00 | 558,306.66 | 71,811.66 | 12.86 |
| අපනයන | 711,558.00 | 761,111.06 | 49,553.06 | 6.51 |

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත සඳහා මෙහෙය වූ බහාලුම් ප්‍රමාණය.
(ආනයන/ අපනයන)





| ස්වරූපය | 2011 | 2012 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 58829 | 69533 | 10704 | 15.39 |
| අපනයන | 75678 | 90826 | 15148 | 16.68 |

රජය සඳහා ආදායම් - බදු




| ස්වරූපය | 2011 | 2011 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආදායම | 9,528.00 | 10,004.14 | 476.14 | 4.76 |

පිරිසැකසූ රේගු ප්‍රකාශන සංඛ්‍යාව




| ස්වරූපය | 2010 | 2011 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 167163 | 193481 | 26318 | 13.60 |
| අපනයන | 289187 | 328950 | 39763 | 12.09 |

## නෛතික සහාය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි නීති දෙපාර්තමේන්තුව විසින් ආයෝජන මණ්ඩලයට මෙන්ම ආයෝජකයන් වෙත වෘත්තීය උපදෙස්/සේවා සැපයීම සඳහා වගකීම් දරයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන වගන්තිය යටතේත්, 2008 අංක 14 දරණ (සංශෝධිත) උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේත් අනුමත ව්‍යාපෘති සඳහා වන ආයෝජන සහ ආයෝජන ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම සඳහා අදාල වන නෛතික පද්ධතිය/ ව්‍යුහය පිළිබඳ ආයෝජක පාදක සේවා සැපයීම එහි විෂය පථය ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එදිරිව/ විරුද්ධව ආයතනික නඩු පැවරීම් වල සංස්ථාපිත නෛතික කටයුතු වලට අදාල එහි ක්‍රියාකාරීත්වයට සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වගකීම් දරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 17වන වගන්තියෙන් ප්‍රතිපාදිත තත්ත්වයෙන් සහ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන ව්‍යාපෘති ස්ථාපිත කිරීමට අදාල වන ශ්‍රී ලංකාවේ නෛතික බලසීමාව පිළිබඳ තොරතුරු රැස්කිරීම ඇතුළත් වන ආයෝජක පහසුකම් සලසන නෛතික සේවාවන් උපදේශාත්මක ස්වරූපයේ පවතී.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකාවේ නව ව්‍යාපාරික ආයතන ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුම් 126ක් සඳහා කොන්ත්‍රාත්තු වලට එළැඹෙන ලදී. මෙයට 2008 අංක 14 දරණ සංශෝධිත උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන ව්‍යාපෘති 05ක් ඇතුළත් වේ. එකී ව්‍යාපෘති 05 වන්නේ -

1. ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම
2. වෙල්කම් හොටෙල්ස් (පෞද්) සමාගම
3. සිනො ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පෞද්) සමාගම
4. ක්‍රිෂ් ට්‍රාන්ස්වර්ක්ස් කලම්බු (පෞද්) සමාගම
5. යුක්ලන් ලංකා (පෞද්) සමාගම

දෙපාර්තමේන්තුව විසින්, සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාපිත කරන ලද්දාවූ ඉලක්කය අතික්‍රමණය කිරීමට/ ඉක්මවීමට සමත් වූ මෙම ගිවිසුම් 126 විශාල ජයග්‍රහනයක් ලෙස සැළකිය හැකිය. තවද, වැඩිදුර ආයෝජන පවත්නා ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර විෂයපතය වෙනස් කිරීම හා ව්‍යාපෘති ප්‍රතිස්ථාපිත කිරීම, පාඩු ලබන ආයතන අත්පත් කර ගැනීම සහ ප්‍රති-සංවිධාන කිරීමට අදාලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පවත්නා ව්‍යාපෘති සම්බන්ධයෙන් අතිරේක ගිවිසුම් 287කට එළැඹෙන ලදී.

උක්ත ඒවාට අමතරව, නීති අංශය විසින් සිය කර්මාන්ත ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආයෝජකයන් වෙත තමන් විසින් හිමිකම් දරණ ඉඩම් ලබා දීම මගින් ආයෝජකයන්ට අදාල සේවා ව්‍යාප්ත කිරීමෙහි නියැලී සිටී.

## තාක්ෂණික සේවා දෙපාර්තමේන්තුව

(1) තාක්ෂණික සේවා දෙපාර්තමේන්තුව පහත සඳහන් කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් වගකීම් දරණු ලැබේ.

(i) නව ආයෝජන කලාප/ ව්‍යාපෘති සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීම

(ii) නව ආයෝජන කලාප සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

(iii) නව ආයෝජන කලාප වල මූලික සංවර්ධන කටයුතු භාර ගැනීම, මූලික කටයුතු සඳහා කලාප ඒකක ස්ථාපිත කිරීම සහ කලාප මෙහෙයවීම, කළමනාකරණය කිරීම සඳහා අනෙක් කලාපයන්හි සිදු කළ ආකාරයට බලතල ලබාදීම යටතේ අදාල කලාප අධ්‍යක්ෂවරු වෙත කටයුතු භාරදීම.

(iv) ඉල්ලීම් කරන ආකාරයට සහ අවශ්‍ය වන විට පවත්නා අපනයන සැකසුම් කලාප 12 මගින් සිදු කෙරෙන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(v) පවත්නා ආයෝජන කලාප 12හි ජල සැපයුම, ජලය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා අවැසි තාක්ෂණික සහාය සැළසීම

(vi) උසස් අධ්‍යාපන ආයතන, වාණිජ සංකීර්ණ ආදී විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා සහාය සහ තාක්ෂණික යෙදවුම් සැපයීම

(vii) ඉඩම් කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම


(viii) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සමස්ථයක් ලෙස ක්‍රියාකාරී සැලසුම් පාලනය කිරීම

(2) කටුනායක, බියගම, කොග්ගල, මහනුවර, සීතාවක, මීරිගම, මල්වත්ත, වතුපිටිවල, හොරණ, පොල්ගහවෙල. මාවතගම සහ මිරිජ්ජවිල යන ස්ථානයන්හි වර්තමානයේ ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප (EPZZ) 12ක් පවතී.

2010 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි, අනෙකුත් රටවල් වල අන්තර්ජාතික කලාප ලෙස සලකුණු කිරීමට ආදර්ශ කාර්මික කලාප ලෙස ආයෝජන මණ්ඩලයේ පවත්නා අපනයන සැකසුම් කලාප ඉහල නැංවීම සිදුකෙරෙමින් පවත්නා අතර 2012 වර්ෂයේදී ඒ හා සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩි දියුණු කිරීම් සඳහා රු. මිලියන 707ක මුළු මුදලක් වැය විය.

2012 වර්ෂය තුළ, සාම්පූර්, මිරිජ්ජවිල, සූරියවැව, මුලතිවු සහ හොරණ, වගවත්තේ නව ආයෝජන කලාපයන් ස්ථාපිත කිරීමට අදාලව සිදුකරන ලද මූලික කටයුතු සඳහා තාක්ෂණික සේවා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල දෙපාර්තමේන්තු එක්ව කටයුතු කරන ලදී.

## අපනයන සැකසුම් කලාප/IP/EPP




2012 දෙසැම්බර් 31 වන විට පැවති අපනයන සැකසුම් කලාප පිළිබඳ විස්තරය

| | KEPZ | BEPZ | KgEPZ | KIP | MwEPZ | PEPZ | MEPZ | HEPZ | SEPZ | MirjEPZ | WEPZ | MalEPP |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ සිට ඇති දුර (කි.මී) | 31 | 24 | 131 | 135 | 106 | 77 | 65 | 54 | 47 | 234 | 42 | 32 |
| ස්ථාපිත කළ වර්ෂය | 1978 | 1985 | 1991 | 1995 | 2000 | 2000 | 1998 | 1999 | 1999 | 1999 | 1998 | 1998 |
| භූමි ප්‍රමාණය | Total – 528.93 කාර්මික - 288.59 | 450 A | 227 A | 201 A | 53.15 A | 50 A | 260 A | 381 A | 431 A | 54 A | 123 A | 32 A |
| ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව | 90 | 59 | 22 | 21 | 07 | 05 | 18 | 13 | 30 | 03 | 17 | 05 |
| රැකියා අවස්ථා | 39,397 | 21862 | 12443 | 6931 | 5200 | 3788 | 2650 | L – 1727 F – 24 | 20,729 | 1463 | 8677 | 2540 |

**KEPZ** = කටුනායක අපනයන සැකසුම් කලාපය

**BEPZ** = බියගම අපනයන සැකසුම් කලාපය

**KgEPZ** = කොග්ගල අපනයන සැකසුම් කලාපය

**KIP** = මහනුවර කාර්මික උද්‍යානය

**MwEPZ** = මාවතගම අපනයන සැකසුම් කලාපය

**PEPZ** = පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය

**MEPZ** = මීරිගම අපනයන සැකසුම් කලාපය

**HEPZ** = හොරණ අපනයන සැකසුම් කලාපය

**SEPZ** = සීතාවක අපනයන සැකසුම් කලාපය

**MirjEPZ** = මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය

**WEPZ** = වතුපිටිවල අපනයන සැකසුම් කලාපය

**MalEPP** = මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය

## පරිසර කළමනාකරණය

**දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන්හි සාරාංශය පහත පරිදි වේ.**

* මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමඟ එක්ව, ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන කොටස යටතේ ක්‍රියාකාරී වන ව්‍යාපෘති වලට පාරිසරික අවසරය ලබාදීම.

  ජාතික පාරිසරික (ව්‍යාපෘතීන් හි අනුමැතිය සඳහා පටිපාටිය) රෙගුලාසි ප්‍රකාරව, පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය (EIA) අවශ්‍ය වන ව්‍යාපෘති වලට, ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන බලපෑම් ඇගයීමේ සැසි වලට සහභාගී වීම සහ එමඟින් අනුමත කිරීමේ පටිපාටිය සඳහා පහසුකම් සැළසීමට සහය වීම.

  තවද, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය (PAA) ලෙස පත්කොට ඇත.

* මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමඟ එකඟව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) නිකුත් කරයි.

* සන්නිවේදන කුළුණු එසවීම සඳහා යෝජිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සන්නිවේදන නියාමන කොමිෂන් සභාව වෙත (TRC) පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීම.

* ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වලට අදාල පරිසර දූෂණයට සම්බන්ධ පැමිණිලි වලට අදාලව සිදුකරණ පරීක්ෂණ සහ අවශ්‍ය දූෂණ පාලන පියවර ගැනීම සහතික කිරීම මගින් ඒවා විසඳීම සිදුකෙරේ.

* අපනයන සැකසුම් කලාපයන්හි කාර්මික අපද්‍රව්‍ය බැහැරලීම මෙහෙයවීම

  උක්ත කටයුතු වල සාරාංශයක් පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| 1.(අ) ව්‍යාපෘති සඳහා ලබාදුන් පරිසර බලපත්‍ර සංඛ්‍යාව<br>(ආ) ව්‍යාපෘතීන් ප්‍රතිස්ථාපනය/පුළුල් කිරීම කිරීම සඳහා ලබාදුන් පරිසර බලපත්‍ර සංඛ්‍යාව | 69<br>17 |
| 2. නිකුත් කළ/ නව්‍යකරණය කළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සංඛ්‍යාව | *695 |
| 3. සන්නිවේදන කුළුණු නැංවීම සඳහා යෝජිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නිකුත් කළ පාරිසරික නිර්දේශ (ERR) ප්‍රමාණය. | **363 |
| 4. සොයා බලන ලද පැමිණිලි සංඛ්‍යාව | 32 |
| 5. පාරිසරික මෙහෙයුම්<br>(අ) කර්මාන්ත වලින් රැස්කළ අප ජලනියැදි සංඛ්‍යාව.<br>(ආ) සාමාන්‍ය අපවහන ජල පිරිපහදු යන්ත්‍රාගාර වලින් රැස් කළ අප ජල නියැදි සංඛ්‍යාව.<br>(ඇ) ජල නියැදි සංඛ්‍යාව | 1032 (අ, ආ)<br>111 |

* EPL ගාස්තු වලින් ඉපැයූ රු. 52,12,500.00
** ER ගාස්තු වලින් ඉපැයූ රු.72,60,000.00
මුළු ඉපැයුම් = රු.124,72,500.00

* උක්ත කරුණට අමතරව, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති අන්තර්ජාතික සම්මුතීන් (පරිසරයට අදාල) වලට අනුගත වෙමින් ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සහතික කරන ලදී. මෙම සම්මුතීන් වනුයේ හානිකර අපද්‍රව්‍ය , දේශසීමාවන් හරහා ගෙනයාම පිළිබඳ බ්‍රසල්ස් සම්මුතිය, ඕසෝන් ස්ථරය ක්ෂය කරන ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය/ සම්මුතිය, නොදිරන චේන්ද්‍රිය අපකාරක පිළිබඳ ස්ටොක්හෝම්

සම්මුතිය, රසායනික අවි සම්මුතිය සහ අන්තරායකර ඖෂධ සහ මානසික ව්‍යාකූලත්වය ඇති කරන ද්‍රව්‍ය නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි සම්මුතිය යන ඒවාය.

**සාක්ෂාත් කරගැනීම් (ජයග්‍රහන)**

* පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සහ පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීමේ ක්‍රියා මගින් රු. මිලියන 12.5කට ආසන්න මුදලක් උපයන ලදී.

* 1990 අංක 12 දරණ පළාත් පාරිසරික ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදිත පටිපාටිය අනුව පාරිසරික බලපෑම් ඇගයීම (EIA) අනුගමනය කිරීම මගින් පළාත් පාරිසරික අධිකාරිය (PEA)/වයඹ පළාත (NWP) මගින් පුත්තලමෙහි යෝජිත ආයෝජන ප්‍රවර්ධන කලාපය ස්ථාපිත කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබාගන්නා ලදී.

* ISO 9001:2008 තත්ත්ව සහතිකය මත පදනම් වූ ප්‍රමිති කළමනාකරණ පද්ධතිය යටතේ වර්ෂ 2012 සඳහා ස්ථාපිත කරන ලද ඉලක්කය සාක්ෂාත් කරගන්නා ලදී. මේ යටතේ, ස්ථාපිත ඉලක්කය මගින් ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වලින් 90%ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) ලබාගැනීම සහතික කළ යුතු විය. සාක්ෂාත් කරගන්නා ලද ඉලක්කය 91.8%ක් විය.

## ඉංජිනේරුමය අනුමත කිරීම් සහ විශේෂ ව්‍යාපෘති

**දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය/ භූමිකාව**

ඉංජිනේරුමය අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව අංශ දෙකක් ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතෙහි 17 වන වගන්තියට අයත් ව්‍යාපෘතීන් සඳහා මූලික සේවා දෙකක් සපයනු ලැබේ. එකී කොටස් දෙක වන්නේ ;

1. ඉංජිනේරුමය අනුමත කිරීමේ අංශය/ කොටස
2. ඉඩම් හා පහසුකම් සපයන අංශය

**1. ඉංජිනේරුමය අනුමත කිරීමේ අංශය**

1. අ) ඉංජිනේරුමය අනුමත කිරීමේ අංශයේ කාර්යභාරය

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තියට අයත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ ඉදිකිරීම් අදියර අතරතුර, මූලික සේවා හතරක් (4) සැපයීම සිදු කෙරේ.

අ) ස්ථානීය අනුමත කිරීම්
ආ) සැලසුම් අනුමත කිරීම
ඇ) ප්‍රමාණය සහතික කිරීම
ඈ) අනුකූලතා සහතික නිකුත් කිරීම

* **ස්ථානීය අනුමත කිරීම්**

ගිවිසුම අත්සන් කිරීමට පෙර, අදාල ස්ථානයෙහි නව ක්‍රියාකාරකම ස්ථාපිත කිරීම සඳහා ඇති යෝග්‍යතාව සහ එම ව්‍යාපෘතිය හේතුවෙන් ඇතිවන පාරිසරික බලපෑම් තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා සෑම යෝජිත ක්ෂේත්‍රයකටම පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ යනු ලැබේ. ඒවායේ අනුගතභාවය ස්ථාපිත වූ කල්හි, 17 වන වගන්තියේ දක්වනු ලබන ගිවිසුම් අත්සන් කිරීම පිණිස ආයෝජන මණ්ඩලයෙහි නීති පෙදපාර්තමේන්තුවට හැකිවනු පිණිස ක්ෂේත්‍ර අනුමත කිරීමේ ලිපිය නිකුත් කරනු ලැබේ.

*** ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම්**

අදාල රෙගුලාසි මගින් අපේක්ෂිත සියළු ප්‍රමිතීන් යෝග්‍ය ගොඩනැගිලි වල සැලසුම් මගින් සපුරා ඇති විට ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම නිකුත් කරනු ලැබේ. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම ලබාදුන් පසුව ආයෝජකයන්ට ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හැකිය.

*** ඉදිකිරීම් අයිතම ආනයනය කිරීම සඳහා ප්‍රමාණන සහතික**

17 වන වගන්තියේ ව්‍යාපෘති වලට තීරු බදු රහිතව ඇතැම් ඉදිකිරීම් අයිතම සහ ද්‍රව්‍ය ආනයනය කළ හැකිය. එබඳු අයිතම/ ද්‍රව්‍ය ආනයනය කරනු ලබන සෑම විටම පෙර ආනයන සහ සමස්ත අවශ්‍යතාව සමඟ වර්තමාන භාරදුන් බඩු වල තත්ත්වය පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල ප්‍රමාණය සහතික කිරීම ඉංජිනේරු අනුමත කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරයයි.

*** අනුකූලතා සහතිකය**

අනුමත කරන ලද සැලසුම් අනුව ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදැයි සහතික කිරීම සඳහා ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඒවා පරීක්ෂා කිරීම ඉංජිනේරු අනුමත කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරයයි. අනුමත කිරීම් දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රය පරීක්ෂා කරනු ලැබේ. එහි දී බදු රහිතව ආනයනය කළ ද්‍රව්‍ය/ අමුද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කොට නිසි පරිදි පරිහරණය කොට ඇති දැයි සොයා බලයි.

1. ආ) 2012 වර්ෂය තුළ ඇතිවූ ප්‍රගතිය

2012 වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් ;

- ක්ෂේත්‍ර අනුමත කිරීම් 155ක්,
- ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම් 177ක් ලබාදෙන ලදී.
- තීරුබදු රහිත නිදහස් කර ගැනීම් 1,483ක් නිකුත් කරන ලදී. තවද
- අනුකූලතා සහතික 21ක් නිකුත් කරන ලදී.

## 2. ඉඩම් හා පහසුකම් සැපයීමේ අංශය

2. අ) ඉඩම් හා පහසුකම් සැපයීමේ අංශයේ කාර්යභාරය

- මෙම අංශය මගින් ආයෝජකයන්ට සිය ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබාගැනීම පිණිස කැමැත්තක් දක්වනු ලබන විට සහාය දීම සහ පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක වේ. තවද, ක්‍රියාත්මක කරන අතරතුරදී මතුවන ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා රජයේ ඉඩම් වල ආයෝජකයින් විසින් දැනටමත් හිමිකම් කියනු ලබන ව්‍යාපෘති වලට සහාය දීම මෙම අංශයෙහි කාර්යභාරයයි. මෙම අංශයෙහි ක්‍රියාකාරිත්වය පහත පරිදි වේ.

අ) ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සහ අපනයන සැකසුම් කලාප සඳහා ශක්‍යතාවෙන් යුත් ඉඩම් හඳුනාගැනීම.

ආ) 17 වන වගන්තිය යටතේ අනුමත ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබාගැනීමට ආයෝජකයින් යොමුකිරීම සහ පහසුකම් සැලසීම.

ඇ) අවශ්‍ය වන යටිතල සේවා පහසුකම් ලබාගැනීමට, අදාල රේඛීය රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

ඈ) 17 වන වගන්තිය යටතේ ඇති ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා පවත්නා පෞද්ගලික හා රජයේ ඉඩම් පිළිබඳ යාවත්කාල කළ තොරතුරු සමඟ ඉඩම් බැංකුවක් පවත්වාගෙන යාම.

2. (ආ) **මෙම අංශය යටතේ, 2012 වර්ෂය තුළ ඇතිකළ ප්‍රගතිය:**

- මෙම දෙපාර්තමේනතුව මගින් හසුරුවනු ලබන උතුරු සහ නැනෙහිර පළාත්වල පහත සඳහන් ව්‍යාපෘති සඳහා වන රජයේ ඉඩම් සහ ඒවා කල්බදු දීමට අනුමැතිය ලබාගැනීම කළමනාකරණය කිරීම.

i) ඔමෙගාලයින් (පෞද්) සමාගම - ඔවුන්ගේ ඇඟළුම් කර්මාන්ත ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීමේ පදනමින් වව්නියා දිස්ත්‍රික්කයේ අක්කර 22ක ඉඩමක් දීර්ඝ කාලීන කල්බදු ක්‍රමයට ලබාදීම

ii) මාස් ඇක්ටිව් (පෞද්) සමාගම - සිය ඇඟළුම් කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සඳහා දීර්ඝකාලීන කල්බදු පදනමින් කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් අක්කර 14ක ඉඩමක් ලබාදීම

iii) මාස් ඉන්ටිමේට් (පෞද්) සමාගම - සිය ඇඟළුම් කර්මාන්තශාලා ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සඳහා දීර්ඝ කාලීන කල්බදු පදනමින් කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් අක්කර 15ක ඉඩමක් ලබාදීම

- ඇඟළුම් කර්මාන්ත 50 සහ 200 වැඩසටහන් යටතේ පහත දැක්වෙන වසා දමන ලද ව්‍යාපාර ආයතන ප්‍රතිස්ථාපනය කිරීම

i) බිබිලේ, පෙර තිබූ ලංකා ගාමන්ට්ස් (පෞද්) සමාගම, ඉන්ටර් ලොක් ෆැෂන් (පෞද්) සමාගමට කල්බදු දී තිබිණි.

ii) නුවරඑළියේ, වටවල, පෙර තිබූ කිංග්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම ජේ.එස්. වටවල (පෞද්) සමාගම වෙත කල්බදු දෙන ලදී.

iii) වව්නියාවේ, පෙර තිබූ ෂෙන්ටන් ගාමන්ට්ස් (පෞද්) සමාගම හයිඩ්‍රාමනී ෆැෂන්ස් (පෞද්) සමාගම වෙත කල්බදු ලබාදෙන ලදී.

- සංචාරක කර්මාන්තය පාදක කොටගත් ක්‍රියාකාරී කලාපය මුලතිවු හි ස්ථාපිත කිරීමට යෝජිත වන මේ කටයුත්ත සඳහා යෝග්‍ය ස්ථානය හඳුනාගැනීමේ කාර්යය සිදුකෙරෙමින් පවතී.

- රයිනෝ ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම වෙත ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා වව්නියාවෙන් රජයේ ඉඩමක් ලබාදීම සඳහා පියවර ගෙන ඇත.

## කාර්මික සබඳතා

ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාර ස්ථාන තුළ ඉහලම කාර්යක්ෂමතාව හා ඵලදායීතාව සඳහා සංවර්ධක වන මනා කාර්මික සබඳතා වාතාවරණයක් පවත්වාගෙන යාමේදී ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් සිදුකරනු ලබයි. එකී ඉලක්කය සපුරාලනු වස්, කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාවන් පරිපාලනය කරනු ලැබේ:

* ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාරස්ථානයන්හි කම්කරු කළමනාකරණය සම්බන්ධීකරණය කාර්මික සාමය සහ සහයෝගීතාව සහ ඉහල ඵලදායීතාව පවත්වාගෙන යාම පිණිස ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

* අවශ්‍ය අවස්ථාවන්හි ආයෝජන මණ්ඩල ව්‍යාපාරස්ථානයන්හි කළමනාකාරිත්වයන්ට සහ සේවකයන්ට කම්කරු නීති/ රෙගුලාසි සහ කාර්මික සබඳතා පුරුදු පිළිබඳ උපදේශන සේවා හා මාර්ගෝපදේශනය සැපයීම

* අපනයන සැකසුම් කලාප රැකියා බැංකු වෙබ් අඩවි වල ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩලයේ රැකියා සේවා ඒකක හා පත්කිරීම් සහායක වැඩසටහන් සංවිධානය කිරීම හරහා ආයෝජකයන්ගේ ශ්‍රම බලකායේ අවශ්‍යතා සාක්ෂාත් කරගැනීමට සහාය වීම

2012 වර්ෂය තුළ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ප්‍රගතීන් සාක්ෂාත් කරගන්නා ලදී.

* **කම්කරු ප්‍රමිති පවත්වාගෙන යාම**

කම්කරු නීති/ රෙගුලාසි සහ ආයෝජන මණ්ඩල කම්කරු ප්‍රමිති හා වෘත්තීය සබඳතා අත්පොතෙහි සම්පාදිත කම්කරු ප්‍රමිති වලට ඇති අනුකූලතාව මෙහෙයවීම සඳහා කලාප සහ ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධිත කාර්මික සබඳතා නිලධාරීන් විසින් ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරස්ථානයන්හි කලින් කළට කම්කරු විගණන සිදු කරනු ලැබේ.

2012 වර්ෂයේදී, කලාප සහ කලාප වලින් බැහැර ආයෝජන මණ්ඩල ව්‍යාපාරස්ථාන 675ක කම්කරු විගණන සිදුකර ඇතිවා මෙන්ම උක්ත විගණනයන්හිදී සොයාගන්නා ලදුව අඩුපාඩු/ මගහැරීම් නිවැරදි කිරීම සඳහා විකල්ප පියවර ගෙන ඇත.

* **කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම**

ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමෙහි යොදාගත් ප්‍රධාන මෙවලම වනුයේ "සේවක සභා" වේ. සේවකයන් ගේ කවුන්සලයන්ය. වෘත්තීය සමිති උද්‍යෝගීමත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සිදුකරන අතරතුර කම්කරු කළමනාකරණය සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල ව්‍යාපාර වල සේවකයන් පුළුල්ව සහභාගී වීම ප්‍රවර්ධනය කිරීමේ අභිලාශයෙන් සේවක කවුන්සල වලට උපදෙස් ලැබේ.

2012 වර්ෂය තුළදී, සේවක සභා 98ක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

වෘත්තීය සමිති නිළධාරීන්ට කලාපයේ කම්කරුවන් නිදහසේ පෞද්ගලිකව හමුවීමේදී භාවිතයට ගැනීම පිණිස කටුනායක, බියගම සහ කොග්ගල අපනයන සැකසුම් කලාපයන්හි ස්ථාපිත පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන අදාල කම්කරු සබඳතා ඒකක මගින් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද, අදාල රජයේ ආයතන සමඟ සම්බන්ධව සමාජ සංවාද සාමාන්‍ය දැනුවත්භාවය, බැඩබීමේ සහයෝගය, සුහදශීලී වැඩ පුරුදු සහ සෞඛ්‍ය හා ආරක්ෂක වැනි විවිධ මාතෘකා පිළිබඳව ආයෝජන මණ්ඩලයේ ආයතනයන්හි සේවකයන් සහ කළමනාකරණ නිළධාරීන් සඳහා 2012 වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 80ක් පවත්වාගෙන ගොස් ඇත.

* **කාර්මික ගැටුම් විසඳීම/ පසිඳලීම සඳහා මැදහත් වීම/ සමගි කිරීම (බේරුම් කිරීම)**

ආයෝජන මණ්ඩලයෙහි ව්‍යාපාරයන්හි කාර්මික සාමය හා සමාදානය පවත්වාගෙන යාමේදී, ආයෝජන මණ්ඩලයෙහි ව්‍යාපාරයන්හි ඇතිවන ඕනෑම කාර්මික ගැටුමක් පසිඳලීම සඳහා කම්කරු සබඳතා නිළධාරීන් මැදහත් වේ. 2012 වර්ෂය තුළදී කම්කරු දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ සහාය ඇතිව කාර්මික ගැටුම්/ වැඩ වර්ජන 19ක් සමතයකට පත් කරන ලදී.

* **සේවක පත්වීම් උපකාරක වැඩසටහන්**

ආයෝජන මණ්ඩල ව්‍යාපාර සහ රැකියා අපේක්ෂිත තාරුණ්‍යය අතර අන්තර් සබඳතා සඳහා පහසුකම් සලසනුයේ ආයෝජන මණ්ඩලයේ රැකියා බැංකු වෙබ් අඩවියයි. (www.boijobbank.com). ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි පවත්නා රැකියා අවස්ථා පිළිබඳව මහජනතාව වෙත දැනුම්දීම සඳහා මෙම සේවාව නොමිලයේ පවත්වාගෙන යනු ලැබේ.

2012 වර්ෂය තුළදී, අපනයන සැකසුම් කලාපයන්හි රැකියා සේවා ඒකක වල රැකියා අපේක්ෂිතයින් 63,578ක් ලියාපදිංචිව සිටි අතර ඉන් 61,903ක් ස්ථාපිත කිරීම සඳහා වන බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ වලට ව්‍යාපාර ස්ථාන වලට යොමු කොට ඇත.

තවද, ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි පවත්නා රැකියා අවස්ථා සඳහා වැඩි වැඩියෙන් රැකියා අපේක්ෂිතයින් ආකර්ෂණය කර ගැනීමේ අභිලාශයෙන් යුතුව වෙනත් අදාල ආයතන සමඟ සහයෝගයෙන් රැකියා පොළ/ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංවිධානය කිරීමට කම්කරු සබඳතා දෙපාර්තමේන්තුව පහසුකම් සලසයි. 2012 වර්ෂය තුළ, එබඳු රැකියා පොළ 19ක් දිවයින පුරා පවත්වා ඇත.

* **විශේෂ ජයග්‍රහණ**

වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව විසින් භුක්ති විඳින ලද කැමැත්ත පිළිබඳ සාමාන්‍යකරණය කළ පද්ධති (US-GSP) 2010 දී ඇමරිකානු රජය විසින් නවතා දමන ලද්දේ විශේෂයෙන්ම අපනයන සැකසුම් කලාපයන්හි සේවක හිමිකම් වල අඩුපාඩු ඇතැයි චෝදනා කරමින් AFL-CIO විසින් ගොනු කරන ලද පෙත්සම මගිනි. කෙසේ නමුදු, උක්ත ගැටළු සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යාංශය සමඟ එක්ව ආයෝජන මණ්ඩලය විසින් දරණ ලද හවුල් ප්‍රයත්නයන් හේතුවෙන් 2012 ජූනි වන විට කිසිදු වෙනසක් නොමැතිව නැවත උක්ත පහසුකම ලබා ගැනීමට හැකිවිය.

## මාධ්‍ය සහ ප්‍රචාරණය

බාහිර සන්නිවේදනය සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයෙහි මාධ්‍ය දෙපාර්තමේන්තුව වගකීම් දරණු ලැබේ. විවිධ මාධ්‍යයන් තුළින් විවිධාකාරයේ ප්‍රේක්ෂකයන් (ආයෝජකයින්) ආමන්ත්‍රණය කරමින් ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා, ව්‍යාපාරික වාතාවරණය, ආයෝජන මණ්ඩලයේ සඵලත්වය ආදී කරුණු පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2012 වර්ෂයේ දී ආයෝජන මණ්ඩලය කටයුතු කරන ලදි.

2012දී, විවිධ මාධ්‍ය ආකාර භාවිතා කරමින් ප්‍රචාරක වැඩසටහන් හි ආයෝජන මණ්ඩලය නියැලී සිටින ලදී. තවද, මුද්‍රිත ප්‍රවර්ධන ද්‍රව්‍ය වර්ධනය කිරීම, ප්‍රකාශනයන්හි ප්‍රචාරක දැන්වීම් ස්ථාපිත කිරීම, පුළුල් ප්‍රේක්ෂක ජනකායක් ඉදිරියෙහි සිය පණිවුඩය ලබාදීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා වැඩසටහන්/ චිත්‍රපට නිෂ්පාදනය කිරීම ඉටු කෙරේ.

පහත දැක්වෙනුයේ 2012 හි ආයෝජන මණ්ඩලයෙහි මාධ්‍ය දෙපාර්තමේන්තුව මගින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතීන්ය:

**මාධ්‍ය ප්‍රකාශන:**

* මාධ්‍ය ප්‍රකාශ විශාල ප්‍රමාණයක් භාෂා ද්විත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවා මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය වලට බෙදාහරින ලදී.

* "ආයෝජනයට උපදෙස්", "බදු සහන සහ සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රතිපත්තිය" යන නව ප්‍රවර්ධන අත්පොත් සහ අංශ විශේෂී අත්පොත් වන "සංචාරක කර්මාන්තය සහ විවේකය, තොරතුරු තාක්ෂණය/ITES", "ප්‍රතිභාවිත බලශක්තිය", "යටිතල පහසුකම්", "නිෂ්පාදනය", "කෘෂිකර්මය", "අධ්‍යාපනය" වැනි ඒවා සැලසුම් කිරීම සහ මුද්‍රණය කිරීම.

* විශේෂිත අවස්ථාවන්හිදී පුවත්පත් වෙළඳ දැන්වීම් සකස්කොට ඉදිරිපත් කිරීම.

**අවස්ථාවන් සඳහා සහභාගීත්වය:**

* අනුරාධපුර, ඔයාමඩුව පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහභාගී වීම. ආයෝජන මණ්ඩලයේ කුටිය ස්ථාපිත කරන ලද්දේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පීඨිකාව මතය. ආයෝජන මණ්ඩලයේ කුටියෙහි දක්වන ලද්දේ ආයෝජනයේ වැදගත් ක්ෂේත්‍රයන්හි ඡායාරූප දැක්මක් සමඟ රැකියා බැංකු කවුළුවක්, ආයෝජන සම්බන්ධයෙන් තොරතුරු සහ විශේෂයෙන් සකස් කරන ලද පත්‍රිකා, කුටිය නැරඹීමට පැමිණි සාමාන්‍ය ජනතාව වෙත බෙදා දෙන ලදී.

* මීරිගම, මල්වත්තේ සහ වතුපිටිවල අපනයන ප්‍රවර්ධන කලාපයන්හි පිවිසුමෙහි විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු තුනක් නිර්මාණය කිරීම සහ එසවීම මෙම ව්‍යාපෘතිය කාර්මික සබඳතා දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් සිදුකරන ලදී.

* දශක තුනකට පසු යාපනයේ පවත්වන ලද පළමු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය වන යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම එකී වෙළඳ ප්‍රදර්ශනය ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා (පෞද්) සමාගම, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සංගමය සමඟ යාපනය වාණිජ හා කර්මාන්ත සංගමය එක්ව සංවිධානය කෙරුණි. මෙයට සමගාමීව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් යාපනය පුස්තකාලයේ දී ආයෝජන සමුළුවක් පවත්වන ලදි.

* කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු ජාතික තිරසාර බලශක්ති ප්‍රදර්ශනය වන “විදුල්කා 2012” සඳහා සහභාගී වීම

* කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද “එක්ස්පෝ 2012 වෙළඳ ප්‍රදර්ශනය” සඳහා සහභාගි වීම.

* වෙබ් අඩවිය කළමනාකරණය කිරීම: ආයෝජන මණ්ඩල වෙබ් අඩවිය, www.investsrilanka.com පිටුව නැරඹූ සංඛ්‍යාව 125470කි.

## පරිපාලනය

පරිපාලන දෙපාර්තමේන්තුව පහත දැක්වෙන උප ඒකක වලින් සමන්විත වේ.

1 ගබඩා හා සැපයුම් ඒකකය
2 ප්‍රවාහන ඒකකය
3 ගොඩනැගිලි නඩත්තුව
4 සාමාන්‍ය පරිපාලන
5 තැපැල් අංශය

පරිපාලන දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වල සහ ආයෝජන මණ්ඩලයෙහි අපනයන සැකසුම් කලාප ක්‍රියාකාරීත්වයට අවැසි සංවිධාන සහාය සැපයීම සිදුකරනු ලැබේ. ප්‍රවාහන සහ වාහන අවශ්‍යතා සැපයීම, ද්‍රව්‍ය හා කාර්යාල යටිතල පහසුකම් අවශ්‍යතා නිසිකලට සැපයීම මගින් සිය සේවාලාභී දෙපාර්තමේන්තු වලට මෙම දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසනු ලැබේ.

**2012 වර්ෂය සඳහා සපුරාගැනීම් / සාක්ෂාත් කර ගැනීම්**


1). මාර්ගයේ ධාවනය කිරීමට නුසුදුසු වාහන 15ක් අපහරණය කොට රු. මිලියන 6.9ක මුළු ආදායමක් ලබාගන්නා ලදී. ප්‍රධාන කාර්යාලයෙහි සහ කලාපයන්හි ප්‍රවාහන අවශ්‍යතා සපුරාලනු වස් නවතම මෝටර් රථ 09ක් සහ ඩබල් කැබ් රථ 06ක් මිලදී ගැනීම සඳහා කටයුතු කර ඇත.

2). ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 6වන මහල කල්බදු දීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සමඟ ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළැඹ ඇත.

3). රු. මිලියන 19ක් වටිනා නව්‍ය සංවර්ධිත පරිගණක යන්ත්‍ර 156ක් ප්‍රසම්පාදනය කිරීම මගින් ගබඩා සහ සැපයුම් ඒකකය දායකත්වය සපයන ලදී. සංවිධානයෙහි වාර්ෂික ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය අවශ්‍යතාව සැපයුම් අංශය විසින් සම්පූර්ණ කරන ලදී.


## ගිනි නිවීම් හා ආරක්ෂක

ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක හා ගිනි නිවීම් දෙපාර්තමේන්තුව විසින් දේපල හා මානව ජීවිත වල ආරක්ෂක හා ප්‍රවේසම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරක් ඉටුකරයි - විදේශීය සහ දේශීය ආයෝජකයන් විසින් අපනයන සැකසුම් කලාප සහ කාර්මික උද්‍යාන වල ප්‍රධාන වශයෙන් ආයෝජන ව්‍යාපෘති සහ ව්‍යාපාරික ආයතන ස්ථාපිත කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආයෝජන/ ව්‍යාපාරික හස්තය වන ආයෝජන මණ්ඩලය හරහාය. මෙම සියලුම ස්ථානයන්හි ස්ථාපිත කොට ඇති ආරක්ෂක සහ ගිනි නිවීම් කාර්ය මණ්ඩල වලට විවේකීව සිටීමේ හැකියාවක් නොමැති අතර තදින්ම අවධානයෙන් යුතුව පැය 24 පුරාම රාජකාරියෙහි යෙදී සිටීමට සිදුව ඇත්තේ ඉහල මට්ටමින් යුතුව සේවයේ ගුණාත්වය ලබාදිය යුතු වන නිසාත් ආරක්ෂක සහ ගිනි නිවීම් කාර්යමණ්ඩලයේ පාර්ශවයන් කිසිදු අතපසුවීමක් හෝ පද්ධතියෙහි කිසිදු අඩුපාඩුවක් නොතිබිය යුතු නිසාවෙනි. තමන් වෙත භාරදෙන ලද ප්‍රදේශයන්හි වත්කම් සහ මානව ජීවිත වල ආරක්ෂක හා ප්‍රවේසම පිළිබඳ අවශ්‍ය වන්නාවූ ප්‍රමිතීන් කෙතරම් දුරට පවත්වාගෙන යන්නේ දැයි කිවහොත් එය පැසසුම් සහගතය. සේවාවෙහි ප්‍රමිතිය ආයෝජන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන අන්තර්ජාතික ප්‍රමිති ආයතනයෙහි (ISO) ප්‍රමිතීන් අතර පවත්නා අතර එම මට්ටමින්ම කලාපයන්හි පවත්නා කර්මාන්තශාලා තුළද පවතී.




ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක සහ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව ආයෝජන මණ්ඩලයේ පත්කළ කාර්ය මණ්ඩලයෙන් සහ පෞද්ගලික ආරක්ෂක සමාගම් වලින් කුලියට ගත් ආරක්ෂක නිළධාරීන්ගෙන් සමන්විතය.

ආයෝජන මණ්ඩලයේ - ආරක්ෂක සහ ගිනි නිවීම් ඒකකයේ සහ කුලියට ගත් සේවාවන්හි මුළු ශක්තිය -





ස්ථානයන්හි ආරක්ෂක ස්ථාපිත කිරීම් හැරුණු විට, සියළු කලාපයන්හි ජංගම හා පාද සංචාර පිළිබඳව නිපුනතාවෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයෙහි යෙදවීමද සේවා වලට අයත් වේ. ආරක්ෂක හා ගිණි බල ඒකකය මගින් ආවරණය කරනු ලබන ප්‍රධාන කාර්යයන් වනුයේ විය හැකි කඩාකප්පල්කාරී ක්‍රියා, විප්ලවකාරී/ විනාශකාරී ක්‍රියා, සොරකම්, තීරුබදු සහන හා ආනෙකුත් නීත්‍යානුකූල නොවන භාණ්ඩ ඉවත් කිරීම්, කලාප වලට නීත්‍යානුකූල නොවන පරිදි ඇතුළු වීම සහ සියළු පිවිසුම් හා පිටවුම් දොරටු වලට පිරිස් බලය යෙදවීම යනාදියයි.

ටෙන්ඩර් පටිපාටි හරහා, ආයෝජන මණ්ඩලය විසින් වාර්ෂිකව සිය කාර්යාල/ උද්‍යාන/ කලාප වල අඩුපාඩු පියවා ගැනීම සඳහා පෞද්ගලික ආරක්ෂක සමාගම් වල සේවා ලබා ගනී. ප්‍රමාණන නිලධාරී විසින් අත්පත් කරගත් ඉඩම් හා ගොඩනැගිලි සඳහා ආරක්ෂක පියවර ද ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක හා ගිනි නිවීම් දෙපාර්තමේන්තුව මගින් සලසා ඇත.

ආයෝජන මණ්ඩලයේ ගිනි නිවීම් ඒකක කටුනායක, බියගම සහ සීතාවක අපනයන සැකසුම් කලාපයන්හි ස්ථාපිත වී ඇත. සියලු කලාප, කර්මාන්තශාලා, සහ ප්‍රධාන කාර්යාලයෙහි නිරන්තර ගිණි පෙරහුරු වැඩසටහන් සහ හදිසි ඉවත් වීමේ පුහුණු පවත්වනු ලැබේ. මෙම කලාපයන්හි ස්ථාපිත කර්මාන්තශාලා ප්‍රමාණය සැළකිය යුතු ලෙස ඉහල නගිමින් පවතී. කලාපයන් තුළ හදිසි තත්ත්වයන්ට අමතරව, කලාපයන්ගෙන් බැහැර ඒවා ආසන්නයේ හදිසි තත්ත්වයන් සම්බන්ධයෙන්ද ගිණි ඒකක කටයුතු කිරීමෙහි නියැලී සිටින අතර කර්මාන්තශාලා නිළධාරීන්ට ගිණි පුහුණුව සහ අදාල ප්‍රදේශයන්හි අතිශයින් වැදගත් පුද්ගලයන් පැමිණි විටද අදාල අවස්ථාවන්හිදී ද සේවයෙහි යෙදවේ. සියළු ගිණි සංවිධාන කටයුතු ප්‍රදේශයේ පොලිස් ස්ථාන හා සමීපතම යුධ හමුදා කඳවුරු වල බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව සිදු කරනු ලැබේ. ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මගින් ඕවර්සීස් රියැලිටි සමාගමෙන් සහ කොළඹ ගිණි නිවන අංශයෙන් සහාය ලබාගන්නා අතරතුර, ආයෝජන මණ්ඩල ගිණි ඒකක වල සහාය නොමැති කලාපයන්හි මහනගර සභා, ආසන්නම යුධ හා නාවුක හමුදා කඳවුරු වලින් සහාය ලබා ගැනේ.

ප්‍රදේශ අනුව ආරක්ෂක/ ගිණිබල නිළධාරීන් ස්ථාපිත කිරීම (ආයෝජන මණ්ඩලයේ සහ කුලියට ගත්)




2012 වර්ෂයේදී නිළධාරීන් විශ්‍රාම යාම, අස්වීම හෝ ස්වේච්ඡාවෙන් සේවය අතහැර යාම ලබා ගැනීම හේතුවෙන් කාර්යමණ්ඩලයේ බොහෝ අඩුපාඩු පැවතිණ. කෙසේ නමුදු, අඩු/ අවම සම්පත් මධ්‍යයේ වුවද, අපේක්ෂිත මට්ටමට වඩා ඉහලින් කටයුතු සිදු කිරීමට හැකියාව ඇතිවිය. දවසේ පැය 24 පුරාම ආරක්ෂක සහ ගිනි නිවීම් මෙහෙයුම් අංශය අවධානයෙන් සිටී. එහිදී, වැඩ කරන පැය ගණනින් බැහැරව උද්ගත වී ඇති ඕනෑම අනපේක්ෂිත මෙහෙයුම් හෝ පරිපාලන ගැටළුවක් සම්බන්ධයෙන් සිය ස්ථාපිතයන් තුළ කාර්ය මණ්ඩලය විසින් මනාව පාලනය කොට ගනිමින් ඉහල නිළධාරීන්ගේ අවම උපදෙස් හෝ චබන්දක් නොමැතිවම කටයුතු කරනු ලැබේ. එනයින්, කටුනායක. බියගම, සීතාවක, කොග්ගල සහ නව කලාප පිළිබඳ අවධානය යොමුකරද්දී සුළු සිදුවීම් කිහිපයක් හැර, ආරක්ෂක හා ගිනි නිවීම් කාර්යමණ්ඩලයට එරෙහිව කලාප ප්‍රධානීන්ගෙන් හෝ ජ්‍යේෂ්ඨ නිළධාරීන්ගෙන් කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැත.

සති අන්ත හා නිවාඩු දින වල, වර්ෂය පුරාම ක්‍රියාකාරීව පවත්නා ප්‍රදේශය පිළිබඳව ආරක්ෂක කාර්ය මණ්ඩලය සම්පූර්ණ වගකීමෙන් සිටින අවස්ථාවේදී හැර වැඩ පැය ගණන තුළ හා ඉන් අනතුරුව ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය සමඟ එක්ව ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කලාපයේ ආරක්ෂක කාර්ය මණ්ඩලය වගකීම් දරනු ලැබේ. 2012 වර්ෂය තුළ සම්පූර්ණ බලපත්‍ර ආදායම සැලකිය යුතු ලෙස ඉහළ නැග තිබේ.

සියලු කලාපයන්හි නිරන්තර කර්මාන්තශාලා පරීක්ෂාවන් සිදු කර ඇත. සොරකම් ප්‍රයත්න හෙළිදරව් කර ගැනීම් සැළකිය යුතු ප්‍රමාණයක් විය. කල් ගතවූ ඇතුල්වීමේ බලපත්‍ර ආදියද විය.

2012 දී ආරක්ෂක සොයා බැලීම් - දළ වශයෙන් පෙනී යන පරිදි: කටුනායක අපනයන සැකසුම් කලාපය (KEPZ) තුළ - පරීක්ෂාවන් 05ක්, වෙනත් සිදුවීම් 03ක්, අවභාවිත ප්‍රවේශ බලපත්‍ර 850ක්; බියගම අපනයන සැකසුම් කලාපයෙහි (BEPZ) - සොරකම් ප්‍රයත්න 02ක්, කල් ඉකුත් වූ ප්‍රවේශ බලපත්‍ර 568ක් භාවිතා කිරීම පිළිබඳ පෙනී යන ලද අවස්ථා 05ක්; කොග්ගල අපනයන සැකසුම් කලාපය (KgEPZ) තුළ - අභ්‍යන්තර වැස්ම 900ක්/ ඇඟළුම් 20ක්; සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපයෙහි (SEPZ) - ඇඟළුම් 321/ කල් ඉකුත් වූ ප්‍රවේශ බලපත්‍ර 625 ක්; හොරණ අපනයන සැකසුම් කලාපයෙන් (HEPZ) ඉන්ධන බැරල් 28ක්; මීරිගම අපනයන සැකසුම් කලාපයෙන් 03ක්, මීරිගම අපනයන සැකසුම් කලාපයෙහි (MEPP) දෛනික පදනමින් අවභාවිත ප්‍රවේශ බලපත්‍ර; මාවතගමින් (MwEPZ) 03ක් සහ පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයෙහි (PEPZ) නූල් පන්දු 31ක්/ නිමි ඇඳුම් 15ක් වශයෙන් වාර්තා විය.

**මාසික සැසි**

මාසික රැස්වීම්, සාරාංශ කිරීම්, පුහුණු සහ උපදෙස් සැසි සියලු කලාපයන්හි පවත්වා ඇත. ආරක්ෂක හා ගිනි නිවීම් පුහුණු ආයතනයන් හරහා සිය නිපුනතා වර්ධනය කර ගැනීමේ අවස්ථාව 2013 දී කාර්යමණ්ඩලය සතුව පවතී.

සියලු බාණ්ඩයන්හි ආරක්ෂක සහ ගිනි නිවීම් කාර්යමණ්ඩලය වෙත උසස් වීම් ඉතා සුළු ප්‍රමාණයක්, 2012 වර්ෂයේදී ලබාදී ඇත.

**ආයෝජන මණ්ඩලයේ ගිනි නිවීම් ඒකකය -**

ගිනි නිවීම් ඒකකයන්හි කාර්යභාරය යටතට ගිණි උවදුරු සහ හදිසි අවස්ථාවන්හි කටයුතු කිරීම, ගිණි අවදානම් ඇගයීම, කර්මාන්ත කාර්ය මණ්ඩලය වෙත ගිණි පෙරහුරු සහ දැනුවත් වීම ලබාදීම, ගිණි උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව, අනුකූලතා සහතික නිකුත් කිරීම, ව්‍යාපාර සඳහා ගිනි නිවීම් සහතික සහ ඉවත් කිරීමේ සහතික නිකුත් කිරීම අයත් වේ. දෛනිකව ගිණි උපකරණ කාර්යක්ෂමතාව සඳහා පරීක්ෂා කෙරේ. ඇතැම් ගිණි නිවන රථ පැරණි හා සේවා කළ නොහැකි තත්ත්වයේ පවත්නා අතර ගිණි උපකරණ අසම්පූර්ණ සහ අයෝග්‍ය තත්ත්වයේ පවතී. තවද, කලාප කළමනාකරණයට සම්බන්ධ හදිසි තත්ත්වයන් සම්බන්ධයෙන්ද ගිණි බිය කාර්ය මණ්ඩලය කටයුතු කරයි.

**කටුනායක අපනයන සැකසුම් කලාපය (KEPZ)**

ගිනි නිවීම් ඒකකය විසින්, ගිණි බිය ඇමතුම් 27ක් සාර්ථකව මෙහෙයවා, විශේෂ රාජකාරි 04ක් සම්බන්ධයෙන් කටයුතු කර පුහුණුව, ඉවත් කිරීම සහ පරීක්ෂා කිරීම් (අභ්‍යන්තර හා භාහිර) පිළිබඳ සැසි 73කට සහභාගී වී ඇත.

**බියගම අපනයන සැකසුම් කලාපය (BEPZ )**

ගිනි නිවීම් ඒකකය විසින් අභ්‍යන්තර ගිනි නිවීම් ඇමතුම් 23ක්/ බාහිර ඇමතුම් 09ක් සම්බන්ධයෙන් ගිණි බිය ඒකකය සාර්ථකව ප්‍රතිචාර දක්වා ඇත. සූදානමින් සිටිය යුතු රාජකාරි ප්‍රදේශ 08කි. (අභ්‍යන්තර හා භාහිර) කලාපය තුළ සමාගම් 16කට ගිනි නිවීම් පුහුණුවීම් ලබාදී ඇත.

**සීතාවක අපනයන සැකසුම් කලාපය (SEPZ )**

ගිනි නිවීම් ඒකකය විසින් ගිනි නිවීම් ඇමතුම් 65කට සාර්ථකව ප්‍රතිචාර දක්වා විමර්ශන 22ක් සිදුකොට, ගිනි නිවීම් පුහුණු සැසි 33ක්, හදිසි ඇගයීම් පෙරහුරු 17ක් සහ සූදානමින් සිටීම් 42ක් සහ වෙනත් රාජකාරි සිදුව ඇත.

සියළු අඩුපාඩු, ඌනතා මධ්‍යයේ වුවද 2012 වර්ෂයේදී සාක්ෂාත් කරගත් ජයග්‍රහන ප්‍රසංශනීය බව සනිටුහන් කිරීම වටිනා අතර වර්ෂය පුරාම පැය විසිහතර පුරාම ආරක්ෂක හා ගිනි නිවීම් කාර්ය මණ්ඩලය විසින් කැපවීමෙන් ඉටුකරන ලද සේවයේ ඵලයක් ලෙස එය දැක්වීමට හැකිය.

## මානව සම්පත් කළමනාකරණය

### මානව සම්පත් දෙපාර්ත්මේන්තුවෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

ආයෝජන මණ්ඩලයෙහි මුළු මානව සම්පත් ව්‍යුහයම කළමනාකරණය කිරීමේ වගකීම දරණ ප්‍රධාන දෙපාර්තමේන්තුව මානව සම්පත් දෙපාර්තමේන්තුවයි. එහි ප්‍රධාන කටයුතු වන්නේ,

* **මානව සම්පත් සැලසුම්කරණය**
  - වර්තමාන සහ අනාගත මානව සම්පත් අවශ්‍යතා ඇගයීම.
  - උක්ත අවශ්‍යතා සපුරාලීම වස් බඳවාගැනීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

* **කාර්යසාධන ඇගයීම**
  - සේවක කාර්යසාධනය වාර්ෂිකව සමාලෝචනය කොට ඇගයීමට ලක් කරනු ලැබේ.
  - සේවකයන්ගේ කාර්යසාධනය මත වාර්ෂික වැටුප් වැඩිකිරීම් ලබාදීම.
  - සේවකයන්ගේ කාර්යසාධනය, සුදුසුකම් සහ පළපුරුද්ද මත ඔවුන් ඉහල ශ්‍රේණි වලට උසස් කිරීම.

* **මානව සම්පත් සංවර්ධනය**
  - පුද්ගල සහ සංවිධානමය සාර්ථකත්වය වර්ධනය කර ගැනීම සඳහා පුහුණු හා වෘත්තීය සංවර්ධන ප්‍රයත්න ඒකාබද්ධව භාවිතා කිරීම. එමගින් පුද්ගලයන් වෙත සිය වර්තමාන රැකියාවේ කටයුතු කිරීමට අවැසි ප්‍රධාන ශක්‍යතා දියුණු කරන අතරම මනාව සැලසුම් කරන ලද ඉගෙනුම් ක්‍රියාකාරකම් හරහා අනාගත රැකියා ප්‍රවර්ධනයන් සඳහා සූදානම් වීමටද අවකාශ සලසයි.

* **විනය පවත්වාගෙන යාම**
  - සේවකයන්ගේ විනය පවත්වාගෙන යාම හා දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම .
  - කම්කරු කාර්යංශය, කම්කරු දෙපාර්තමේන්තුව, මානව සම්පත් කවුන්සල සහ අධිකරණ වැනි භාහිර ආයතන වල කම්කරු ගැටළු සම්බන්දයෙන් කටයුතු කිරීම

* **පැමිණීම හා නිවාඩු පවත්වාගෙන යාම.**

* **සේවක සුබසාධන සේවා**
  - විවිධ ආකාරයේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ජීවිත හා ආබාධිත රක්ෂණය, වෛද්‍ය පහසුකම්, අවමංගල්‍ය ආධාර යෝජනා ක්‍රමය නිල බස් ප්‍රවාහන සේවාව, ප්‍රවාහන සහන සහ පැමිණීමේ දිරි දීමනා යෝජනා ක්‍රමය ආදිය.

### සාක්ෂාත් කර ගැනීම් (ජයග්‍රහන) - 2012

* ඉන්දියාවේ AonHewitt ආයතනය හා එක්ව මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය විසින් පවත්වන මානව සම්පත් කළමනාකරණ සම්මාන උළෙල - 2012 සඳහා සහභාගී වී එහිදී රාජ්‍ය/ අර්ධ රාජ්‍ය අංශයේ සංවිධාන බාණ්ඩය යටතේ අවසන් තරඟකරුවන් අතරට පත් වන ලදී.

* ආයෝජන මණ්ඩලයෙහි පත්කිරීම් හා උසස් කිරීම් ක්‍රියාවලිය ක්‍රමවත් කරමින් එහි නව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සඳහා අනුමැතිය ලබාගෙන ඇත.

* ආයෝජන මණ්ඩලයෙහි වෛද්‍ය ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමේ පද්ධතිය නව මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතියෙහි සේවක ප්‍රතිලාභ මොඩියුලයට අන්තර් සම්බන්ධිත වූ අතර මානව ප්‍රාග්ධන කළමනාකරණය (HCM) පද්ධතිය හරහා සිදුකිරීම සඳහා ක්‍රියාවලියට අනුගත කිරීම ආරම්භ කරන ලදී

* ආයෝජන මණ්ඩලයේ සේවය සඳහා අළුතින් විධායක නිළධාරීන් හතක් (07), කළමනාකරණ සහකාර සේවා බාණ්ඩයේ නිළධාරීන් හතලිස් හයක් (46) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් තිස් හතරක් (34) බඳවා ගන්නා ලදී.


* කොන්ත්‍රාත්තු පදනම මත සිටි සේවකයින් හතක් (07) සහ අනියම් පදනම මත සිටි සේවකයින් හතරක් (04) ස්ථිර සේවයට බඳවා ගන්නා ලදී.

* විධායක නිළධාරීන් එකසිය හතලිස් පහක් (145), කළමනාකරණ සහකාර ඛාණ්ඩයේ සේවකයින් තිස් පහක් (35) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් දහ හතක් (17) සඳහා ඉහල ශ්‍රේණි වලට උසස්වීම් ලබාදෙන ලදී.

* නිළධාරීන් එකොලහකට (11) විද්‍යාපති/ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අනුග්‍රහය දක්වන ලද අතර ආයෝජන මණ්ඩලයේ සේවකයින් සඳහා විදේශ පුහුණු අවස්ථා දහයක් (10) ලබාදෙන ලදී. තවද, ආයෝජන මණ්ඩලයේ නිළධාරීන් 528 ක් සඳහා නේවාසික පුහුණු වැඩසටහන් දහයක් (10) පවත්වන ලද අතර වැඩි අන්තර් පුද්ගල සහ සමාජයීය පැවැත්ම සඳහා වන නිපුනතා වර්ධනය කිරීමේ අරමුණින් යුතුව ආයෝජන මණ්ඩලයේ අළුතින් උසස්වීම් ලද නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සියලුම සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා පෞරුෂත්ව වර්ධනය, ව්‍යාපාර සහ සමාජ ආචාරධර්ම පිළිබඳ වැඩමුළු තුනක් (03) පවත්වා ඇත. ඊට අමතරව, ආයෝජන මණ්ඩලයට අළුතින් බඳවාගත් සේවකයන් හැට පහක් (65) සඳහා තෙදින දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.


* මුදල් හා ගිණුම්කරණ, මානව සම්පත් කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, පරිගණක යෙදුම්, ලඝුලේඛනය, ලේකම් කටයුතු, තාක්ෂණික පුහුණු හා විගණන යන අංශයන්හි රැකියා පුහුණුව සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන වලින් පුහුණුලාභීන් තිස් පහක් (35) ලබාදෙන ලදී.

ප්‍රධාන කාර්යසාධන අංශ පිළිබඳව සැසඳීම - 2011 සහ 2012




**මුළු ශ්‍රම බලකාය**

2012 දෙසැම්බර් 31 වන දින වන විට ආයෝජන මණ්ඩලයේ මුළු කාර්යමණ්ඩල ශක්තිය 1151ක් විය.




| | |
|---|---|
| විධායක නිළධාරින් | 504 |
| කළමනාකරණ සහකාරවරු | 384 |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් | 263 |
| මුළු කාර්ය මණ්ඩලය | **1151** |


| 2012 වර්ෂය තුළ කරන ලද නව පත්කිරීම් | |
|---|---|
| තනතුර | සේවක සංඛ්‍යාව |
| විධායක කාර්ය මණ්ඩලය | |
| විධායක අධ්‍යක්ෂ | 01 |
| අධ්‍යක්ෂ | 01 |
| සහකාර අධ්‍යක්ෂ | 02 |
| කණිෂ්ඨ කළමනාකරු කාන්ඩයේ සේවකයන් | 03 |
| නව මුළු පත්කිරීම් විධායක | **07** |
| කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය | |
| කළමනාකරණ සහකාර | 41 |
| පරිගනක ක්‍රියාකරු | 03 |
| තාක්ෂණික සහායක | 02 |
| ප්‍රාථමික මට්ටමේ සේවකයින් | |
| රියදුරු | 12 |
| වඩු කාර්මික | 01 |
| මේසන් | 01 |
| කාර්යාල සහායක/ කම්කරු | 20 |
| මුළු නව පත්කිරීම් ප්‍රාථමික මට්ටම | **34** |
| 2012දී සිදුකළ මුළු නව පත්වීම් | **87** |




## 2012 වර්ෂයෙ තුළදී ලබාදුන් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් පිළිබඳ සාරාංශය

| | විධායක | කළමනාකරණ සහකාර | ප්‍රාථමික මට්ටම | එකතුව |
|---|---|---|---|---|
| විදේශ පුහුණු අවස්ථා | 10 | - | - | 10 |
| විශේෂවේදී උපාධි වැඩසටහන් | 12 | - | - | 12 |
| දේශීය පුහුණු වීම් (මෘදු නිපුනතා) | 261 | 90 | 11 | 362 |
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | 288 | 179 | 61 | 528 |
| එකතුව | **571** | **269** | **72** | **912** |

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - සංවිධාන ව්‍යුහය (31.12.2012)




✷ වර්තමාන තනතුරු දරන්නන් ඉවත් වූ විට තනතුරු ඉවත් කරනු ලැබේ.

<u>ස්ථාන</u>

| | |
|---|---|
| ACT | - ගුවන් භාණ්ඩ පර්යන්තය |
| BEPZ | - බියගම අපනයන ප්‍රවර්ධන කලාපය |
| CRO & KIP | - මධ්‍යම පළාත් කළාප කාර්යාලය මහනුවර IP |
| CVT | - භාණ්ඩ සත්‍යෝක්ෂණය කිරීමේ පර්යන්තය |
| HEPZ | - හොරණ අපනයන ප්‍රවර්ධන කලාපය |
| JRO | -යාපනය කලාප කාර්යාලය |
| KEPZ | - කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය |
| MEPP | - මල්වත්ත අපනයන සැකසුම් කලාපය |
| MEPZ | - මීරිගම අපනයන ප්‍රවර්ධන කලාපය |
| MWEPZ | - මාවතගම අපනයන ප්‍රවර්ධන කලාපය |
| NWRO | - වයඹ කලාප කාර්යාලය |
| PEPZ | - පොල්ගහවෙල අපනයන ප්‍රවර්ධන කලාපය |
| SBJW | - සර් බාරොන් ජයතිලක මාවත කාර්යාලය |
| SEPZ | - සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපය |
| SRO & KGEPZ | - දකුණු පලාත් කලාප කාර්යාලය සහ කොග්ගල අපනයන ප්‍රවර්ධන කලාපය |
| WEPZ | - වතුපිටිවල අපනයන ප්‍රවර්ධන කලාපය |
| WTC | - ලෝක වෙලඳපොල සංකීර්ණයේ කාර්යාලය |

[ ] - ඇබෑර්තු

## පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවෙහි විදේශ සහ දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන පහසුකම් සේවා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේශන කාර්යය භාරගනු ලැබේ.

2012 වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය පදනමින් ප්‍රධාන වශයෙන් අවධානයට ලක්කළ යුතු වන සහ ප්‍රධාන ජයග්‍රහන පහත දක්වා ඇත.

ආයෝජන ප්‍රවර්ධනය කිරීමට සහ ආයෝජකයන් වෙත පහසුකම් සැපයීමට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා කළාපීය සහ ගෝලීය තරඟකරුවන් අතර රටේ තරඟකාරීත්වය අධ්‍යනය කිරීමට විශ්ලේශනය පදනම් කර ගැනීම, දේශීය ආර්ථිකයේ විවිධ අංශ වල ආයෝජන විභවතාවන්/ ශක්‍යතාවන් හඳුනාගැනීම සඳහා ආංශිකව විශේෂිත වූ විශ්ලේශනය සහ ප්‍රමුඛතම අංශ සඳහා ශක්‍යතාවෙන් හෙබි ආයෝජකයන් හඳුනා ගැනීම පිණිස රජයේ සහ විදේශ ඒකාබද්ධතාවන් සමඟ අනුගත වෙමින් ජාතික මට්ටමින් විශ්ලේශනයන් සිදු කිරීම සඳහා කටයුතු සිදුකෙරේ.

"ශ්‍රී ලංකාවෙහි ආයෝජනය සඳහා මගපෙන්වීම, ශ්‍රී ලංකාවේ බදු දිරිගැන්වීම් සහ විදේශ සෘජු ආයෝජන ප්‍රතිපත්තිය සම්පූර්ණ කිරීම සහ කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, නිෂ්පාදනය, යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණ/ දැනුම් සේවා, ප්‍රතිභාවිත බලශක්තිය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ආංශික අත්පොත් හතක් සම්පූර්ණ කිරීමට පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුවට වර්ෂය තුළ හැකි විය.

ප්‍රතිපත්ති උපදේශන භූමිකාවේදී එය අදාල ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සමීප සහයෝගයකින් යුතුව කටයුතු කරයි. ප්‍රතිපත්ති සංශෝධන සඳහා අවශ්‍යතාව වෙත රාජ්‍ය ආයතන වලට අවධානය යොමු කිරීමට ආරාධනා කරමින් ප්‍රතිපත්ති පත්‍රා සකස්කොට ඉදිරිපත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සාර්ව සහ ආංශික විශේෂී ප්‍රතිපත්ති විශ්ලේශනය භාරගනු ලැබේ. ද්වී පාර්ශ්වික, කලාපීය ආයෝජන ගිවිසුම් සහ වෙනත් ලෝක වෙළඳ සංවිධානයෙහි (WTO) ගැටළු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව එක්ව භාරගන්නා හවුල් ක්‍රියාවන් හරහා වෙළඳාම හා ආයෝජනය ප්‍රවර්ධනය කිරීමට දායකත්වය දී ඇත.

2012 වර්ෂයේදී පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව විසින් ද්වී පාර්ශ්වික ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමේ ගිවිසුම් කෙටුම්පත් කිරීම සහ සාකච්ඡා කිරීමට කටයුතු කර ඇති අතර ද්වී පාර්ශ්වික ආදර්ශ ආයෝජන ප්‍රවර්ධන හා ආරක්ෂණ ගිවිසුමක් සකස් කිරීමට දායකත්වය සපයන ලදී.

පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයට සහ අදාල අමාත්‍යවරයාට, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ශ්‍රී ලංකාවේ ඇති තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල වලට, අන්තර්ජාතික සංවිධාන වලට, වෙනත් රජයේ ආයතනයන්ට, පෞද්ගලික අංශයේ සංවිධාන වලට, දේශීය හා විදේශීය ආයෝජකයන්ට, පර්යේෂකයන්ට, ශිෂ්‍යයින්ට සහ අනෙකුත් එබඳු තොරතුරු සොයන්නවුන්ට ආයෝජන මණ්ඩලයේ දත්ත හා තොරතුරු ලබා දීම සඳහා ආයතනයේ ඉහල කළමනාකාරීත්වයේ කැමැත්ත සහිතව වගකීම් දරනු ලැබේ.

වාර්ෂිකව දෙපාර්තමේන්තුවට එබඳු ඉල්ලීම් 1000ක් පමණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවන අතර ඉන් ආයතන 10කට පමණ ආයෝජන මණ්ඩලය විසින් විශේෂ තොරතුරු සැපයීම සඳහා අනිවාර්යයෙන් කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇත.

පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව විසින් එහි "පර්යේෂණ කණ්ඩායමෙහි" වැදගත්කම පිළිබඳව අවධාරණය කරනුයේ; යෙදවුම් වලට වඩා නිමැවුම් අවධානයට ලක් කරමින්; සහ යහපත් කණ්ඩායම් කාර්යයක් සඳහා වන ව්‍යුහයට කිසිදු බලපෑමක් සිදු නොවන අයුරිනි.

## තොරතුරු තාක්ෂණය

### 1. දෙපාර්තමේන්තුවෙහි කටයුතු පිළිබඳ සාරාංශය

අ. ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු සන්නිවේදන විසඳුම් හඳුනා ගැනීම, ඇගයීම, සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් හා තාක්ෂණික සහාය සැපයීම.

ආ. ආයෝජන මණ්ඩලයෙහි තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් මිලදී ගැනීම/ ප්‍රතිසම්පාදනය, බලතල පැවරීම, සහ නඩත්තුව සැලසුම් කිරීම, නිර්දේශ කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

ඇ. සංස්ථාපිත ජාල දත්ත සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ කළමනාකරණය කිරීම.

ඈ. ආයෝජන මණ්ඩලයට අවශ්‍ය මෘදුකාංග පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

ඉ. දෘඩාංග, මෘදුකාංග, සන්නිවේදන, ජාල, විද්‍යුත් තැපෑල, සහ වෛරස ගැටළු වලට සම්බන්ධ ගැටළු විසඳීමේදී පරිශීලක-සහාය සැපයීම.

ඊ. ව්‍යාපාර ප්‍රති-ඉංජිනේරුකරණ ප්‍රයත්නයන්හිදී, තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමේදී අනෙකුත් දෙපාර්තමේන්තුවලට සහාය දීම.

උ. ඒකාබද්ධ දත්ත ශබ්ද කෝෂය, දත්ත පාදම/ පද්ධති සහ අදාල පද්ධති ලේඛන දියුණු කිරීම සහ පවත්වාගෙන යාම.

### 2. 2012 වර්ෂයේදී සම්පූර්ණ කළ ව්‍යාපෘති

2.1 **2012 වර්ෂය තුළ වැඩිදියුණු කළ තොරතුරු තාක්ෂණ සම්පත් සහ යටිතල පහසුකම්**

අ. ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා නව ජාල සබඳතා 82ක් ලබාදෙමින් ආයෝජන මණ්ඩල ජාලය වැඩි දියුණු කළ අතර ඔවුන්ට තොරතුරු තාක්ෂණ සේවා සපයන ලදී.

ආ. ආයෝජක සේවා මධ්‍යස්ථාන සියල්ලෙහිම ඇසිකුඩා ලෝක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සහාය දීම පිණිස දත්ත සබඳතා 16ක සංඛ්‍යාතය ඉහල නැංවීම.

ඇ. ආයෝජන මණ්ඩල ජාල සඳහා මාධ්‍ය පරිවර්තක 06ක් මිලදී ගැනීම සහ බලතල පැවරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම් ලෙස ජාල ස්විච සඳහා 1KVA UPSS 30ක් මිලදී ගැනීම සහ ඒවායේ බලතල පැවරීම.

ඈ. ඇසිකුඩා ලෝක පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජක සේවා දෙපාර්තමේන්තුව/ මධ්‍යස්ථාන වලට ඉහළ-අග්‍ර පරිගණක, 156ක්, UPSS 156ක්, මුද්‍රණ යන්ත්‍ර 12ක් ප්‍රසම්පාදනය කිරීම සහ බලතල පැවරීම.

ඉ. ආනයන/ අපනයන සේවා වලට පහසුකම් සැලසීම සඳහා ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් දියුණු කළ හා ක්‍රියාත්මක වූ මෘදුකාංග යෙදුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ අග්‍ර සර්වර් 02ක් ප්‍රසම්පාදනය කිරීම සහ බලතල පැවරීම.

ඊ. ප්‍රතිස්ථාපනයක් ලෙස නව පරිගණක 60ක්, ලැප්ටොප් පරිගණක 12ක්, සහ මුද්‍රණ යන්ත්‍ර 73ක් මිලදී ගැනීම සහ ඒවායේ බලතල පැවරීම.

උ. නව පරිශීලක ගිණුම් 85ක් නිර්මාණය කිරීම මගින් විද්‍යුත් තැපැල් පරිශීලකයන් ගණන 511ක් දක්වා ප්‍රමාණයකින් ඉහළ නැංවීම.

2.2 2012 දී මෘදුකාංග දියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම

අ. සියලු සේවා මධ්‍යස්ථානයන්හි ස්වයංක්‍රීය පද්ධතියක් දියුණු කොට ක්‍රියාත්මක කිරීම මගින් ආනයන/ අපනයන රේගු ප්‍රකාශන තක්සේරු කිරීමට සහ පාරිභෝගික සේවාව කඩිනම් කිරීමට පාරිභෝගික පෙර ගෙවුම් ගිණුම් වලින් සේවා ගාස්තු අඩු කිරීම සහ විද්‍යුත් තැපෑල/ කෙටි පණිවුඩ සේවාවේ නිවේදන ස්වයංක්‍රීයව යැවීම.

ආ. ආයෝජන මණ්ඩල ව්‍යාපාර/ බහාලුම් ඉදිරිපත් කරන්නවුන්/ නිෂ්කාශන නියෝජිතායතන සහ සියලු I S මධ්‍යස්ථානයන් හි සහ මූල්‍ය දෙපාර්තමේන්තුවෙහි පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

ඇ. පෙර ගෙවුම් ගිණුම් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ආයෝජන මණ්ඩලයට සහ බහාලුම් ඉදිරිපත් කරන්නන්/ නිෂ්කාශන නියෝජිතායතන සඳහා වෙබ් දොරටු දෙකක් සැලසුම් කොට දියුණු කිරීම.

ඈ. MIS වෙත 16වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති සමඟ අනුගත කිරීම සහ පරිශීලකයන්ගේ නව අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට පද්ධතිය වැඩිදියුණු කිරීම.

ඉ. ඉඩම් අයිතිය සහ බදු පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබාගත හැකි පරිදි ඉඩම් බැංකු පද්ධතිය වැඩි දියුණු කිරීම.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය මගින් පරිපාලනයේ සාර්ථකත්වය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලි ඇගයීම සහ දියුණු කිරීම මගින් කළමනාකරණයට විශ්වාසයෙන් යුතුව දායක වන අතර එමඟින් සංවිධානය තුළ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කෙරේ.

ඒ අනුව, විගණන විෂය පථය මගින් අභ්‍යන්තර පාලන පද්ධති වල යෝග්‍යභාවය සහ සාර්ථකත්වය පරීක්ෂා කිරීම සහ ඇගයීම ඇතුළත්ව ඇති අතර පහත දැක්වෙන සාමාන්‍ය විගණන පරීක්ෂණ හරහා සංවිධානයෙහි කටයුතු සිදු කිරීමෙහි කාර්යසාධනය සොයා බැලේ;

- සංවිධානයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේදී සාර්ථක හා කාර්යක්ෂම සේවාවන් ලබා දීම
- මූල්‍ය දත්ත කළමනාකරණය තොරතුරු හා වාර්තාවල විශ්වසනීයත්වය.
- නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

කළමනාකරණයෙන් උපදෙස් ලබාගනිමින් ප්‍රමුඛතා තීරණය කර අභ්‍යන්තර විගණනය වෙත ලැබුණු විවිධ දෝෂාරෝපන මත පදනම් වෙමින් සමාලෝචිත වර්ෂයේදී විශේෂ විමර්ශන කටයුතු සඳහා වැඩි කාලයක් කැපකරන ලද්දේ කළමනාකරණ තීරණ සඳහා එවැනි ඉහල වැගත්කමකින් යුතු අභ්‍යන්තර කළමනාකරණ කටයුතු පිළිබඳ සලකමිනි.

තවද. අභ්‍යන්තර විගණනය විසින් සිය කාලය හා සම්පත් වලින් සැළකිය යුතු ප්‍රමාණයක් වැය කරන ලද්දේ රේඛීය අමාත්‍යාංශ, පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව, විගණකාධිපති පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව හා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වෙමිනි.

සාමාන්‍ය අභ්‍යන්තර විගණන කටයුතු වලට අමතරව, කළමනාකරණ විගණන දෘෂ්ඨිය අනුව අන්තර්ජාතික ප්‍රමිති පදනම් වූ තත්ත්ව කළමනාකරණ පද්ධති (QMS) එනම් ISO 9001:2008 ක්‍රියාත්මක කිරීමේ හා පවත්වාගෙන යාමේ වගකීම දෙපාර්තමේන්තුව විසින් හොබවනු ලැබේ. මෙම වගකීම තබා ගනිමින්, කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි සහ කටුනායක, බියගම, කොග්ගල, පල්ලේකැලේ, මල්වත්ත, වතුපිටිවල, මීරිගම, හොරණ, පොල්ගහවෙල සහ මාවතගම යන අපනයන සැකසුම් කලාප එකොලහේ දෙපාර්තමේන්තු ආවරණ කරමින් සමස්ත ආයතනය හරහාම 2012 වර්ෂයේදී අභ්‍යන්තර විගණක විසින් එක් එක් අභ්‍යන්තර තත්ත්ව විගණන චක්‍රය මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විගණන සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනයේ සංවිධානාත්මක තත්ත්වය හරහා ස්වාධීනත්වය අත්පත් කරගත් අතර එමගින් සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් සහ විගණන කමිටුව ඇතුළු ඉහල කළමනාකරණයට වාර්තා කිරීම සඳහා නිදහස ලැබීමට සෘජු ප්‍රවේශය ලැබිණි.

# මූල්‍ය සමාලෝචනය 2012

## මූල්‍ය සමාලෝචනය 2012


ආයෝජන මණ්ඩලය විසින් ප්‍රථම වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුව කටයුතු කරන ලද්දේ වර්ෂ 2012දී වන අතර මූල්‍ය ප්‍රකාශයන්ට අවැසි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම, විස්තරාත්මක ආදායම,කොටස්වල වෙනස්වීම්, මුදල් ගලනය, මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සමඟ ආයෝජන මණ්ඩලයෙහි විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සකසා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී, මුදල් තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය 2011 ජනවාරි 1 දිනට සකසන ලද්දේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට මාරු වූ දිනයේ දීය.

ආයෝජන මණ්ඩලය විසින් පෙර වර්ෂයට සාපේක්ෂව 240%ක ශුද්ධ අතිරික්ත වර්ධනයක් සාක්ෂාත් කරගන්නා ලදී. සමාලෝචිත කාලය සඳහා ශුද්ධ අතිරික්තය රු. මිලියන 229.08කි.


## ආදායම

2012 වර්ෂයේදී රු.මිලියන 2,225.79 දක්වා ආයෝජන මණ්ඩලයේ ආදායම ඉහළ යන ලද අතර එය 2011 වසරට වඩා 10% ක වැඩි වීමකි. ආදායමට ප්‍රධාන දායකත්වය සපයන ආනයන/ අපනයන සේවා ගාස්තු 2011 සිට 2012 දක්වා රු. මිලියන 50.37කින්ද ගිණුම් වල 27% කින් මුළු ආදායමද ඉහල යන ලදී. 16% ක වැඩිවීමක් පෙන්වන බිම් කුලී වල වැඩි වීම රු. මිලියන 496.80 ක් දක්වා විය. මෙම වර්ධනයට හේතු වූයේ බිම් කුලී ඉහළ යාම, නව ගිවිසුම් අත්සන් කිරීම සහ මුදලේ වටිනාකම අඩුවීමයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මුළු ආයෝජන ආදායම රු. මිලියන 113.09ක් දක්වා, එනම් අදාළ කාල සීමාව තුළ 10% කින් අඩු විය. 2012 වර්ෂයේදී, මහා භාණ්ඩාගාරය වෙත රු. මිලියන 1,000ක් ප්‍රේෂණය කිරීමට සිදුවීම, ආයෝජන ආදායම පහත වැටීම සඳහා ප්‍රධාන හේතුව විය.




2008 - 2012 අතර පසුගිය වසර 5ක කාලය පුරා මෙහෙයුම් ආදායම ඉහළ ගොස් ඇත.





**මෙහෙයුම්, පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම්**

මූල්‍ය වර්ෂය තුළ, පෙර වර්ෂයට සාපේක්ෂව 2%කින් එනම් රු.මි.2,002.38 සිට රු. මිලියන 2040.96 දක්වා ආයෝජන මණ්ඩලයෙහි මෙහෙයුම්, පරිපාලන හා අනෙකුත් වියදම් ඉහළ යන ලදී. මෙම ඉහල යාම ප්‍රධාන වශයෙන් විදුලිය හා බලශක්ති පිරිවැය, කලාප නඩත්තුව හා ක්ෂය වීම් හේතුවෙන් සිදුවන ලදී.



2008 - 2012 දක්වා පසුගිය වසර 05ක කාලය පුරා මෙහෙයුම් වියදම් ඉහල ගොස් ඇත.




## රජයේ බදු සහ මූල්‍ය වියදම්


2012 වර්ෂයේදී යෙදවුම මත අගය එකතු කළ බදු සඳහා අවකාශයක් ලබා නොදුන් බැවින් 83%ක රජයේ බදු ඉහල යාමක් පෙන්නුම් කරන ලදී. මෙයට හේතු වන්නේ අපනයනකරුවන් සහ වක්‍ර අපනයනකරුවන් අගය එකතු කළ බදු වලින් නිදහස් කිරීමට ආයෝජන මණ්ඩලය විසින් ලබාදෙන සේවාවන් අගය එකතු කළ බදු පනතින් සංශෝධනය කිරීමයි. ආයෝජන මණ්ඩලය විසින් අගය එකතු කළ බදු ලෙස රුපියල් මිලියන 22.88ක් ගෙවන ලද අතර ආදායම් බදු ලෙස පවත්නා වර්ෂය සඳහා පොලී ආදායමින් රුපියල් මිලියන 28.96ක් ගෙවන ලදී.

මූල්‍ය වියදම් වල ඉහල යාමට හේතුව වන්නේ 2012 වර්ෂය තුළ මොටර් වාහන වල නව කල්බදු මත ගෙවන ලද පොලියයි.

## ප්‍රාග්ධන වියදම්

2012 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා වූ අයවැය වෙන් කිරීම රු. මිලියන1045.42 ක් වූ අතර අයවැයෙන් 73.51%ක් වූ රු. මිලියන 768.48ක ප්‍රමාණයක් 2012 දි ප්‍රාග්ධන වියදම් සඳහා වැය විය.

ආයෝජන මණ්ඩලය විසින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සියල්ල අභ්‍යන්තරයෙන් උත්පාදනය කරගත් අරමුදල් වලින් පියවා ගන්නා ලදී.



# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | As Per SLFRS/ LK AS 2012 රු. | As Per SLFRS/ LK AS 2011 රු. | As Per SLAS 2011 රු. |
|---|---|---|---|
| ආදායම | **2,226,369,460** | **2,004,951,097** | **2,004,951,097** |
| අඩුකිරීම්; වියදම් | | | |
| මෙහෙයුම් වියදම් | 230,057,542 | 214,566,544 | 214,566,544 |
| පරිපාලන වියදම් | 1,779,948,800 | 1,731,708,618 | 1,734,278,586 |
| රාජ්‍ය බදු | 47,814,539 | 26,126,211 | 26,126,211 |
| අනෙකුත් වියදම් | 30,949,090 | 56,108,109 | 56,108,109 |
| මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵල | **137,599,489** | **(23,558,385)** | **(26,128,353)** |
| මූල්‍ය ආදායම | 133,254,211 | 143,865,424 | 143,865,424 |
| මූල්‍ය වියදම | 2,768,533 | 1,205,215 | 1,205,215 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **130,485,678** | **142,660,209** | **142,660,209** |
| බදු වලට පෙර අතිරික්තය | **268,085,167** | **119,101,824** | **116,531,856** |
| බදු වියදම් | 28,960,401 | 32,935,760 | 32,935,760 |
| වර්ෂය සඳහා අතිරික්තය | **239,124,766** | **86,166,064** | **83,596,096** |

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා
සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

| | As Per SLFRS/ LK AS 2012 රු. | As Per SLFRS/ LK AS 2011 රු. | As Per SLAS 2011 රු. |
|---|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | **239,124,766** | **86,166,064** | **83,596,096** |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් තථ්‍ය (උපයාගත්) බැඳීම් මත අලාභ | 10,046,932 | 18,825,926 | - |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් | **10,046,932** | **18,825,926** | **-** |
| මුළු සවිස්තරාත්මක ආදායම | **229,077,834** | **67,340,138** | **83,596,096** |

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2012 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | As Per SLFRS/ LK AS 2012 | As Per SLFRS/ LK AS 2011 | As Per SLAS 2011 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, යන්ත්‍රාගාර, හා උපකරණ | 5,314,583,197 | 5,400,796,718 | 22,129,212,413 |
| ආයෝජන දේපල | 16,728,415,696 | 16,728,415,696 | - |
| ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු | 882,006,867 | 337,193,501 | 337,193,501 |
| මූල්‍ය වත්කම් | 428,647,715 | 417,977,046 | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | **23,353,653,475** | **22,884,382,961** | **22,466,405,914** |
| ජංගම වත්කම් | | | |
| ඉන්වෙන්ටරි | 14,135,711 | 12,507,390 | 12,507,390 |
| අපහරණය සඳහා වන නිවාස | 4,051,000 | 5,401,000 | 5,401,000 |
| මූල්‍ය වත්කම් | 147,908,417 | 125,737,074 | 537,597,974 |
| වෙළඳ ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල් | 209,093,547 | 186,819,821 | 353,720,292 |
| ඉදිරි ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 76,666,466 | 117,474,511 | 170,990,033 |
| මුදල් හා මුදල් සාමාන්‍යතා | 276,374,467 | 1,265,843,846 | 1,271,016,998 |
| **මුළු ජංගම වත්කම්** | **728,229,608** | **1,713,783,642** | **2,351,233,687** |
| මුළු වත්කම් | 24,081,883,083 | **24,598,166,603** | **24,817,639,601** |
| සාමාන්‍ය කොටස් සහ වගකීම් | | | |
| සාමාන්‍ය කොටස් | | | |
| සමුච්චිත අරමුදල | 6,528,728,331 | 7,362,128,981 | 7,457,162,441 |
| අරමුදල් හා සංචිත | 15,340,693,234 | 15,340,693,235 | 15,340,693,235 |
| | **21,869,421,565** | **22,702,822,216** | **22,797,855,676** |
| විලම්භිත ආදායම් | 1,792,358,277 | 1,636,483,595 | 1,636,483,595 |
| විලම්භිත වියදම් | (440,993,614) | (437,594,339) | (437,594,339) |
| | **1,351,364,664** | **1,198,889,256** | **1,198,889,256** |
| මුළු සාමාන්‍ය කොටස් | **23,220,786,229** | **23,901,711,472** | **23,996,744,932** |
| ජංගම නොවන වගකීම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා බැඳීම් | 200,458,966 | 176,006,875 | 300,446,413 |
| වසරකට පසුව එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 54,359,796 | - | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | **254,818,762** | **176,006,875** | **300,446,413** |
| ජංගම වගකීම් | | | |
| වසරක් තුළ එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 9,434,642 | - | - |
| උපචිත වියදම් හා ගෙවිය යුතු වෙනත් මුදල් | 589,761,254 | 512,974,438 | 512,974,438 |
| ගෙවිය යුතු බදු | 7,082,195 | 7,473,818 | 7,473,818 |
| **මුළු ජංගම වගකීම්** | **606,278,091** | **520,448,256** | **520,448,256** |
| **මුළු සාමාන්‍ය කොටස් හා වගකීම්** | **24,081,883,083** | **24,598,166,603** | **24,817,639,601** |

**මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.**

..............................................
**ආචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා,**
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

..............................................
එස්.පී. ද එස්. මුතුකුමාරණ මහත්මිය,
අධ්‍යක්ෂ (මූල්‍ය),
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 දෙසැම්බර් 31 වනදායින් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| (ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින් සියලුම ප්‍රමාණ දැක්වේ) | 2012<br>රු. |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය | |
| මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල් (27.1 සටහන) | 844.03 |
| ගෙවූ ආදායම් බදු | (29.35) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ගෙවීම | (13.16) |
| පසුගිය වර්ෂය සඳහා ගැළපීම් | (43.54) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්** | **757.98** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහයන් | |
| ආයෝජන ආදායම | 132.11 |
| ස්ථාවර වත්කම් මිල දී ගැනීම | (106.65) |
| ස්ථාවර වත්කම් විකිණීම් උත්පාදන | 9.40 |
| ස්ථාවර තැන්පතු | (0.22) |
| මහා පරිමාණ ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (8.00) |
| ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු | (732.37) |
| විශේෂ ව්‍යාපෘති | (18.12) |
| විලම්භිත වියදම් | (21.44) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්** | **(745.30)** |
| මූල්‍යකරණ කටයුතුවලින් මුදල් ප්‍රවාහයන් | |
| මහා භාණ්ඩාගාරයට මාරු කරන ලද අරමුදල් | (1,000.00) |
| පොළී ගෙවීම් | (2.15) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම්/ ගලා යෑම්** | **(1,002.15)** |
| මුදල් සහ මුදල් සාමාන්‍යතාවල ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්) | (989.47) |
| වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සාමාන්‍යතා | 1,265.84 |
| **වසර අවසානයේ දී මුදල් හා මුදල් සාමාන්‍යතා** | **276.37** |

## මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 1. වාර්තාකරණ ආයතනය

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්ථාපනය කර තිබේ. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය කොළඹ 01 ඇචිලන් චතුරස්‍රයෙහි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ පිහිටා තිබේ.

### 2. පිළියෙල කිරීමේ පදනම

#### 2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරනු ලැබූ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට (SLAS) අනුකූලව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් සහිතව සටහන් පිළියෙල කර තිබේ.

#### 2.2 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS)/ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) ප්‍රථම වරට යොදා ගැනීම.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් (LKAS 1) නිර්වචනය කර ඇති පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබීය. ඓතිහාසික පිරිවැය ප්‍රමිතිය භාවිත කරමින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

මේ දක්වා ගත වූ සෑම කාලසීමාවක් සඳහා මෙන්ම 2011 දෙසැම්බර් 31 වනදායින් අවසන් වන වසර ද ඇතුළත්ව සාමාන්‍යයෙන් පිළිගත් දේශීය ගිණුම්කරණ පරිචය (SLAS) ට අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබීය. 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට (SLFRS) අනුව පිළියෙල කර තිබේ.

ඒ අනුව, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කර ඇති පරිදි 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර වන විට හා එම වසර සඳහා සංසන්දනාත්මක කාලසීමා දත්ත ද ඇතුළත්ව 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවට අදාළවන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට (SLFRS) අනුකූලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබීය. මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) අනුගමනය කිරීම ආරම්භ කළ දිනය වන 2011 ජනවාරි 1 වනදා වන විට මූල්‍ය තත්වය පිළිබඳ මණ්ඩලයේ ආරම්භක ප්‍රකාශය පිළියෙළ කරනු ලැබීය.

අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට පළමුවර අනුගත වීම යන 1 වන ශ්‍රී ලං.මූ.වා. ප්‍රමිතිය (SLFRS1) මගින් පසුගිය කාලසීමාව සඳහා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අවශ්‍ය වන පරිදි සංශෝධනය කරනු ලැබීය.

#### 2.3 ඇස්තමේන්තු, විනිශ්චයන් හා උපකල්පනයන් භාවිත කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී, එහි කළමනාකාරීත්වය විසින් වාර්තා කරන දිනට ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් මෙන්ම අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම පිළිබඳ වාර්තා කරනු ලැබූ ප්‍රමාණවලට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදු කළ යුතුය. මෙම ඇස්තමේන්තු හා අවධාරණය කරනු ලැබූ උපකල්පනයන් පවත්නා පදනම මත සමාලෝචනය කෙරේ. කෙසේ වුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අනියතතාව තුළින් අනාගතයේදී බලපෑමට ලක් විය හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ ප්‍රමාණයට ද්‍රව්‍යමය ගැළපීම් සිදු කිරීම අවශ්‍ය වන ප්‍රතිඵල ලැබිය හැකිය.

### 2.4 ව්‍යාපාර සාර්ථකත්වය

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී, සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් එය ඇගයීමට ලක් කර තිබේ. අනාගත මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා මෙම ආයෝජන මණ්ඩලයට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට සාධාරණ අපේක්ෂාවක් ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය සතු වේ. අනාගතය පිළිබඳ ලබාගත හැකි සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ නවතා දැමීමේ අවශ්‍යතාව ආයෝජන මණ්ඩලයට නොමැත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ව්‍යාපාරික සාර්ථකත්වය මත අඛණ්ඩව කටයුතු කිරීමේ පදනම අනුගමනය කිරීමට ආයෝජන මණ්ඩලය කටයුතු කරයි.

### 2.5 ව්‍යවහාර කරන මුදල් වර්ගය සහ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

ආයෝජන මණ්ඩලය මගින් ව්‍යවහාර කරන මුදල් වර්ගය ශ්‍රී ලංකා රුපියල් ලෙස තීරණය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශ ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ.

## 3 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 මූල්‍ය වත්කම්

ණය හා ලැබිය යුතු මුදල් හා කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන ලෙස ආයෝජන මණ්ඩලය එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී කළමනාකාරීත්වය මගින් මෙම වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබන අතර ආයෝජන සිදු කිරීමේ හා ආයෝජන ලබා ගැනීමේ අරමුණ මත එය පදනම් වේ.

(අ) වර්ගීකරණය

(i) ණය හා ලැබිය යුතු මුදල්
ණය හා ලැබිය යුතු මුදල් හා සක්‍රීය වෙළඳපොළකදී මිල සඳහන් කර නොමැති ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමඟ ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වේ.

(ii) කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන
කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන යනු ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමඟ ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වන අතර ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වයට කල් පිරෙන තෙක් තබා ගැනීම පිළිබඳව ධනාත්මක අභිප්‍රායක් හා හැකියාවක් ඇති ස්ථාවර කල් පිරීම් වේ.

(ආ) හානිකරණය

සිදුවිය හැකි හානිකරණයක් පිළිබඳ යම් හැඟවීමක් තිබේදැයි නිර්ණය කිරීම සඳහා මූල්‍ය වත්කම් එක් එක් ශේෂ පත්‍ර දිනයේ දී සමාලෝචනය කරයි. එසේ යම් හානිකරණයක් තිබේ නම් වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳව තක්සේරු කරනු ලැබේ.

වත්කමක ධාරණ ප්‍රමාණය හෝ එම වත්කමේ මුදල් උත්පාදන ඒකක වත්කමේ අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට හානිකරණ පාඩු හඳුනා ගත හැකිය. ආදායම් ප්‍රකාශය මගින් හානිකරණ පාඩු හඳුනා ගත හැකිය.

(ඇ) නැවත හඳුනා ගැනීම

පූර්ව කාලසීමාවලදී හඳුනා ගන්නා ලද හානිකරණ පාඩු අඩු වී ඇති බව හෝ තවදුරටත් නොපවතින බව හෝ හඳුනා ගැනීම පිණිස යම් හැඟවීමක් තිබේදැයි තක්සේරු කර ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේ දී ඇගයීමට ලක් කරනු ලැබේ. නැවත ගෙවිය හැකි මුදල නිර්ණය කිරීමට භාවිතා කරනු ලබන තක්සේරු කිරීම්වල වෙනසක් තිබීම මගින් හානිකරණ පාඩු නැවත හඳුනා ගැනේ.

### 3.2 දේපල, පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

දේපළ , පිරියත සහ උපකරණ තක්සේරු කිරීමේදී එහි අගයෙන් 2011 ජනවාරි 1 වන දිනට සමුච්චිත ක්ෂය කිරීම් අඩු කොට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව 2011 ජනවාරි 1 වන දින වන විට එහි පිරිවැය ලෙස සැලකේ .

(ආ) ක්ෂය වීම්

ක්ෂය වීම් සඳහා වෙන් කිරීම් ගණනය කරනුයේ දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය/ තක්සේරුකරණය පිළිබඳ සරල -ඊජීය පදනමිනි. ඉඩම හැර දේපළ සහ උපකරණ සියල්ල ඵලදායී ජීවිත කාලය පුරා වාර්ෂිකව ක්ෂය වී ඇත.

| | 2012 | 2011 |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | වසර 20 | වසර 20 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | වසර 10 | වසර 10 |
| සවිකිරීම් හා ඒකලස් කිරීම් | වසර 10 | වසර 10 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | වසර 10 | වසර 10 |
| පරිගණක | වසර 3 | වසර 3 |
| මෝටර් වාහන | වසර 5 | වසර 5 |

මිලදී ගත් වර්ෂයේදී ස්ථාවර වත්කම් මත ක්ෂය කිරීම් අය නොකරන අතර අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් අය කෙරේ.

(ඇ) නැවත හඳුනා ගැනීම

අපහරණය කිරීමේදී හෝ දේපළ හා උපකරණ භාවිත කිරීමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් නොමැති විට අයිතම නැවත හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක් නැවත හඳුනා ගැනීම මගින් ඇතිවන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ විකුණුම්වලින් ලත් මුදල් සහ වත්කමෙහි ධාරණ ප්‍රමාණය අතර වෙනස මත වන අතර එය ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

(ඈ) ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු

වර්ෂය තුළ ඇතිවූ ශේෂ පත්‍ර දිනයට සම්පූර්ණ නොකරන ලද ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු වශයෙන් හඳුන්වනු ලබන අතර වර්ෂය තුළ සම්පූර්ණ කළ සහ භාවිතය සඳහා ගත හැකි ඇති ප්‍රාග්ධන වත්කම් සියල්ල දේපළ, පිරියත සහ උපකරණ ගිණුමට මාරු කර ඇත.

(ඉ) කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගත් වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර අනුකූල මූල්‍ය ශක්‍යතාවෙන් යුතු බවට හඳුනාගෙන කල්බදු දුන් මෝටර් වාහන ප්‍රවර්ගය යටතට ඇතුළත් කරනු ලැබීය. මූල්‍ය කල්බදු යටතේ තබා ගන්නා වත්කම් ඒවා භාවිතා කරන කාල සීමාව මුළුල්ලේම ක්ෂය කරනු ලැබේ.

### 3.3 ආයෝජන දේපල

ආයෝජන දේපළ යටතේ ඒකී වත්කම් වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැයට ආයෝජන දේපළ දැක්වේ.

3.4 **ඉන්වෙන්ටරි**

සියලු ඉන්වෙන්ටරි අඩු පිරිවැයකට හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයකට තක්සේරු කර ඇත. පළමුව ඇතුළු වීම් පළමුව පිටවීම් පදනමින් (FIFO) පිරිවැය තීරණය කරනු ලැබේ.

3.5 **අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් වලට අයත් වන්නේ අනෙකුත් ණය ගැතියෝ, ලැබිය යුතු මුදල් අත්තිකාරම්, තැන්පතු සහ පූර්ව ගෙවීම්ය.

(අ) අත්තිකාරම්, තැන්පතු. කලින් ගෙවූ වියදම්

අත්තිකාරම්, තැන්පතු සහ කලින් ගෙවූ වියදම් යනු එක් මූල්‍ය වර්ෂයකට වැඩි ගණනකට ප්‍රතිලාභ හෝ සබඳතා පවතින වියදම්ය. එබදු වියදම් කාල ප්‍රමාණන පදනමකින් යුතුව අදාළ කාලයෙන් පසුව කපාහරින ඒවාය.

(ආ) අනෙකුත් ණයගැතියෝ

අනෙකුත් ණය ගැතියෝ හඳුනාගනුයේ පිරිවැයෙන් හානිකරණ අලාභ අඩු කිරීමෙනි.

3.6 **මුදල් හා මුදල් සාම්‍යතා**

මුදල් හා මුදල් සාම්‍යතා වලට අයත් වන්නේ අතැති මුදල් සහ දන්නා මුදල් ප්‍රමාණයකට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටි-කාලීන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජනයන් වන අතර අගයේ වෙනස්කම් ඇති වීමෙහි විශේෂ / කැපී පෙනෙන අවදානමකට නිරාවරිත ආයෝජනයන්ය. මේවා කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරාලීම පිණිස පවතී.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ
මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ අංක 7 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුව වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කර ඇත.

3.7 **සේවක ප්‍රතිලාභ**

(අ) නිර්වචිත දායකත්ව සැලසුම්

එක් එක් ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල (EPF) සදහා මෙන්ම සේවක භාරකාර අරමුදල (ETF) සදහා දායකත්වය ලබාදීමට සුදුසුකම් ලබති. ආයෝජන මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ වැටුපෙන් ස්ථාවර දායකත්වයන් සපයනු ලබන අතර තවදුරටත් ගෙවීම් සිදුකිරීමට නෛතික හෝ අනුමිත බැඳීමක් හෝ නොමැත.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් හැර පසු රැකියා සැලසුම්ය. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ නීති ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳේ. ආයුෂ ගණක තක්සේරුකරණයක් පදනම් කර ගනිමින් පනත යටතේ පවතින බැඳීම් සඳහා වෙන්කිරීම් පිළිබදව තීරණය කෙරේ.

3.8 **වගකීම් සහ ප්‍රතිපාදන**

ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත වන සම්පත් බාහිරව ගලායාමකට මගපාදන්නේ යැයි අපේක්ෂා කරන පසුගිය ස්ථාපිත සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික/ අනුමිත බැඳීමක් පවත්නා විට ශේෂ පත්‍රයෙහි වගකීම් හා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. ණය හිමියාගේ ඉල්ලීම පරිදි ගෙවිය යුතු බැඳීම් හෝ ශේෂ පත්‍ර

දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍ර දිනකට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ. (මූල්‍ය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය)

වෙනත් වගකීම්
වෙනත් වගකීම්වලට උපචිත වියදම් ද ඇතුළුව වෙනත් ණයහිමියන් ද ඇතුළත් වේ. වෙනත් වගකීම් ඒවායේ සාධාරණ අගය ලෙස සලකනු ලබන ඓතිහාසික අගයෙහි සඳහන් වේ.

### 3.9 ආදායම් හඳුනාගැනීම්

(අ) අය භාරය
සේවා/ ගාස්තුවලින් ලබාගන්නා ආදායම ලැබුණු හෝ ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයෙන් තක්සේරු කරනු ලැබේ. බලපත්‍ර ගාස්තු හෝ ගිවිසුම් සැකසීමේ ගාස්තු මුදල් පදනම මත හඳුනාගැනේ.

(ආ) පොළී ආදායම්
ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය තක්සේරු කරනු ලබන මූල්‍ය උපකාරක ඇතුළත්ව පොළියක් ලැබෙන මූල්‍ය උපකාරක සඳහා පොළී ආදායම්, ආදායම් ප්‍රකාශයේ " මූල්‍ය ආදායම " තුළ හඳුනා ගැනේ.

(ඇ) වෙනත් ආදායම්
වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

### 3.10. වියදම්

වියදම් හදුනා ගැනීම

(අ) අයභාර වැය
මෙම වියදම් අදාළ වන කාලසීමාව තුළ දී ලබා දී ඇති හා හඳුනාගෙන ඇති ප්‍රතිශ්ඨාවල සාධාරණ අගයෙන් සියලුම වියදම් තක්සේරු කරනු ලැබේ. අතිරික්තය වන්නේ දන්නා සියලුම වගකීම් සඳහා මෙන්ම දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්වලින් අනතුරුව ඉතිරි වන මුදල් ප්‍රමාණයයි.

(ආ) ප්‍රාග්ධන වියදම්
සංවිධානය පවත්වාගෙන යාමේ අරමුණින් හෝ සංවිධානයේ සේවා/ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් හෝ ස්ථිර ස්වභාවයේ වත්කම් ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැය කරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස හැදින්වේ .

### 3.11. බදු පැනවීම

මූල්‍ය ප්‍රකාශයේ වාර්තා කර ඇති පරිදි පොළී ආදායමේ අංග මත ආදායම් බදු පනවනු ලබන අතර 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ විධිවිධානවලට අනුව එය ගණනය කෙරේ. ඉන් ලාභ හා පොළියෙන් ලැබෙන ආදායම් හැර ලාභ හා ආදායම මත පනවනු ලැබූ ආදායම් බද්දෙන් මෙම මණ්ඩලය නිදහස් කර ඇත.

### 3.12. අසම්භාව්‍ය වගකීම්

පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇතිවිය හැකි අනාගත වගකීම් තිබේ නම් හෝ පසුගිය වැඩිවීමක් හේතුවෙන් ගෙවීම අපේක්ෂා කළ නොහැකි විට හෝ ප්‍රමාණය සාධාරණ ලෙස තක්සේරු කළ නොහැකි විට හෝ වර්තමාන ගෙවීමක් ඇති විට හෝ අසම්භාව්‍ය වගකීම් අනාවරණය වේ.

## අදාළ පාර්ශ්ව පිළිබඳ හෙළි කිරීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හා අදාළ වන පාර්ශ්වයන් සමඟ ඔහු ගනුදෙනු නොකරන බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා/ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩෝ මහතා සඳහන් කර ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන සංජීව වික්‍රමනායක මහතා වෙත පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සම්බන්ධ පාලනය හා /හෝ සුවිශේෂී බලපෑම් කිරීමේ හැකියාවක් පැවතුණි.

(අ) ඊ-ඩබ් ඉන්ෆෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ්.,
(ආ) එච්ස් පෙරිපෙරල්ස් (පුද්) සමාගම.,
(ඇ) ඕපන් සිස්ටම්ස් ඉන්ටිග්‍රේටස් (පුද්) සමාගම.,
(ඈ) ටොපෑන් ෆෝම්ස් (කළම්බු) ලිමිටඩ්.,

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන ඒශන ද සිල්වා මහතා වෙත පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සම්බන්ධ පාලනය හා /හෝ සුවිශේෂී බලපෑම් කිරීමේ හැකියාවක් පැවතුණි.

(අ) මෙලන්ක පවර් මොරකැටිය (පුද්) සමාගම.,
(ආ) විදුල් මදුගෙට (පුද්) සමාගම.,
(ඇ) ජ්ලම්බාගෝ ලංකා (පුද්) සමාගම.,

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හා අදාළ වන පාර්ශ්වයන් සමඟ ඔහු ගනුදෙනු නොකරන බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාමාජිකයෙකු වන අනුර ජයසිංහ මහතා සඳහන් කර ඇත.

අසම්භාව්‍ය වගකීම්
හොරණ අපනයන සැකසුම් කලාපයේ නිෂ්පාදන කම්හලක් ස්ථාපනය කර ඇති එම්/එස් මර්බොක් එම්ඩ්එෆ් ලංකා (පුද්) සමාගම සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මෙම ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ අය ක්‍රමය 6.9% වාර්ෂික වැල් පොළි අනුපාතයට වඩා වැඩි වූ අවස්ථාවල මෙම සමාගම වෙත හානිපූරණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳී සිටී. බේරුම්කිරීමේ තීරණය අනුව 2007 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා ගෙවිය යුතු රු.356,793,568.21 සමඟ අදාළ පොළිය ගෙවීමට නියෝග කර ඇති අතර අවශ්‍ය කටයුතු සඳහා යොමු කර තිබේ.

අන්තර්ජාතික බේරුම්කරණ නියෝගය ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබේ.

ජාත්‍යන්තර තත්වයේ ගොල්ෆ් පිටියක්, රිය ධාවන අංගණයක්, ක්‍රීඩා සමාජ, ක්‍රීඩා හා විවේකය හා ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොකුරු බද්ධ නිවාස ඉදිකිරීමේ හා මෙහෙයවීමේ ව්‍යාපාරය සදහා ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සදහා ඒෂියා පැසිෆික් ගොල්ෆ් කෝස් ලිමිටඩ් ආයතනය සමඟ 2001.06.21 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

2008 ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව, එකී ව්‍යාපාර ආයතනය වෙනුවෙන් පෙනීසිටින සිංගප්පූරුවේ පිහිටි නෛතික ව්‍යාපාර ආයතනය වන ඇක්විටාස් ලෝ එල්.එල්.පී. ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් රු.19,191,381,000.00 ක වන්දියක් ඉල්ලා තිබේ. ඉහත කරුණ සම්බන්ධයෙන් බේරුම්කරණ නීති කෘත්‍ය සිංගප්පූරුවේදී ආරම්භ වී තිබේ .

තීරණ බලාපොරොත්තුවෙන් තවදුරටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින නඩු 66 ක් තිබෙන අතර එවැනි නඩු කීම්වල තථ්‍ය වගකීම් පිළිබඳව නිවැරදිව තහවුරු කළ නොහැකිය.

බියගම අපනයන සැකසුම් කලාපයෙහි මුදල් ඌනතාවක් ලෙස රු. 507,650.00ක මුළු අගයක් වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දැක්වේ. අදාළ නඩුව සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතියි.

# විගණන වාර්තාව

**2012.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ**
**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර**
**විගණකාධිපති වාර්තාව**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No } විසී/පී/බීඕඅයි/එෆ්ජ්/2012
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2013 නොවැම්බර් 22 දින

සභාපති,

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2013 අගෝස්තු 06 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම

-------------------------------------------------------------

(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර .40

---------------

විශ්වාසනීය ලෙස මැනිය හැකි හා අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා පවත්වාගත හැකි ගොඩනැඟිලි වටිනාකම ආයෝජන දේපලක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර .39

--------------

රු.509,922,787 ක් වූ සේවක ණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණද, එය ඵලදායී පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් 2012 දෙසැම්බර් 31 දිනට ක්‍රම ක්ෂය පිරිවැයට ප්‍රමාණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

වටිනාකම රු.293,829,237ක් වූ සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්තු අදාළ වත්කම් ගිණුම්වලට මාරු කිරීම වෙනුවට 2012 දෙසැම්බර් 31 දිනට කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

3

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ව්‍යාපාර ආයතනවලින් ලැබිය යුතු ශේෂ

---------------------------------------------

ශේෂපත්‍ර දිනට ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපාරවලින් ලැබිය යුතු ශේෂ, හානිකරණය සඳහා ප්‍රතිපාදනය හා ඒමත ලියාහරින ලද බොල් ණය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපාර ආයතන වලින් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු හිඟ මුදල් | 701,884,118 | 623,861,381 | 631,911,594 | 593,483,063 | 539,768,967 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 492,790,570 | 437,041,560 | 249,452,238 | 227,775,883 | 199,355,398 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය මුළු හිඟ මුදල් වල ප්‍රතිශතයක් ලෙස | 70% | 70% | 39% | 38% | 37% |
| වර්ෂය තුළ ලියා හරින ලද බොල් ණය | 5,517,032 | 73,113,266 | 8,306,417 | 9,279,995 | 8,994,408 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂ 05 තුළ ව්‍යාපාර ආයතනවලින් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු හිඟ මුදල් මත හානිකරණය සඳහා ප්‍රතිපාදන 2008 දී සියයට 37 සිට 2012 දී සියයට 70 දක්වා සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු හෙයින් ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම දුර්වල බව දක්නට ලැබුණි.

4

(ii) හානිකරණය සඳහා රු.492,790,570ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, රු.472,348,646ක් එනම් සියයට 96 ක හානිකරණ ප්‍රතිපාදනය අවලංගු කරන ලද හා වසා දමන ලද ව්‍යාපෘති සඳහා 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ මත සියයට 100ක් නියෝජනය විය.

**(iii)** හානිකරණය සඳහා ප්‍රතිපාදනය රු.210,335,393ක් වාර්ෂික ගාස්තු වෙනුවෙන් සිදුකර තිබුණු අතර එය රු.245,726,709ක් වූ මුළු වාර්ෂික ගාස්තු වලින් සියයට 86 කි.

**(ආ) වෙනත් ණයගැතියන්**

-----------------------

ආයෝජන මණ්ඩලයේ වෙනත් ණයගැතියන්ගේ දිගුකාලීනව හිඟ හිටි ශේෂ සහ ශේෂ පත්‍ර දිනයට හානිකරණය සඳහා ප්‍රතිපාදනය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ තුන සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වෙනත් ණයගැතියන් | 66,891,763 | 61,204,152 | 103,810,214 | 102,967,791 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 61,204,152 | 7,688,630 | 48,234,339 | 48,171,157 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස | 91.5% | 12% | 46% | 47% |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වෙනත් ණයගැතියන් මත හානිකරණය සියයට 91.5ක් නියෝජනය වූ බැවින් ලැබිය යුතු හිඟ මුදල් පිළිබඳ දුර්වල අයකර ගැනීම එයින් දැක්වුණි.

(ii) වර්ෂය අවසානයට රු.66,891,763ක් වූ වෙනත් මුළු ණයගැතියන්ගෙන් , සියයට 87ක් එනම් රු.58,441,942ක් රජයේ ආයතන පහකින් ලැබිය යුතු වර්ෂ හතරකට වැඩි කාලයක් ඉක්මවූ ශේෂ වලින් නියෝජනය විය. කෙසේ වුවද එම රජයේ ආයතනවලින් ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට ආයෝජන මණ්ඩලය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.2.4 නීති , රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව සේවකයින්ගෙන් අයකර ගැනීම වෙනුවට ආයෝජන මණ්ඩලයේ අරමුදල්වලින් 1997 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු රු.155,847,565ක් ගෙවා තිබුණි. |
| (ආ) | 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 10(3) වගන්තිය | එකී පනත් ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වයද සමඟ ලබාගත යුතු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ආයෝජන මණ්ඩලය විසින් කාර්ය මණ්ඩල යහ සාධක අරමුදලක් පවත්වා ගෙන ගොස් තිබුණි. |
| (ඇ) | 2003 මැයි 28 දිනැති අංක පීඊඩී /10 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව ආයෝජන මණ්ඩලය විසින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය (VRS) යටතේ විශ්‍රාම ගිය සේවකයන් සඳහා සියයට 5ක විශේෂ දීමනාව, ජීවනාධාර දීමනා, පැමිණීමේ දිරි දීමනාව, වැඩ බැලීම සඳහා දීමනා, ඉන්ධන දීමනා, වෘත්තීය දීමනා, වාර්ෂික නිවාඩු, රියදුරු දීමනා ආදි සියළු දීමනා ඇතුළත්ව වන්දි ගෙවීම ගණනය කර තිබුණි. |
| (ඈ) | 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඉන්ධන දීමනා සහිතව රු.30,000ක මාසික ප්‍රවාහන දීමනාව ලබාගන්නා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව රු.15,000ක රියදුරු දීමනාවද ලබාගෙන තිබුණි. |

6

| | | |
|---|---|---|
| (ඉ) | 2006 ඔක්තෝබර් 09 දිනැති අංක පීඊඩී/39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 ඡේදය සහ 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය | ආයෝජන මණ්ඩලය විසින් කල්බදු වාහන වල අයිතිය නිලධාරීන් 13 දෙනෙකුට ඔවුන් විශ්‍රාම යාමේදී අවශේෂ වටිනාකමට පවරා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වාහන වල අයිතිය මාරු කිරීම දක්වා රු.45,498,876ක පාඩුවක් ආයෝජන මණ්ඩලයට සිදු වී තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.268,085,167ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.119,101,824ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.148,983,343ක එනම් සියයට 125ක වැඩිවීමක් දැක්වුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගිවිසුම් සැකසුම් ගාස්තු , වාර්ෂික ගාස්තු, බිම් කුලී සහ ඉඩම් වාරික වැඩිවීම හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ ආදායම සියයට 11කින් වැඩිවී තිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය විසින් රු.137,599,489ක මෙහෙයුම් ලාභයක් උපයාගෙන තිබූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.23,558,385ක් වූ හෙයින් රු.161,579,647කින් මෙහෙයුම් ලාභයේ වැඩිවීමක් දැක්වුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්ත සහ ඉකුත් වර්ෂයේ ඊට අනුරූපි සංඛ්‍යා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | 2012 | 2011 |
| | Rs. | Rs. |
| මෙහෙයුම් ආදායම | 2,226,369,460 | 2,004,951,097 |
| අඩුකළා : මෙහෙයුම් වියදම | (2,088,769,971) | (2,028,509,481) |
| මෙහෙයුම් අතිරික්තය / (පාඩුව ) | 137,599,489 | (23,558,385) |
| ශුද්ධ මූල්‍ය ආදායම | 130,485,678 | 142,660,209 |
| බදු වලට පෙර අතිරික්තය | 268,085,167 | 119,101,824 |
| අඩුකළා : පොලී ආදායම මත බදු | (28,960,401) | (32,935,760) |
| බදු වලට පසු අතිරික්තය | 239,124,766 | 86,166,064 |
| එකතුකළා : වෙනත් විස්තීරණ ආදායම | | |
| බැදීම මත ආයුගණක (පාඩුව ) / ලාභය | (10,046,932) | 18,825,926 |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | **229,077,834** | **67,340,138** |

8

(ආ) අපනයන සැලසුම් කලාප, අපනයන සැකසුම් උද්‍යාන, කාර්මික උද්‍යාන, ප්‍රාදේශීය කාර්යාල හා නව ආර්ථික කලාප පිළිබඳ මූල්‍ය සමාලෝචනය පහත දැක්වේ.

| සංරචකය | ආදායම | මෙහෙයුම් වියදම් | මෙහෙයුම් ලාභය | % | බදු වලට පසු ලාභය | % |
|---|---|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | | රු.(000) | |
| ප්‍රධාන කාර්යාලය | 588,477 | 894,683 | (306,206) | ( 52%) | (212,671) | (36%) |
| <u>අපනයන සැකසුම් කලාප</u> | | | | | | |
| කටුනායක | 512,710 | 392,814 | 119,896 | 23% | 122,412 | 24% |
| බියගම | 344,928 | 272,768 | 72,160 | 21% | 74,283 | 22% |
| සීතාවක | 280,027 | 129,389 | 150,638 | 54% | 151,083 | 54% |
| මීරිගම | 31,155 | 37,940 | (6,785) | (22%) | (6,666) | (21%) |
| වතුපිටිවල | 40,656 | 48,795 | (8,139) | (20%) | (7,873) | (19%) |
| හොරණ | 138,611 | 75,008 | 63,603 | 46% | 63,743 | 46% |
| මාවතගම | 33,667 | 24,007 | 9,660 | 29% | 9,750 | 29% |
| පොල්ගහවෙල | 36,305 | 16,131 | 20,174 | 56% | 20,222 | 56% |
| කොග්ගල | 91,129 | 104,071 | (12,942) | (14%) | (12,105) | (13%) |
| <u>අපනයන සැකසුම් උද්‍යාන</u> | | | | | | |
| මල්වත්ත | 12,992 | 18,601 | (5,609) | (43%) | (5,553) | (43%) |
| <u>කාර්මික උද්‍යාන</u> | | | | | | |
| මහනුවර | 92,892 | 49,751 | 43,141 | 46% | 43,876 | 47% |
| මිරිජ්ජවිල | 2,394 | 1,915 | 479 | 20% | 479 | 20% |
| <u>ප්‍රාදේශීය කාර්යාල</u> | | | | | | |
| වයඹ | 4,521 | 27,004 | (22,483) | (497%) | (21,881) | (484%) |
| නැගෙනහිර | 23,630 | 3,619 | 20,011 | 85% | 20,024 | 85% |
| එකතුව | 2,234,103 | 2,096,503 | 137,599 | | (1,821,304) | |

9

ආයෝජන මණ්ඩලය විසින් අපනයන සැකසුම් කලාප ( EPZ ) 9ක් , අපනයන සැකසුම් උද්‍යානයක් ( EPP ) , කාර්මික උද්‍යාන ( IP ) 2ක් හා ප්‍රාදේශීය කාර්යාල ( RO ) 2ක් මගින් එහි කටයුතු සිදුකර තිබුණි. ඉහත තොරතුරු අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් ලාභය පසුගිය වර්ෂ තුනකදී සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් පාඩුවක් දරා තිබුණි.

| වර්ෂය | ලාභය / පාඩුව |
|---|---|
| | රු. |
| 2009 | 55,205 |
| 2010 | 45,582 |
| 2011 | 12,735 |
| 2012 | (306,206) |

(ii) විශාල පරිපාලන පිරිවැය හේතුවෙන් අපනයන සැකසුම් කලාපය හා අපනයන සැකසුම් උද්‍යාන 3 2007 සිට 2012 දක්වා අඛණ්ඩව පාඩු දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|
| <u>අපනයන සැකසුම් කලාප</u> | | | | | | |
| **මීරිගම** | (6,620) | (11,418) | (11,584) | (18,720) | (22,978) | (16,624) |
| **වතුපිටිවල** | (7,766) | (15,743) | (13,703) | (12,787) | (11,872) | (18,214) |
| **කොග්ගල** | (11,775) | (26,980) | (17,503) | (23,149) | (23,412) | (42,364) |
| <u>අපනයන සැකසුම් උද්‍යාන</u> | | | | | | |
| **මල්වත්ත** | (5,531) | (3,226) | (3,458) | (3,639) | (2,576) | (6,237) |

**3.3.** කාරක ප්‍රාග්ධනය කළමනාකරණය

| (අ) <u>ද්‍රවශීලතා අනුපාත</u> | <u>2012</u> | <u>2011</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|---|
| ජංගම අනුපාතය - තථ්‍ය | 1.2 | 3.29 | ජංගම අනුපාතයේ විශාල අඩුවීම හා |
| සම්මත | 2 | 2 | ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොතිබීම. |

10

(ආ) <u>ක්‍රියාකාරි අනුපාත</u>

| | | | |
|---|---|---|---|
| ණයගැති පිරිවැටුම් අනුපාතය - වාර | 3.17 | 3.27 | ණය අයකර ගැනීම සතුටුදායක මට්ටමක නොවීය. |
| ණයගැති පිරිවැටුම් කාලය - දින | 115 | 113 | දුර්වල ණය අයකර ගැනීම |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 ආයෝජන මණ්ඩල ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අත්සන් කරන ලද ව්‍යාපෘති , මුළු අවලංගු කරන ලද සහ වසා දමන ලද හෝ අත් හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සහ ප්‍රතිශතය 2010 වර්ෂය සහ ඉකුත් වර්ෂ 10 තුළ ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සමඟ සසඳා පහත දැක්වේ.

| | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති √1 | අවලංගු කරන ලද ව්‍යාපෘති √2 | වසා දමන ලද හා අත්හිටුවන ලද ව්‍යාපෘති √3 | අවලංගු කරන ලද වසා දමන ලද හා අත්හිටුවන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2002 | 202 | 68 | 3 | 71 |
| 2003 | 272 | 55 | 3 | 58 |
| 2004 | 274 | 75 | 7 | 82 |
| 2005 | 208 | 121 | 8 | 129 |
| 2006 | 258 | 113 | 14 | 127 |
| 2007 | 310 | 119 | 18 | 137 |
| 2008 | 252 | 107 | 22 | 129 |
| 2009 | 182 | 93 | 33 | 126 |
| 2010 | 269 | 124 | 61 | 185 |
| 2011 | 165 | 47 | 20 | 67 |
| 2012 | 171 | 80 | 42 | 122 |
| එකතුව | 2,563 | 1002 | 231 | 1,233 |

11

√1 ගිවිසුම් අවලංගු කළ / වසා දමන ලද / මෙහෙයුම් අත්හිටවූ ව්‍යාපෘති සහ පුළුල් කිරීම ඇතුලත්ව

√2 වාණිජ මෙහෙයුම් ආරම්භ කළ පසු ගිවිසුම් අවලංගු කළ (පුළුල් කිරීම් අවලංගු කිරීම් ඇතුළත් නැත .)

√3 වසා දමන ලද /වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු අත්හිටුවන ලද (වසා නොදමන ලද / පුළුල් කිරීම අත්හිටුවන ලද ඇතුළත් නැත .)

(i) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී අවලංගු කරන ලද , වසා දමන ලද හා අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 82 කින් වැඩිවී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කිරීම් සංඛ්‍යාව 163 දක්වා පහත වැටී තිබූ අතර එය පසුගිය වර්ෂ 10 සමඟ සැසඳීමේදී අඩුම ලියාපදිංචිවීම විය.

(iii) 2010 සිට 2012 කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති 123ක් හෙවත් සියයට 53ක් වසාදමා හා අත්හිටුවා තිබුණි.

(ආ) 2006 සිට 2012 කාල පරිච්ඡේදය තුළ ආයොජන මණ්ඩලය මඟින් කරන ලද විදේශීය සෘජු ආයෝජනයන් හා දේශීය ලාභ ලබන ආයෝජනයන් පහත දැක්වේ.

| වර්ෂය | විදේශ සෘජු ආයෝජන (FDI) | දේශීය උපලබ්ධි ආයෝජන |
|---|---|---|
| | එජඩො මිලියන | එජඩො මිලියන |
| 2006 | 603 | 400 |
| 2007 | 734 | 490 |
| 2008 | 888 | 226 |
| 2009 | 601 | 151 |
| 2010 | 516 | 433 |
| 2011 | 1066 | 426 |
| 2012 | 1338 | 608 |

විදේශීය සෘජු ආයෝජන 2011 වර්ෂයේදී සියයට 106 කින්ද, සමාලෝචිත වර්ෂයේදී සියයට 25 කින්ද වැඩිවී තිබුණි. තවද දේශීය ලාභ ලබන ආයෝජන සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 182 කින් වැඩිවී තිබුණු අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 43 ක වැඩිවීමකි.

12

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයෝජන මණ්ඩලය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලේ බටහිර කුළුණේ, 12 මහල සඳහා 1996 නොවැම්බර් 04 දින පුද්ගලික සමාගමක් සමඟ කල් බදු ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර රු.2,637,240ක් තැන්පතු මුදලක් ගෙවා තිබුණි. එම කාර්යාල ඉඩ පහසුකම් ඉහත සමාගමට 2010 ජූනි මාසයේදී භාරදී තිබුණද 2013 මැයි දක්වා එම තැන්පතු මුදල ආපසු අයකර ගෙන නොතිබුණි.

*එවකට තිබූ අමාත්‍ය කාර්යාලය 12 මහලෙන් ක්ෂණිකව ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ඉවත්වීම සම්බන්ධයෙන් පූර්ව දැනුම්දීමක් කර නොතිබීම හේතුවෙන් බදුකරු විසින් රු.1,303,020ක් වූ ඇප තැන්පතුව අහිමි කර තිබූ බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.*

(ආ) කලින් සිටි ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අභ්‍යන්තර විගණන ) විසින් ඔහුගේ විශ්‍රාම යාමේ වයස වූ අවුරුදු 58 න් ඔබ්බට සේවය දීර්ඝ නොකිරීමේ තීරණය විරුද්ධව ඔහු විසින් කම්කරු අධිකරණයේ පවරන ලද නඩුවේ අවසාන තීන්දුව ප්‍රකාරව, ආයෝජන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.618,530ක් වූ වන්දි මුදලක් ඔහුට ගෙවා තිබුණි.

(ඇ) වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ 1998 වර්ෂයේදී නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා ආයෝජන මණ්ඩල කළමනාකරණය විසින් මැලේසියන් සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගමේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් ලබාදී තිබූ අනුමැතිය ඉවත් කරගෙන තිබුණු අතර නිවාස 34 කින් යුතු යෝජනා ක්‍රමය ආයෝජන මණ්ඩලය විසින් භාරගෙන තිබුණි.

(ii) ඉදිකරන ලද නිවාස වෙන්දේසි කිරීම සඳහා වෙනත් සමාගමකට භාරදී තිබුණි. කෙසේ වුවද වෙන්දේසිකරු හා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමක් තිබූ බවට තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) එම සමාගමෙන් ලැබිය යුතු ලෙස රු.1,604,200ක මුදලක් වර්ෂ 5 කට වැඩිකාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

13

(iv) වටිනාකම රු.24,216,500ක් වූ නිවාස ඒකක 25ක් රු.19,772,192ක මිලකට විකුණා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.4,444,308ක පාඩුවක් ආයෝජන මණ්ඩලය දරා තිබුණි.

(v) රේඛීය අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයාට අනුයුක්තව සිටි ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා වාරික ගෙවීම් පදනම යටතේ නිවාස ඒකක දෙකක් 2006 සිට වෙන්කර තිබුණි.

(ඈ) ඔරුගොඩවත්ත , මධ්‍යම පරික්ෂණ පර්යන්තය ( Central Verification Terminal) සහ කටුනායක ගුවන් බඩු ඒකකය ( Air Cargo Village Unit) යන පරික්ෂණ ඒකක දෙකෙහි යොදවා සිටි රේගු නිලධාරීන්ට පැමිණීමේ වාර්තා පිළිබඳ නිරවද්‍යතාවය පරික්ෂා කිරීමෙන් තොරව 2012 වර්ෂයේදී ගෙවන ලද අතිකාල දීමනා රු.3,771,885ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. රේගු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව සමහර නිලධාරීන් මසකට පැය 600ක් ඉක්මවා වැඩකර තිබුණි.
*ආයතන දෙක අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ 4.1 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට අනුව ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රේගුවට අතිකාල ගෙවීම් ප්‍රතිපූර්ණය කළ බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.*

(ඉ) බියගම අපනයන සැකසුම් කලාපයේ ( BEPZ) පිහිටි ලොට් අංක 26 බී සහ 26 බී / 1 / බී යන ස්ථානයන්හි ව්‍යාපාරික කටයුතු ස්ථානගත කර ක්‍රියාත්මක කිරීමට සමාගම් දෙකක් විසින් 2005 දෙසැම්බර් 22 දින ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වෙනත් සමාගමක් විසින් කලින් අත්කරගෙන සිට කිසිදු හේතුවක් නොදක්වා එම අවස්ථාවේ වසා දමා තිබුණු බ්ලොක් ඒ හි ලොට් අංක 43 හා 43 ඒ ඉඩමේ හා පරිශ්‍රයන්හි ඉහත සමාගම් දෙකට ඔවුන්ගේ ව්‍යාපෘති ස්ථානගත කිරීමට ආයෝජන මණ්ඩලය විසින් දන්වා තිබුණි.

(ii) පසුව වසා දමා තිබුණු සමාගමේ ඉල්ලීම පරිදි එම පරිශ්‍රයන්හි ඉදිකරන ලද ගොඩනැඟිලිවල වටිනාකම සඳහා රු.මිලියන 59ක් වන්දි ලෙස ගෙවීමට ඉහත සමාගම් දෙකට ආයොජන මණ්ඩලය විසින් දන්වා තිබුණි.

14

(iii) අවසානයේදී ඉහත සමාගම් දෙකෙන් එක් සමාගමක් තීරක විනිශ්චයට පෙර අවසන් කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම හේතුවෙන් සිදුවූ පාඩුව සඳහා 2011 වර්ෂයේදී රු.32,719,097ක් වන්දි ගෙවීමට ආයෝජන මණ්ඩලයට සිදුවී තිබුණි.

(iv) තවද දෙවැනි සමාගමට සමාලෝචිත වර්ෂයේදී සිදු වූ පාඩු සඳහා වන්දි ලෙස රු.7,178,111ක මුදලක් ගෙවීමට ආයෝජන මණ්ඩලය තීරණය කර තිබුණි.

(ඊ) හොරණ අපනයන සැකසුම් කලාපයේ යෝජිත, පිරිසිදු කළ අපද්‍රව්‍ය පොම්ප කිරීමේ පිරියත ඉදිකිරීම සඳහා 2010 ජනවාරි 12 දින ආයෝජන මණ්ඩලය විසින් රු.1,301,584ක අත්තිකාරමක් හොරණ ප්‍රාදේශීය සභාවට ගෙවා තිබුණි. නමුත් පිරිසිදු කළ අපද්‍රව්‍ය ගඟ ඉහළ කොටසේ කඳාන දී කළු ගඟට මුදාහැරීම සම්බන්ධයෙන් වූ උද්ඝෝෂණය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. කෙසේ වුවද 2013 ජුනි දක්වා ආයෝජන මණ්ඩලය විසින් මෙම අත්තිකාරම ආපසු අයකරගෙන නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට මෙම මුදල කෙරී ගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(උ) 2000 දෙසැම්බර් 29 දිනට පවතින විදුලි ගාස්තු රේටය වාර්ෂිකව සියයට 6.9 කට වඩා වැඩිවුවහොත් එකී විදුලි ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය එකඟවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2002 ජුනි සිට 2007 සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ විදුලි ගාස්තු රේටය වැඩිවීම සම්බන්ධයෙන් රු.356,793,568ක මුදලක් සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය මඟින් ප්‍රකාශ කරන ලද අවසාන තීන්දුව ප්‍රකාරව හානිය සඳහා ගෙවීම ප්‍රමාදවීම මත හා සමාගම විසින් දරන ලද බේරුම්කරණ පිරිවැය සම්බන්ධයෙන් රු.388,161,877ක මුදලක්ද සමාගම විසින් ඉල්ලා තිබුණි. සමාගමට වාසි වන අයුරින් බේරුම්කරණ අධිකරණය විසින් තීන්දුව ලබාදී තිබූ අතර තවමත් මෙම කරුණ නඩු කටයුත්තක්ව පවතී.

15

(ii) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය දීමට පෙර භාවිතය සඳහා මෙම ප්‍රදේශයේ රබර් දැව ලබාගැනීමේ හැකියාව පිළිබඳව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා රබර් පර්යේෂණ ආයතනයෙන් ආයෝජන මණ්ඩලය විසින් තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(iii) අධිකරණ නඩු පවතින බැවින්, මෙම සමාගමෙන් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු බිම් කුලිය , ජල බිල්පත් හා බංගලා කුලිය ආදිය අයකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකිවී තිබුණි.

(ඍ) ආයෝජන මණ්ඩලය විසින් පර්ත් වතුයාය මිලදී ගෙන තිබුණු අතර වතුයායෙන් කොටසක් කළමනාකරණය කිරීමට රාජ්‍ය වැවිලි සංස්ථාවට වර්ෂ 5 ක කාලයක් සඳහා භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මිලදී ගැනීමෙන් පසු වතුයායේ ගොඩනැඟිලි , වටිනා ගස්වර්ග ආදි වත්කම් සටහන් කර ගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ආයෝජන මණ්ඩලය වෙත 2006 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් ලැබී නොතිබුණි.

(iii) 2005 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 10ක මුදල හැරුණු විට , සංස්ථාව විසින් එහි ලාභයන් ක්‍රමවත්ව ආයෝජන මණ්ඩලයට ප්‍රේෂණය කර නොතිබුණි. 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් ප්‍රකාරව, පර්ත් වතුයාය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47ක් විය. කෙසේ වුවද 2011 නොවැම්බර් 15 හා 2012 නොවැම්බර් 14 දිනයන්හි පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝග කරන ලද පරිදි ලැබිය යුතු නිවැරදි මුදල හඳුනා ගැනීමට හා වාර්තා කිරීමට ආයෝජන මණ්ඩලයට නොහැකිවී තිබුණි.

(iv) පර්ත් වතුයාය සම්බන්ධයෙන් කොන්දේසි වලට පටහැනිව කළමනාකරණ ගාස්තු සියයට 15කින් වැඩිකිරීම , පර්ත් වතුයායේ ආදායම ඒකපාර්ශවිකව උපයෝජනය කිරීම, පර්ත් වතුයායෙන් උපයා ගන්නා ලද ආදායම

16

රු.මිලියන 20ක් කොන්ත්‍රාත්කරු නමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ගැනීම, මෝටර් වාහන අවිධිමත්ව පවරා ගැනීම හා රු.මිලියන 12.42ක් වූ බංගලා කුලී ජංගම ගිණුම මාර්ගයෙන් කොන්ත්‍රාත්කරුට මාරුකර ගැනීම සම්බන්ධයෙන් විසඳිය යුතු කරුණු කෙරීගෙන යමින් පවතී.

**4.3 වත්කම් කළමනාකරණය**

----------------------------

(අ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) බටහිර කුළුණේ සභාධිපත්‍ය ඒකක 04ක් රු.මිලියන 530 ක පිරිවැයකට 2007 දෙසැම්බර් 31 දින ආයෝජන මණ්ඩලය විසින් මිලදී ගෙන තිබුණු අතර 2000 සැප්තැම්බර් සිට ආයෝජන මණ්ඩලය විසින් කුලී පදනම මත ලබාගෙන තිබුණු එම කුළුණේම තවත් ඒකක 05 ක් 2008 මාර්තු 05 දින රු.මිලියන 625ක පිරිවැයකට පසුව මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.මිලියන 128ක පිරිවැයකට මිලදී ගන්නා ලද 6 වැනි මහල කුලියට දීම සඳහා 2011 ජුලි 01 දින සිට සම්පූර්ණයෙන්ම හිස් කර තිබූ අතර, එය 2012 දෙසැම්බර් 31 දක්වාත් නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව එම මහලෙන් කොටසක් 2013 වර්ෂයේදී ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ කාර්යාලය සඳහා උපයෝජනය කරන බවත්, අනිත් කොටස ආයෝජන මණ්ඩලයේ ආයෝජක සේවා දෙපාර්තමේන්තුව විසින් යළි උපයෝජනය කරන බවත් දැක්වුණි.

*"නව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය පිහිටු වීමෙන් පසු, අමාත්‍යාංශ කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් කාර්යාල ඉඩ පහසුකම් ලබාගැනීමට අවශ්‍ය වූ අතර එබැවින් 06 මහලේ කොටසක් මෙම කාර්යය සඳහා යොදාගත් බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි. තවද ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 6 මහලේ ඉතිරි කොටසේ ආයෝජන සේවා දෙපාර්තමේන්තුව ස්ථානගත කිරීමටත් ආයෝජන මණ්ඩලය තීරණය කර ඇති බවද දන්වා තිබුණි."*

(ii) 25 වන මහලේ වර්ග අඩි 6,318ක බිම් ප්‍රදේශයක් හා 27 මහලේ වර්ග අඩි 2,781ක බිම් ප්‍රදේශයක් ගිවිසුමකට එළඹීමෙන් තොරව හා භාවිතා කිරීම වෙනුවෙන් කිසිඳු කුලියක් අයකිරීමෙන් තොරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට වෙන්කර තිබුණි.

17

### 4.4 මානව සම්පත් කළමනාකරණය

2003 ජුනි 02 දිනැති අංක පීඒඩී / 12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය ප්‍රකාරව ඵලදායි කාර්ය මණ්ඩල කළමනාකරණයක් සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ආයෝජන මණ්ඩලය විසින් විධිමත් පියවරයන් ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු (අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වැනි ප්‍රධාන තනතුරු ඇතුළු ) 73ක් ඇතුළුව කාර්ය මණ්ඩලයේ විවිධ වර්ගයන් ගේ පුරප්පාඩු 110ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පුරවා නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව | |
| විධායක කාර්ය මණ්ඩලය | 575 | 497 | 5 | 502 | 73 |
| ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය | 354 | 330 | 4 | 334 | 20 |
| සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලය | 321 | 272 | 32 | 304 | 17 |
| එකතුව | 1250 | 1099 | 41 | 1140 | 110 |

(ආ) 2011 මාර්තු 23 දිනැති අංක ඊඑස්/12/ඊඑස්ටී/188 දරන ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර චක්‍රලේඛය අනුව, නියමිත කාලයට පෙර විශ්‍රාම යාමට අපේක්ෂිත නිලධාරීන් සඳහා ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කර තිබූ අතර ඔවුන්ගේ පුරප්පාඩු නොපිරවිය යුතු හෝ එම කාර්යය සඳහා මුදාහැරිය හැකි වෙනත් පුද්ගලයකුගෙන් ඉටුකර ගත යුතුය. කෙසේ වුවද ආයෝජන මණ්ඩලය විසින් ඉහත චක්‍රලේඛ විධිවිධාන පිළිබඳ සැලකීමෙන් තොරව ප්‍රධාන තනතුරක යොදවා සිටි විධායක අධ්‍යක්ෂවරයකු (මුල්‍ය) මුදාහැර තිබුණි.

18

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

------------------------

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් පුත්තලම , සෙල්ලකන්ද පිහිටි අක්කර 250ක ඉඩම පවරා ගැනීමට ආයෝජන මණ්ඩලය කටයුතු ආරම්භ කර තිබුණු අතර පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීම, භූගත ජලය පිළිබඳ විමර්ශනය කිරීම, පූර්ව ව්‍යුහාත්මක සැලසුම් හා ඇඳීම්, භූ තාක්ෂණික විමර්ශනයන්, පිඹුරු සැලසුම් පිළියෙල කිරීම ආදි මූලික වියදම් ලෙස රු.11,270,120ක් දරා තිබුණි. කෙසේ වුවද ආයෝජන මණ්ඩලය ඉඩමේ පවරා ගැනීම් ක්‍රියාවලිය අත්හිටුවීමටත් 2012 වර්ෂය තුළදී පාලක මණ්ඩල අනුමැතිය මඟින් ඉහත මූලික වියදම් කපාහැරීමටත් පියවර ගෙන තිබු බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**5.1 සංයුක්ත සැලැස්ම**

--------------------

2009 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මේ දක්වා තිබු ඉලක්කයන්ගෙන් ඉලක්කයන් කිහිපයක් ඉටුකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකිවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009/2010 වර්ෂයේදී මඩකලපුව හා අම්පාරහි නව ආයෝජන ප්‍රවර්ධන කලාප හඳුනා ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමට ඉලක්ක කර තිබුණද , 2012 දෙසැම්බර් 31 වන විටත් එම ප්‍රදේශවල එක් ආයෝජන ප්‍රවර්ධන කලාපයක් හෝ ස්ථාපිත කිරීමට කිසිදු පියවරක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2009/ 2010 වන විට කොළඹ සහ ගම්පහ දිස්ත්‍රිකවලින් බැහැරව ආරම්භ කිරීමට ඉලක්ක කර තිබුණු නව ව්‍යාවසායන් 300 න් 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 163ක් පමණක් (පුළුල් කිරීම් 5ක් ඇතුළුව ) මෙහෙයුම් ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘති 18ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 විගණන කමිටුව

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තියට අනුව, අවම වශයෙන් මාස 3කට වරක් විගණන කමිටුව ක්‍රමානුකූලව රැස්විය යුතු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් සහිතව එහි නිරීක්ෂණයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2012 වර්ෂය තුළදී පවත්වා තිබුණේ එක් විගණන කමිටු රැස්වීමක් පමණි.

5.4 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලවීම
(ආ) ව්‍යාපෘති අධීක්ෂණය කිරීම
(ඇ) ණය රැස්කර ගැනීම
(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඉ) වත්කම් කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

20

**2012.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ**
**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර**
**විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධයෙන් අදහස්**

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම.**

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර 40

2013 වර්ෂයේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වන ලදී.

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර 39

2013 වර්ෂයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වන ලදී.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කොන්ත්‍රාත්තු සම්පූර්ණ කර අදාළ ලිපි ලේඛන ලැබීමෙන් අනතුරුව එකී කොන්ත්‍රාත්තු අදාළ ගිණුම්වලට මාරුකර ඇත.

* එස්.බී.ජේ.එම්. ගොඩනැගිල්ල - බී ඕ අයි/ ටී එස්/ එච් ඕ/ 2011/ 11-05.30

ජර්නල් සටහන් ඩී. ඕ 84 මඟින් 2013 අප්‍රේල් මාසයේ දී අදාළ මාරුකිරීම් සිදු කොට ඇත.

අඩුපාඩු පිළිබඳ වගකීම් කාලපරිච්ඡේදය 2014. 04.25 දින දක්වා දීර්ඝ කිරීම අදාළ ගිණුම්වලට මාරුකිරීම සඳහා වූ ප්‍රමාදයට හේතු වී ඇත. මේ අතරවාරයේ “ඒ” සහ “බී” ආකෘති පත්‍ර මූල්‍ය අංශයට නිකුත් කොට ඇත.

* අභ්‍යන්තර මාර්ග - කේ.ඊ.පී.ඉසඩ් සහ බී.ඊ.පී.ඉසඩ් - බී.ඕ.අයි / ටී.එස්/ කේ.ඊ.පී. ඉසඩ් - බී.ඊ.පී.ඉසඩ්/ 11/ 01 -

ජර්නල් සටහන් බී.ඕ. 20 මඟින් 2013 පෙබරවාරි මාසයේ දී අදාළ මාරුකිරීම් සිදු කොට ඇත.

වත්කම් අදාළ ගිණුම්වලට මාරුකිරීම සඳහා අඩුපාඩු පිළිබඳ වගකීම් කාලපරිච්ඡේදය අවසන් වී තිබීම අදාළ ගිණුම්වලට මාරුකිරීම සම්බන්ධයෙන් ප්‍රමාදයන් ඇතිවීමට හේතු වන්නට ඇත. අඩුපාඩු පිළිබඳ වගකීම් කාලපරිච්ඡේදය 2013. 06.19 දිනෙන් අවසන් වූ බැවින් ඒ බව මූල්‍ය අංශය වෙත දැනුම් දෙන ලදී.

* පිටවීම හඟවන සංඥාපුවරු සහ රැගෙන යා හැකි ගිනි නිවීමේ උපකරණ - බී.ඕ.අයි/ ටී.එස්/ එච්. ඕ/ 2011/ 22/ 05/ 035

ජර්නල් සටහන් ඩී.ඕ. 83 මඟින් 2013 අප්‍රේල් මාසයේ දී අදාළ මාරුකිරීම් සිදු කොට ඇත.

කොනත්‍රාත්තුවට අදාළ රැඳවුම් මුදල් අදාළ ගිණුමට මාරුකිරීමට පෙර කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කිරීමට සිදුවීම අදාළ ගිණුම්වලට මාරුකිරීම සඳහා වූ ප්‍රමාදයට හේතු වී ඇත. අඩුපාඩු පිළිබඳ වගකීම් කාලපරිච්ඡේදය 2013. 07. 13 දිනෙන් අවසන් වී ඇති අතර අදාළ ගිණුමට මාරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

* මගුරුවිල පාර - එච්.ඊ.පී.ඉසඩ් - බී.ඕ.අයි/ ටී එස්/ එච්.ඊ.පී.ඉසඩ්/ 2011/ 05/ 01

අවසාන ගෙවීම 2013 අගෝස්තු මාසයේ දී සිදුකරන ලද අතර එය ජර්නල් සටහන් එච් 001 මඟින් 2013 අගෝස්තු මාසයේ දී මාරු කර ඇත.

කොන්ත්‍රාත්තුවට අදාළ රැඳවුම් මුදල් අදාළ ගිණුමට මාරුකිරීමට පෙර කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කිරීමට සිදුවීම අදාළ ගිණුම්වලට මාරුකිරීම සඳහා වූ ප්‍රමාදයට හේතු වී ඇත. අඩුපාඩු පිළිබඳ වගකීම් කාලපරිච්ඡේදය 2013. 12. 23 වැනි දිනෙන් අවසන් වන හෙයින් අදාළ ගිණුම් වලට මාරුකිරීම සඳහා පියවර ගනු ලැබේ.

* <u>ජිප්සම් පුවරු සහ කදා තන්තුමය පරිවාරක සවිකිරීම - 2013 මැයි මාසයේ දී ජර්නල් සටහන් ඊ ඕ 75 මඟින් අදාළ මාරුකිරීම් සිදු කොට ඇත.</u>

* <u>කැළිකසළ රැඳවුම්/ උත්තෝලක/ කාණු කවාට ඇතිරීම - ඩබ්ලිව්.ඊ.පී.ඉසඩ් - බී ඕ අයි/ ටී එස්/ ඩබ්.ඊ.පී.ඉසඩ්/ 2006/ 01 - අවසාන ගෙවීම මේවන තෙක් සිදු කර නොමැත.</u>

ඉහත කොන්ත්‍රාත්තුවට අදාළ කටයුතු 2007. 10. 16 දින නිම තිබූ අතර ඉන් අනතුරුව එම පද්ධතිය ක්‍රියාත්මක කරන ලදි. මේවන විට එම පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

ඉතිරි වැඩකටයුතුවල ඇතැම් අයිතමයන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සහ ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය අතර ඇති වූ යම් මතභේදයක් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීමට නියමිත අවසාන ගෙවීම සිදු නොකරන ලදී. කොන්ත්‍රාත්කරුට සහ ආයෝජන මණ්ඩලයට ඇතිව තිබූ මෙම ව්‍යාකූල තත්වය පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීමෙන් අනතුරුව අවසන් ගිණුම් ප්‍රකාශන සම්පූර්ණ කොට ඇති අතර ඒ අනුව වත්කම් අදාළ ගිණුම්වලට මාරු කිරීම සඳහා මේවන විට පියවර ගනිමින් තිබේ.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) <u>ව්‍යාපාර වලින් ලැබිය යුතු</u>

i. 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වාර්ෂික ගාස්තු සහ බිම් කුලිය අය කිරීම ( 2013.07.31 දිනට) ඉන්වොයිස් අගයට වඩා 95% ඉක්මවා තිබූ අතර ජල ගාස්තු හා කුලී අයකිරීම ( 2013.07.31 දිනට) 98% ඉක්මවා තිබුණි.

| <u>බිම්කුලිය සහ වාර්ෂික ගාස්තු</u> | 2012<br>රු.මි. | 2011<br>රු.මි. | 2010<br>රු.මි. |
|---|---|---|---|
| ආදායම | 978 | 849 | 820 |
| ණයගැතියෝ | 80 | 27 | 29 |
| 2013.07.31 දිනට ශේෂය | 45 | | |
| ණය අයකිරීම් අනුපාතය | 92% | 97% | 97% |

95.4% ( 2013.07.31 දිනට)

| <u>ජල ගාස්තු හා කුලිය</u> | 2012<br>රු.මි. | 2011<br>රු.මි. | 2010<br>රු.මි. |
|---|---|---|---|
| ආදායම | 978 | 883 | 850 |
| ණයගැතියෝ | 138 | 15 | 9 |
| 2013.07.31 දිනට ශේෂය | 18 | | |
| ණය අයකිරීම් අනුපාතය | 85% | 98% | 99% |

98% ( 2013.07.31 දිනට)

ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් හානි සඳහා වන ප්‍රතිපාදන පසුගිය අවුරුදු පහ තුළ එනම්, 2008 දී 37% සිට 2012 දී 70% දක්වා වැඩිවුවද නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත භාවිතයට ගැනීමත් ව්‍යාපෘති අවලංගු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමත් හේතුවෙන් ණය ආපසු අයකර ගැනීම ඉහළ මට්ටමක පවතී.

ii. හානි සඳහා ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය අනුගමනය කරන ප්‍රතිපත්තිය වනුයේ අවලංගු කරන ලද / වසා දමන ලද/ අත්හිටුවන ලද ව්‍යාපෘතිවල ලැබීම් සඳහා 100% ක ප්‍රතිපාදන සැලසීමයි.

iii. වාර්ෂික ගාස්තු සම්බන්ධයෙන් හානි සඳහා වන සමස්ත ප්‍රතිපාදනය වූ රු. 210, 331, 393 ක මුදලින් රු. 157, 538, 094 / 51 ක් අවලංගු කරන ලද / වසා දමන ලද / අත්හිටුවන ලද ව්‍යාපෘති වලින් ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් වන අතර රු. 41, 864, 382 / 68 ක් දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපාරවලින් ලැබිය යුතු වර්ෂ දෙකකට වඩා අධික කාලයක් සඳහා වන වාර්ෂික ගාස්තු සම්බන්ධයෙන් වේ. තවද, ණය එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වෙනම අධීක්ෂණ ඒකකයක් පිහිටුවා ඇති අතර එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස 6 (C) අයිතමය සඳහා පිළිතුරු යොමු කළ යුතුය.

(ආ) <u>වෙනත් ණයගැතියෝ</u>

i. සඳහන් කර ඇත.

ii. රාජ්‍ය ආයතනවලින් ලැබියයුතු හිඟමුදල්

<u>පුනරුත්ථාපන හා දුවිඩ කටයුතු අමාත්‍යාංශය - රු. 2, 099, 895/-</u>

පුනරුත්ථාපන හා දුවිඩ කටයුතු ආමාත්‍ය ගරු. සරත් අමුණුගම මහතාට සිය කාර්යාලය ස්ථාපිත කිරීම පිණිස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අංක 14, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 යන ස්ථානයෙහි පිහිටි සිය ගොඩනැගිල්ලේ කාර්යාල අවකාශය 2013 වර්ෂයේ දී ලබා දෙන ලදී. ඉන් පසු ගරු. ඩග්ලස් දේවානන්ද මහතා මෙම අමාත්‍ය තනතුරට පත් වූ අතර ඔහු විසින් එම පරිශ්‍රය භාවිතයට ගන්නා ලදී. ඉන් අනතුරුව ආණ්ඩුව වෙනස්වීමත් සමඟ ගරු. දොස්තර ජයලත් ජයවර්ධන මහතා අමාත්‍ය වරයා වශයෙන් පත්ව තිබූ අතර වර්ග අඩියකට රුපියල් 30.00 බැගින් වූ මාසික කුලිය වෙනස් කිරීමටත් මාසික විදුලි බිල් අමාත්‍යාංශයෙන් අයකර ගැනීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තීරණය කොට තිබුණි. අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි රු. 2, 099, 895 ක් පමණ වටිනා පාවිච්චි කරන ලද ආයෝජන මණ්ඩලයේ ඇතැම් ගෘහ භාණ්ඩද භාර දී තිබුණි.

පසුව අමාත්‍යාංශය ආයෝජන මණ්ඩල කාර්යාලයෙන් ඉවත්ව ගොස් තිබූ අතර, වෙනත් ස්ථානයකට මාරුවීමේ දී ආයෝජන මණ්ඩලය විසින් තාවකාලිකව භාර දී තිබූ ගෘහ භාණ්ඩ ද ඔවුන් රැගෙන ගොස් තිබුණි. භාවිත ගෘහ භාණ්ඩ පිරිවැය හැර කාලපරිච්ඡේදයට අදාළ කුලී සහ විදුලි ගාස්තු අයකර ගැනීමට ආයෝජන මණ්ඩලය සමත් වී තිබුණි.

ඉහත සඳහන් කාලපරිච්ඡේදය තුළ විවිධ පාලනතන්ත්‍ර යටතේ අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනස් වී ඇති නමුත් ආයෝජන මණ්ඩලය නියමිත මුදල් අයකර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය සමඟ එක්ව අඛණ්ඩ උත්සාහයක් දරමින් සිටි.

<u>කර්මාන්ත සංවර්ධන, ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය.</u>
<u>ආයෝජන මණ්ඩලය විසින් අයකරගෙන නොමැති හිඟ ශේෂ රු. 710,550</u>

2001 වර්ෂයේ දී යටිතල පහසුකම් ආයෝජන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රයෝජනයට ගන්නා ලද කාර්යාල අවකාශය එහි ගෘහභාණ්ඩ සහ උපකරණ ද සමඟ වරාය සංවර්ධන හා දක්ෂිණ සංවර්ධන (ව.සං හා ද.සං) අමාත්‍යාංශයට භාර දී තිබුණි. භාර දෙන ලද භාණ්ඩ වල වටිනාකම රු. 710,550 / - ක් විය. වරාය සංවර්ධන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් එම මුදල ආයෝජන මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වී ඇති නමුත් ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් ඉල්ලීම් කර තිබියදීත් එම රු.710,550 /- මේ දක්වා පියවා නොමැත.

කාලපරිච්ඡේදය තුළ විවිධ පාලනතන්ත්‍ර යටතේ අමාත්‍ය ධුරය අවස්ථා ගණනකදී වෙනස් වීමට භාජනය වූ අතර එකී කාලපරිච්ඡේදය තුළ අදාළ ගණුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීම වෙනුවෙන් වගකීම දැරූ නිලධාරීන් වර්තමාන අමාත්‍යාංශයේ නොමැත. කෙසේ වෙතත් මෙම මුදල අයකර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නිරන්තර ප්‍රයත්නයක යෙදී සිටී.

<u>කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය - 27 වන මහල - රු.2, 411, 822</u>

ජනාධිපති ලේකම්ගේ 2004 නොවැම්බර් 19 දිනැති ඉල්ලීම් අනුව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුලුනේ 27 වන මහල උසස් තාක්ෂණ හා ජාතික හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් නිදහස් කර තිබුණි. ඒ අනුව මණ්ඩලයේ අනුමැතිය මත එම මහල උසස් තාක්ෂණ හා ජාතික ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට අතුරු බදු දී ඇත. තවද, මාසික කුලිය ආයෝජන මණ්ඩලය වෙත ගෙවනු ලැබීම සහතික කරනු වස් අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹ ඇත.

2006 වර්ෂයේ දී සිදු කළ අමාත්‍යමණ්ඩල වෙනසත් සමඟ උ.තා. හා ජා. ව්‍යා. සං. අමාත්‍යාංශයේ නම සහ අමාත්‍ය ධුරය වෙනසකට ලක් වූ අතර එය කර්මාන්ත සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය බවට පත් විය. කුලිය ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලීමක් කරමින් යවන ලද ලිපිවලට කර්මාන්ත සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ප්‍රතිචාර දක්වා නොතිබුණි. මෙසේ දීර්ඝ කාලයක් සිට හිඟව පවතින මෙම ගෙවීම් ආයෝජන මණ්ඩලයට ගෙවන ලෙස වර්තමාන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කිරීම සඳහා කටයුතු කර ඇත.

ඉහත ගෙවිය යුතු මුදල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රතිපූර්ණ කරන ලෙස අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදී.

<u>ජනතා වතු සංවර්ධන මණ්ඩලය - හන්තාන ඉඩම</u>

රු. 52, 383, 573. 27 ක් වූ නියමිත ගෙවීම සිදුකිරීම සඳහා ආයෝජන මණ්ඩලය සභාපතිගේ අංක ඊ සී/ 9/ එල් ඒ/ හන්තාන හා 2012.07.06 දිනැති ලිපිය මඟින් 2014. 01. 06 දිනෙන් අවසන් මාස 18 ක කාලපරිච්ඡේදයක් ජ.න.ව.සං.ම ට ලබා දී ඇත.

<u>අපනයන සංවර්ධන මණ්ඩලය - වත්කම් විකිණීම - එන්.ඩබ්ලිව්.ආර්.ඕ ( රු.629, 440)</u>

වායුසමීකරණ, වැනසි පැලලි, බුමුතුරුණු සහ ඇලුමිනියම් බෙදුම්වලට අදාළ හිඟ ශේෂය රු. 890, 690/ 80 ක් විය. කෙසේ වෙතත් වැනසි පැලලි හා බුමුතුරුණු මේ වන විටත් ඉවත් කරනු ලැබ ඇති අතර රු. 261,520/ 80 කින් පොත්වල ගැලපුම් සිදු කර ඇත. වායුසමීකරණ සහ ඇලුමිනියම් බෙදුම් ඉවත් කිරීමේ කර්තව්‍ය සම්බන්ධයෙන් ගොඩනැගිල්ලේ වර්තමාන හිමිකරු (M/S Nation Lanka Finance PLC) සමඟ සාකච්ඡා කරමින් සිටින අතර 2013 දෙසැම්බර් 31 දිනට පෙර ඒ පිළිබඳ අවසන් තීරණයකට එළඹෙනු ඇත.

**2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

(අ) <u>උපයන විට බද්ද</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව තම සේවකයින් වෙනුවෙන් 2012 නොවැම්බර් මාසය දක්වා උපයන විට බද්ද ගෙවා ඇත. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත උපයන විට බද්ද සඳහා සේවකයාගේ වැටුපෙන් අයවිය යුතු ප්‍රමාණය අඩුකිරීම ආයෝජන මණ්ඩලය විසින් 2012 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් උද්ගත වූ තත්වයන් පිළිබඳ සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය 2012 නොවැම්බර් මාසයේ සිට සේවකයින්ගෙන් අයකරනු ලැබූ උපයනවිට බද්ද ප්‍රතිපූර්ණය කිරීමටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහාත් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව උපයන විට බද්ද සම්බන්ධයෙන් වන 2013.06.04 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආයෝජන මන්ඩලය විසින් යථාකාලයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනු ඇත.

(ආ) කාර්යමණ්ඩල යහසාධක අරමුදල

අරමුණ : ---- සහනදායී පොලී අනුපාත මත පස්මාසික ණය එහි කාරයමණ්ඩලයට ලබා දීමේ දී සංවිධානයේ මූල්‍ය බැඳීමට වන බලපෑම අදාළ පොලියෙන් කොටසක් අරමුදලින් ආවරණය කිරීම මඟින් අවම කිරීම.

දායකත්වය:- අරමුදල සාමාජිකයන්ගේ දායක මුදල්වලින් සහ ආයෝජන මණ්ඩලයේ ආරම්භක දායක මුදලින් සමන්විත වේ.

අනුමැතිය :- මණ්ඩලයේ අනුමැතිය 1994.10.10 දින ලැබුන අතර අපගේ 2012. 08.29 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා සිටින ලදි. ගරු ඇමතිතුමාගේ අනුමැතිය 2013 ඔක්තෝබර් මස අවසන් වීමට පෙර ලබා ගැනීමට අපේක්ෂා කරයි.

(ඇ) ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ වන්දි මුදල් ගණනය කිරීම.

ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ වන්දි මුදල් ගෙවීම් ගණනය කිරීම පහත සඳහන් පරිදි සේවක වර්ගයන්ට අනුව වෙනස් වේ.

* ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ අවසන් දිනය වන විට වයස අවුරුදු 55ට අඩු සේවකයින් සඳහා ගෙවීම් කිරීම.

ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ දී ගෙවනු ලබන වන්දි මුදල් ගණනය කිරීමේ දී ඒකාබද්ධ වැටුපට අමතරව අයෝජන මණ්ඩලයේ කළමනාකරණයේ අනුමැතිය ඇතිව ජීවන වියදම් දීමනාව සහ සියයට 5 හේ විශේෂ දීමනාව ද සැලකිල්ලට ගනු ලබන අතර එකී දීමනා දෙක බොහෝ කලක සිට ගෙවනු ලැබීමත් තාවකාලික පියවරක් වශයෙන් නොමැතිව ගෙවීමත් ඊට හේතු වී ඇත. තවද, ආයෝජන මණ්ඩලයේ විවිධ අභ්‍යන්තර ගෙවීම් සම්බන්ධයෙන් මෙන්ම සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සහ පාරිතෝෂික ගෙවීම් වැනි ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධයෙන් ද මෙකී දීමනා සේවකයාගේ වැටුපෙහි කොටසක් වශයෙන් සලකනු ලැබේ.

ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ අවසන් දිනය වන විට වයස අවුරුදු 55 හා ඊට වැඩි සේවකයින් සඳහා ගෙවීම් සිදු කිරීම.

ඉදිරි වසර 05 තුළ විශ්‍රාම ගැනීමට නියමිත සේවකයින් පහත දැක්වෙන ගෙවීම් අතුරෙන් අඩු ගෙවීම ලැබීම සඳහා හිමිකම් ලබන බව අංක පී.ඊ.ඩී. 10 හා 2003.05.28 දිනැති රාජය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් කර ඇත.

* ඔවුන් සේවයේ යෙදී සිටියේ නම් ලැබිය යුතු පඩිනඩි වල එකතුව

* ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනාක්‍රමයට අනුකූලව ගෙවියයුතු වන වන්දි මුදල

ආයතන සංග්‍රහයේ පළවන කොටසේ 1 පරිච්ඡේදය සඳහන් නිර්වචනයට අනුව "නිලධාරියෙකුගේ පඩිනඩි" යන්නට ප්‍රතිපූර්ණ ස්වරූපයෙන් නොවන වැටුප, රාජකාරි දීමනා, පුද්ගල දීමනා සහ අනෙකුත් දීමනා අදහස් වේ. එමනිසා සේවය සඳහා පඩිනඩිවල එකතුව ගණනය කිරීම පිණිස විමසුමෙහි සඳහන් දීමනා ගණනය කිරීම මඟින් පී ඊ ඩී 10 හා 2003. 05.28 දිනැති චක්‍රලේඛයේ සඳහන් උපදෙස් උල්ලංඝනය නොවේ.

(ඈ) සේවකයින්ට රියැදුරු දීමනා ගෙවීම

අරමුණ:- වාහනයක් පවරනු ලැබීමට හිමිකම් ලබන එහෙත් ආයෝජන මණ්ඩලයේ රියැදුරෙකු ඒ සඳහා යොදවනු නොලබන ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සඳහා මාසික ගෙවීමක් සිදුකිරීම. මණ්ඩලය විසින් රියදුරෙකු යොදවනවා වෙනුවට වාහනයක් පවරනු ලැබීමට

හිමිකම් ලබන නිලධාරියෙකුට දීමනාවක් ගෙවීම ආයෝජන මණ්ඩලයට මූල්‍යමය වශයෙන් හා පරිපාලනමය වශයෙන් වාසිදායක වන නිසා මෙම ගෙවීම නිර්දේශ කොට ඇත. මණ්ඩලය විසින් රියදුරෙකු යෙදවීම සම්බන්ධයෙන් වන පිරිවැය විශ්ලේෂණය පහත සඳහන් පරිදි වේ.

<u>ස්ථාවර පිරිවැය මාසිකව</u>

| | |
|---|---|
| මූලික වැටුප | 12,670.00 |
| ජීවන වියදම් දීමනාව | 6,600.00 |
| අයවැය දීමනාව(15%) | 1,900.50 |
| විශේෂ දීමනාව (5%) | 633.50 |
| පැමිණීමේ දීමනාව (අවමය රු. 6,500.00ට යටත්ව 35%) | 6,500.00 |
| ප්‍රවාහන සහනාධාරය සාමාන්‍ය( අවමය රු.480.00 උපරිමය රු.4500.00) | 2,490.00 |
| අතිකාල මසකට සාමාන්‍යයෙන් පැය 50ක (1.5 අනුපාතයට ගණනය කරයි නම්) | 3,959.37 |
| සේ.නි.අ.අ සේව්‍යයාගේ දායකත්වය | 3,270.60 |
| සේ.නි.භා.අ. සේව්‍යයාගේ දායකත්වය | 654.12 |
| | 38,678.09 |

<u>විචල්‍ය පිරිවැය</u>

ඔවුන්ට පහත සඳහන් ප්‍රතිලාභ හිමිවේ.

| | |
|---|---|
| නිල ඇඳුම් දීමනා වාර්ෂික (කමිස/ කලිසම්/ මැහුම් වියදම්/ සපත්තු සහ මේස්) | 11,910.35 |
| වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම වාර්ෂික | 63,500.00 |
| ණය පහසුකම් | |
| එක් මාසික වැටුප් ණය | |
| පස් මාසික වැටුප් ණය | |
| අතිරේක පස් මාසික වැටුප් ණය | |
| වාහන ණය | |
| මණ්ඩලය විසින් නිවාස ණය ප්‍රතිපූර්ණය කිරීම | |
| උත්සව කාලයන්හිදී අත්තිකාරම් සහ ත්‍යාග වවුචර | |
| උත්සව අත්තිකාරම් | 10,000.00 |
| විශේෂ අත්තිකාරම් | 10,000.00 |
| ත්‍යාග වවුචර | 5,000.00 |
| වාර්ෂික ප්‍රතිලාභ ගෙවීම් | 15,000.00 |
| පාවිච්චි නොකල විවේක/ වෛද්‍ය නිවාඩු සඳහා මුදල් නිවාඩු | |
| මරණාධාර දීමනා | |
| ජීවිත රක්ෂණ මරණ සහ ආබාධිත තත්වයන් සඳහා | 200,000.00 |
| සැතපුම් 7 ට වඩා වැඩි දුරක ගමනක් ඇති පැය 06කට අධික කාලයක් ගතවන පුද්ගලයින් සඳහා ගමන් වියදම් හා යැපුම් දීමනා ---- | |

අනුමැතිය:- මේ සඳහා මණ්ඩලයේ අනුමැතිය 2003.01.14 දින ලැබී ඇත.

රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව මෙම ගෙවීම පිළිබඳව 2005.06.01 දින පරිපාලනය පිළිබඳ ජාතික සභාවට දැනුම් දී ඇත.

(ඉ) රජය විසින් වාහන මිළදී ගැනීම හෝ ආනයනය සම්බන්ධයෙන් වන පිරිවැය කපා හැර තිබෙන හා ප්‍රතිපත්ති තීරණයක් අනුව නඩත්තු වියදම් සඳහා වෙන්කළ මුදල් අඩුකර තිබෙන අවස්ථාවේදී රාජ්‍ය ආයතනවල වාහන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා එම ආයතන විසින් වාරික ගෙවීමේ ක්‍රමවේදය හෝ මෙහෙයුම් බදු ක්‍රමවේදය අනුගමනය කරන ලදී. රජය විසින් පනවන ලද සීමාවලට විකල්පයක් වශයෙන් බොහෝ රාජ්‍ය ආයතන විසින් වාහනයේ හිමිකාරීත්වය හා නඩත්තු පිරිවැය වාහන සැපයුම්කරු විසින් දරනු ලබන කුලීපිට ගැනුම් ක්‍රමවේදය යටතේ වාහන ලබා ගෙන තිබේ.

ආයෝජන මණ්ඩලයේ කළමනාකරණය විසින් 2003 වර්ෂයේ දී පරණ වාහන ඇණිය නඩත්තු කිරීම සඳහා වැයවන පුනරාවර්තන වියදම් පිළිබඳ විශ්ලේෂණය කළ අතර එහිදී එවැනි ආර්ථික වශයෙන් අවාසි සහගත වාහන නිසා අයවැය මත විශාල බරක් ඇතිකරන බව හඳුනාගෙන තිබුණි. ඉහත කාරණය පිළිබඳ අවධානය යොමු කළ කළමනාකරණය විසින් පැරණි වාහන ඉවත්කිරීමටත් අවශ්‍ය කරන වාහන ප්‍රමාණය පස් අවුරුදු බදු ගිවිසුමක් මත සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගමෙන් කුලීපිට ගැනුම් ක්‍රමයට ලබා ගැනීමටත් තීරණය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.06.02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී " වාහන කළමනාකරණ යෝජනා ක්‍රමය" යන නමින් ඉදිරිපත් කළ මණ්ඩල පත්‍රිකාවට අනුමැතිය ලබා දෙන ලදී. වාහනයක් ලැබීමට හිමිකම් ලබන හා බදු කාලසීමාව අවසානයේ දී ශේෂ අගය පියවා එහි හිමිකාරීත්වය පැවරීම සඳහා හිමිකම් ලබන නිලධාරීන් පිළිබඳව එම පත්‍රිකාවේ "ඊ" වගන්තියේ සඳහන් වේ.

ආයෝජන මණ්ඩලය විසින් කුලීපිට ගැනුම් ක්‍රමයට වාහන ගැනීම වෙනුවට වාහන බද්ධට / කුලියට ලබාගත්තේ නම් මාසික කුලිය වශයෙන් වැඩි මුදලක් හෝ තරමක අඩු මුදලක් ගෙවීමට හැකිව තිබුණි.

කෙසේ වෙතත් කුලීපිට ගැනුම් ක්‍රමයට අදාළ සියලුම වාහන ගණුදෙණු 2012 වර්ෂයේ දී අවසන් වූ අතර සෑම වාහනයක්ම පැවරීම සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන ලදී.

"නිලධාරියෙකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ එතෙක් තමා වෙත පවරනු ලැබ තිබූ වාහනයේ හිමිකාරීත්වය පැවරීම" යන හිසින් යුතුව 2001 මාර්තු මස 20 වැනි දින ඉදිරිපත් කරන ලද මණ්ඩල පත්‍රිකාවේ අංක 5 / 90 දරන රාජ්‍ය පරිපාලන පත්‍රිකාවේ සහ අංක 22/ 99 හා 2000 ජුනි 05 දිනැති චක්‍රලේඛය මඟින් ඊට සිදු කර ඇති සංශෝධනවල දැක්වෙන අදාළ කරුණු සඳහන් කර තිබුණි. නිලධාරියෙකු විසින් පාවිච්චි කළ වාහනයක හිමිකාරීත්වය පැවරීමට අදාළ උපදෙස් එම චක්‍රලේඛයන්හි සඳහන්ව ඇත.

ආයෝජන මණ්ඩලය විසින් 2003 දී වාහන කළමනාකරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක නොකළේ නම් ඉතා විශාල මුදලක් වැය කරමින් පැරණි අනාර්ථික වාහන ඇණිය නඩත්තු කිරීමට හෝ මාසික කුලියක් ගෙවමින් වාහන කුලියට ලබාගැනීමට ආයෝජන මණ්ඩලයට සිදුවන්නට ඉඩ තිබුණි. ඉහත කී තත්වය තුළ ආයෝජන මණ්ඩලයේ වාහන අවශ්‍යතාවය සපුරාලීම සඳහා විකල්ප පියවරක් වශයෙන් වාහන කුලීපිට ගැනුම් ක්‍රමය මත ලබාගැනීමේ ක්‍රියාමාර්ගය අනුගමනය නොකළේ නම් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ඉතිරි කිරීමට හැකියාව නොලැබෙනු ඇත.

කෙසේ වෙතත් ඉදිරියේ දී ශ්‍රී.ලං.ආ.ම. කිසිදු විටක වාහනවල අයිතිය විශ්‍රාම යාමට නියමිත නිලධාරීන්ට නොපවරනු ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සටහන් කළා.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) කරුණු දැක්වීම් නොමැත.

(ආ) EPZZ, EPP, IPP, ROO සහ NEZZ හි මූල්‍ය සමාලෝචනය.

I. <u>ප්‍රධාන කාර්යාලය</u>

සියළු අපනයන සැකසුම් කලාප සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා සේවාවන් සපයන පිරිවැය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රධාන කාර්යාලය ක්‍රියාත්මක වේ. එහෙයින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමස්ත මෙහෙයුම් පිරිවැයෙන් 42% ක ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් පිරිවැය සඳහා වේ.

II. <u>මීරිගම අපනයන සැකසුම් කලාපය (MEPZ), වතුපිටිවල අපනයන සැකසුම් කලාපය (WEPZ), මල්වත්ත අපනයන සැකසුම් උද්‍යාන (MEPP)</u>

කාර්යමණ්ඩල වැටුප් සහ සුභසාධන වියදම් සඳහා වන අධික පරිපාලනමය පිරිවැය හේතුවෙන් මූලික පාඩු දැරීමට සිදුවී ඇත. අපනයන සැකසුම් කලාපයන් හි කුඩා ප්‍රමාණය හේතුවෙන් මූලික යටිතල පහසුකම් සහ කාර්යමණ්ඩල නඩත්තුව කර්මාන්ත සඳහා අනුබල දීම් වස් සිදුකළ යුතු වුවත්, ව්‍යාපාර කටයුතු සඳහා වන බහිෂ්කරන ඉඩම් ප්‍රමාණය සහ අපේක්ෂිත ආදායම් සාපේක්ෂව අඩු මට්ටමක පවතී. කෙසේ වෙතත්, රැකියා උත්පාදනය, අපනයන ආදායම්, විදේශ විනිමය ඉපැයීම් සැලකීමේ දී මෙම අපනයන සැකසුම් කලාප තුනෙහි ආර්ථික වාසි මූල්‍ය සමාලෝචනයෙන් ඇතුළත් කොට නොමැති බව සටහන් කළ යුතුය. ලාභ ඉපැයීම් වස් අපනයන සැකසුම් කලාප පිහිටුවා නොමැති වුවත්, මෙහි සඳහන් පරිදි පුළුල් ජාතික සහ ආර්ථික අරමුණු මුදුන් පත් කර ගැනීමේ අටියෙන් පිහිටුවා ඇත. කෙසේ වුවත්, වතුපිටිවල, මීරිගම, මල්වත්ත යන අපනයන කලාපයන්හි ප්‍රධානීහු ඉතිරිව පවත්නා ඉඩම් අමතර ආදායම් උත්පාදනයෙහිලා තම ආයෝජන කෙරෙහි බහිෂ්කරණය කර ඇත.

III. <u>කොග්ගල අපනයන සැකසුම් කලාපය</u>

නව ආයෝජන සඳහා බහිෂ්කරණය කිරීම පිණිස බොහෝ ඉඩම් පවතී. දැනටමත් අර්ථ දක්වා ඇති යෝජනාවලි හා විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍රයන් සමඟ සිදු කෙරෙන වේගවත් ප්‍රවර්ධන වැඩසටහන් සමඟින් ආදායම් වර්ධනයක් අනාගතයේදී සිදුවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

(අ) සහ (ආ)
සටහන් කරන ලදී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල ප්‍රගතිය

(අ) ආයෝජන මණ්ඩල කළමනාකරණ තොරතුරු පද්ධතියට (MIS) අනුව 2002 - 2012 කාල සීමාව තුළ ගිවිසුම් 2555 ක් අත්සන් කොට ඇත. (වර්තමාන යාවත්කිරීම් අනුව 2563) මෙයින් ව්‍යාපෘති 1233 උක්ත කාල සීමාව තුළදීම අවලංගු කොට, අවසන් කොට හෝ අත්හිටුවා ඇත. කෙසේ වෙතත් වසර 2002 ට පෙර පවා (එනම්, වසර 1978 සිට ) අවබෝධතාවකට එළඹ වාණිජමය මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් ද මෙම ව්‍යාපෘති 1233 ට ඇතුළත් වේ. එහෙයින් එකගතාවයකට එළඹි ව්‍යාපෘතින් වලින් 48% ක් අවලංගු කොට, අවසන් කොට හෝ අත්හිටුවා ඇත යන විගණකාධිපතීන්ගේ ප්‍රකාශය නිර්වද්‍ය නොවන අතර එකගතාවයන්ට එළඹි ව්‍යාපෘති වලට සංසන්දනාත්මක වාර්තාවේ දක්වා ඇති ප්‍රතිශත (5) අර්ථාන්විත කාර්යසාධන දර්ශකයක් ලෙස පිළිගත හැකි නොවේ.

* එකගතා අත්සන් තබන ලද ව්‍යාපෘති 2563 කින් 2002 - 2012 කාලසීමාව තුළ ව්‍යාපෘති 373 ක් පමණක් අවලංගු කොට අවසන් කොට හෝ අත්හිටුවා ඇත.

* ඒ අනුව, අවලංගු කළ, අවසන් කළ හෝ අත්හිටුවන ලද ව්‍යාපෘතිවල ප්‍රතිශතය 48% ක් නොව, 14.6% කි. (කෙසේද යත් 373* 100/2578)

ව්‍යාපෘති අවලංගු කිරීම, අවසන් කිරීම හෝ අත්හිටු වීම සලකුනු කළ 14.6% යනු පිළිගත හැකි අගයකි.

(ආ) වාර්තාවේ සඳහන් 2012 වර්ෂය සඳහා දේශීය විකුණුම් ආයෝජන නිර්වද්‍ය නොවන අතර 2011 වසරට සාපේක්ෂව ( 426) දේශීය විකුණුම් ආයෝජනයේ 43% ක වර්ධනයක් දක්වන 2013 අප්‍රේල් 22 වන දිනැති විගණකාධිපති වෙත යොමු කළ අපගේ ලිපිය ප්‍රකාර, එය ඇ.එ.ජ. ඩොලර් මිලියන 608 ක් ලෙස නිවැරදි විය යුතුය. ඒ අනුව වාර්තාව නිවැරදි කළ යුතුය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) රු. 1, 303,020 වන තැන්පතුව කර්මාන්ත සංවර්ධනය සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලැබූ වර්ග අඩි 2413 බිම් ප්‍රමාණයට අදාළ වේ.

මෙයට අමතරව ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ අංශය ද (වර්ග අඩි 3609), B II ද, L - 12 හි පවත්වාගෙන යන ලද අතර පිළිවෙලින් රු. 649,620 හා රු.684,600 තැන්පතු වශයෙන් ගෙවා ඇත.

ලෝක වෙළඳ මධ්‍යස්ථාන බටහිර කුලුනේ 12 වන මහලේ ගරු. සංවර්ධන අමාත්‍යතුමාගේ (අභාවප්‍රාප්ත මනෝ විජේරත්න මහතා ) කාර්යාලය පිහිටුවා ඇත.

කර්මාන්ත සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් ආයෝජන මණ්ඩලය Overseas Reality Ceylon සමාගම (ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ කළමනාකරණ නියෝජිත) සමග කල්බදු ගිවිසුමකට එළඹී ඇත. 2010 වර්ෂයේ අප්‍රේල් මස සිදුකරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් අනතුරුව අමාත්‍ය වරයාගේ කාර්යාලය හදිසියේම 12 වන මහලෙන් ඉවත්කර ගන්නා ලදී. එහෙයින් බදු ගිවිසුම ප්‍රකාරව Overseas Reality Ceylon සමාගම රු.1, 303,020 වන සුරැකුම් තැන්පතුව රඳවා ගන්නා ලද්දේ එම ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් ඔවුන් වෙත පූර්ව දැනුම් දීමක් සිදු නොකළ බැවිනි.

(ආ) තම නිලධාරීන්ගේ වෛයිකල්පිත විශ්‍රාම වයස දීර්ඝ කිරීමේ දී ආයෝජන මණ්ඩලය අනුගමනය කරන ක්‍රියාපටිපාටිය වනුයේ, අධ්‍යක්ෂක මණ්ඩල අභිමතය පරිදි නිලධාරීන්ගේ කාර්යසාධනය සහ කල්ක්‍රියාව සතුටු දායක නම් වසර 57 සිට 60 දක්වා සේවා දිගුවක් ලබා දීමයි. 10.12.2008 දිනට හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අභ්‍යන්තර විගණක) වයස 57 සැපිරූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඔහුට වසරක සේවා දිගුවක් 10.12.2008 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධානය කරන ලදී.

10.09.2009 ද නමින් යුතු ලිපිය මඟින් ඔහු දෙවන වරටද 10.12.2009 සිට 09.12.2010 දක්වා සේවා දිගුවක් ඉල්ලුම් කරන ලද අතරතුර චෝදනා කිහිපයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පැමිණිල්ලක් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරීම සඳහා පත්කරන ලද විමර්ශන නිලධාරියා තම වාර්තාවෙන් දක්වා සිටිනුයේ හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයා බැලූ බැල්මටම වරදකාරීවන බවයි. මෙම වාර්තාව 11.12.09 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර වැඩිදුරටත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා කොට තීරණයක් ගැනීමට තීරණය කරන ලදී. එහෙයින් 10.12.2009 දින සිට බලපැවැත්වෙන පරිදි මසක සේවා දිගුවක් ඔහු වෙත ලබා දෙන ලදී. 08.01.2010 දන පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී විමර්ශන වාර්තාව සමාලෝචනය කරමින් එහි සඳහන් කරුණු පෙරදැරි කොටගෙන හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ( අභ්‍යන්තර විගණක) සේවා දිගුවක් ලබා නොදීමට තිරණය කරන ලදී. මේ අනුව ආයෝජන මණ්ඩල සේවයෙන් 10.01.2010 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුට විශ්‍රාම ගන්වන ලදී.

මෙම තීරණයට එරෙහි හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අභ්‍යන්තර විගණක) කම්කරු විනිශ්චය සභාව වෙත පැමිණිලි කළ අතර ඔහු විශ්‍රාම නොගන්වා සේවා දිගුව ප්‍රතික්ෂේප කරමින් සේවය අවසන් කළ බව දක්වමින් කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයා සිය අවසන් නිගමනයෙන් රු.61,85,30 හෙවත් මාස 11 ක ඒකාබද්ධ වැටුප හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අභ්‍යන්තර විගණන) වෙත ගෙවන ලෙස ආයෝජන මණ්ඩලයට නියම කරන ලදී.

නීතිපති දෙපාර්තමේනතුවෙන් මේ සම්බන්ධව නීති උපදේශ ලබා ගත් අතර අවසන් තීරණය ලෙස නැවත සේවයේ පිහිටවනු වෙනුවට හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අභ්‍යන්තර විගණන) වෙත රු.618,530 ගෙවන ලදී.

(ඇ) වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ නිවාස ව්‍යාපෘතිය (I ) -(V)

වතුපිටිවල නිවාස ව්‍යාපෘතියෙන් නිවාස විකිණීම 2002 වසරේ දී ආරම්භ කරන ලදී. ආරම්භයේ දී වෘත්තීය වෙන්දේසි කරුවකු මාර්ගයෙන් නිවාස විකිණීම සිදු කල ද එය අසාර්ථක විය. එම නිසා ඉතිරි නිවාස විකිණීම වතුපිටිවල කලාප කාර්යාලය වෙත පවරන ලදී.

මේ වන විට සියළු නිවාස විකිණී අවසන් අතර විකුණුම් ආදායම ලෙස ආයෝජන මණ්ඩලය රු. 24, 582,819 මුදලක් උපයා ඇත. රු. 3, 000,000 මුදලක් වාරික මුදල් ලෙස ලැබිය යුතුව ඇත. (නිවාස ඒකක 07 සහ 13 ) ජනපතිනියගේ ප්‍රධානයක් ලෙස ආයෝජන මණ්ඩලය වෙත නොමිලේ ලබා දී ඇත.

ජනාධිපතිනියගේ ප්‍රධානයක් ලෙස මෙම ඉඩම ආයෝජන මණ්ඩලය වෙත නොමිලේ ලබා දි ඇත.

Perpetual Business Lanka (Pvt) Ltd විසින් නිවාස ඒකක ඉදිකරන ලද අතර එම නිවාස ඒකක ඉදිකිරීම සඳහා වූ පිරිවැය වශයෙන් රු. 19,450,00 /- ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් එම සමාගම වෙත ගෙවීමෙන් අනතුරුව එම නිවාස ව්‍යාපෘතිය ආයෝජන මණ්ඩලය වෙත පවරා ගන්නා ලදී.

නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද සියළු වියදම් ආයෝජන මණ්ඩලය විසින් ආවරණය කර ගෙන ඇති බව ඉහත කරුණු සළකා බැලීමේදී පැහැදිළි වේ.

(ඈ) ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමේ 4.1 වගන්තියෙහි දක්වා ඇති කොන්දේසි සහ 2013.08.16 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා රේගුව විසින් දෙන ලද වැඩිදුර පැහැදිළි කිරීම් මත පදනම්ව ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කර ඇති මුදල් ඉල්ලීම් අනුව අතිකාල ගෙවීම් ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ප්‍රතිපූරණය කළ යුතුව ඇත.

(ඉ) (i) - (iv)

බියගම අපනයන සැකසුම් කලාපයේ ලොට් අංක 26 බී/ 01/A හි පිහිටි අක්කර 01 පර්චස් 35 ක වපසරියකින් යුත් ඉඩමක ප්‍රතිඅපනයනය කිරීම සඳහා, සම්බන්ධ කිරීමේ උපාංග සහ ඒ ආශ්‍රිත අනෙකුත් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වෙළඳ මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම පිණිස 2005.12.22 වන දින එක් සමාගමක් ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹුනි. පසුව, බියගම අපනයන සැකසුම් කලාපය ඇතුළත ලොට් අංක 26/බී හි පිහිටි ඉහත කී සමාගමේ සංවර්ධන කටයුතු නතර කරන ලෙස ආයෝජන මණ්ඩලය විසින් එම සමාගම වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව ඉහත කී ලොට් අංක 26/ බී වෙනුවට මෙම ව්‍යාපෘතිය සඳහා ලොට් අංක 43 හි පිහිටි අක්කර 2ක වපසරියකින් යුත් ඉඩම වෙන්කර දෙමින් එම සමාගම සමඟ 2006.03.06 වන දින අතිරේක ගිවිසුමකට අත්සන් තබන ලදී.

පසු අවස්ථාවකදී ලොට් අංක 43 හි පූර්ව බදුකරු විසින් එම පරිශ්‍රයේ සිදුකරන ලද සංවර්ධනය කිරීම් සඳහා මූල්‍ය හිමිකම් පෑමක් ඉදිරිපත් කරන ලදී. එමගින් පූර්ව හිමිකරුගේ මූල්‍ය හිමිකම් පෑම නිරවුල් කිරීම පිළිබඳව, එම ආයතනය සහ ආයෝජන මණ්ඩලය අතර අර්බුදයක් ඇති විය.

බියගම අපනයන සැකසුම් කලාපයේ ලොට් අංක 43 ට යාබදව ඇති ලොට් අංක 43/ A ඇතුලත අපනයනය කිරීම සඳහා සම්බන්ධ කිරීමේ උපාංග නිෂ්පාදනය කිරීම පිණිස 2005.12.22 වන දින පළමු සමාගමේ අනුබද්ධ සමාගමක් ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹෙන ලදී. ලොට් අංක 43 A හි ඉහත කී පූර්ව බදුකරු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය හිමිකම්පෑම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් වූ අර්බුදය හේතු කොටගෙන අර්ධ වශයෙන් වැඩිදුයුණු කොට තිබු ලොට් අංක 43 A හි පිහිටි අනුබද්ධ සමාගමේ ව්‍යාපාරික කටයුතු ද නැවතුනි.

ලොට් අංක 43 සහ 43/ A ඉහත කී බදුකරු විසින් කලින් භාවිත කර තිබු අතර ගොඩනැඟිලි සඳහා වූ පිරිවැය මෙම නව ආයෝජකයන් දෙදෙනා වෙතින් නැවත ඉල්ලා තිබුණි.

ඉන් අනතුරුව, අලාභ සඳහා වන්දි ඉල්ලමින් මෙම අර්බුදය අනුබද්ධ සමාගම විසින් සමථකරණය සඳහා යොමු කරන ලදී. සමථකරණ නියෝගය ආයෝජන මණ්ඩලයට එරෙහිව 2011.02.22 දින නිකුත් කරන ලද

අතර ඒ අනුව රු.මි. 32 ක මුදලක් ගෙවීමට ආයෝජන මණ්ඩලයට සිදුවිය. එම රු.මි. 32 ක ගෙවීම ආයෝජන මණ්ඩලය විසින් නිරවුල් කරන ලදී.

එම සමාගම් දෙකම නෙදර්ලන්තයේ පිහිටි සමාගමක් පූර්ණ වශයෙන් හිමිකම දරන අනුබද්ධ සමාගම් දෙකකි.

තමන්ට සෘජු ලෙස සිදුවූ අලාභය ඇ.ඩො.760.75 සහ ශ්‍රී ලංකා රු.23,548,314.00 ලෙස දක්වමින් පළමු සමාගම විසින් ඔවුන්ගේ 2011.10.12 දිනැති ලිපිය මඟින් ආයෝජන මණ්ඩලය වෙත මූල්‍ය හිමිකම්පෑමක් ඉදිරිපත් කරන ලදී.

පළමු සමාගමේ නියෝජිතවරුන් සහ ආයෝජන මණ්ඩලය අතර සාකච්ඡා මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව, ආයෝජන මණ්ඩලය විසින් සිදුවූ අලාභ වෙනුවෙන් සමාගමට ගෙවියයුතු මුදල රු.7,178,110.75 ලෙස පාර්ශවයන් දෙකම අවසන් එකඟතාවකට පැමිණෙන ලදී. ඉදිකිරීම් වැඩ නතර කරන අවස්ථාවේදී ව්‍යාපෘතියේ වාස්තු විද්‍යාඥයන් වන Design Arcade හි වාස්තු විද්‍යාඥයකු විසින් සහතික කරන ලද පරිදි සිදු කළ වැඩ ඉහත මුදලට අයත් වේ. රු.7,178,110.75 ක් වූ අවසන් එකඟතාව එම සමාගම විසින් ඔවුන්ගේ 2012.02.27 දිනැති ලිපිය මඟින් පිළිගන්නා ලදී.

පළමුව වෙන්කර දෙන ලද ඉඩම් වල (හිස් ඉඩම්) වැඩ නැවැත්වීම සඳහා ආයෝජන සමාගම් දෙක වෙත ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කරන ලද උපදෙස් අනුගමනය කිරීමෙන් සහ සාකච්ඡා කිහිපයකින් අනතුරුව, බියගම අපනයන සැකසුම් කලාපයේ ලොට් අංක 43 සහ 43/ A හි තම ව්‍යාපෘති ස්ථාපිත කිරීමට සමාගම් දෙකම එකඟවූහ. මෙම ඉඩම් කැබලි දෙකම පූර්ව බදුකරු විසින් කලින් භුක්තිවිඳි අතර එම බදුකරු විසින් ඉදිකරන ලද ගොඩනැගිලි දෙකක් එහි විය.

2006.02.13 දිනැති ලිපිය මඟින් සමාගම් දෙක වෙතම පහත දැක්වෙන ප්‍රකාශනය ඇතුළත් පොදු ලිපියක් ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කරන ලදී. ආයෝජන මණ්ඩලයට කලින් සිදු කිරීමට නොහැකි වූ වැදගත් තහවුරු කිරීමක් පසුව එය විසින් ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අර්බුදයක් ඇති වූ අතර සමථකරණය අවසන් වීමට පෙර අනුබද්ධ සමාගමේ කටයුතු අවසන් විය.

" අදාළ සමාගම් ආයෝජන මණ්ඩලය සමඟ බදු ගිවිසුම් වලට එළඹෙන විට, ඔබගේ ඉඩම් භාවිතය සහ භුක්තිවිඳීම කිසියම් තුන්වන පාර්ශවයකට බැඳී නොපවතින බවට ඔබේ සමාගම් විසින් සහතික විය යුතුය"

අනුබද්ධ සමාගමේ වාසියට දෙන ලද සමථකරණ ප්‍රදානය, ඔවුන්ගේ අවසන් තීරණය සඳහා තීරණාත්මක සාධක සඳහා බලපාන කරුණු වලින් එකක් වශයෙන් සලකන ලදී.

ඉහත කී අනුබද්ධ සමාගමේ වාසියට දෙන ලද සමථකරණ ප්‍රදානය අනුව සහ ආයෝජන මණ්ඩලයට එරෙහිව පළමු සමාගම විසින් සමථකරණ කටයුතු ඉදිරියට කරගෙන යෑම මඟින්, රු. 7,178,110.75 ක් වන එකඟ වූ වන්දි මුදලට බොහෝ වැඩි වන්දි මුදලක් තීරණය වීමට තිබූ බැවින් ඉහත සඳහන් ගෙවීම සිදු කර මෙම ගැටළුව අවසන් කිරීම ආයෝජන මණ්ඩලය පාර්ශවයෙන් සලකා බලන විට සාධාරණ වේ.

2012 අප්‍රේල් 10 වන දින පැවති රැස්වීමේදී මෙම තත්ත්වය පැහැදිලි කිරීමෙන් අනතුරුව, ආයෝජන මණ්ඩලය සමඟ ඇති වූ මතභේදයේ ප්‍රතිඵලයක් වශයෙන් බියගම අපනයන සැකසුම් කලාපයෙ පැවති ව්‍යාපෘතියේ කටයුතු නතර කිරීම හේතු කොට ගෙන සිදු වූ අලාභ සම්බන්ධයෙන් සමාගම ඉදිරිපත් කල මූල්‍ය හිමිකම් පෑම පූර්ණ සහ අවසන් වශයෙන් සමථයකට ලක් කිරීම සඳහා පළමු සමාගම වෙත රුපියල් 7,178,110.75 ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

ඉහත කී සමාගම් දෙක වෙත පළමුව වෙන් කර දුන් ලොට් අංක 26 බී සහ 26 බී/1/බී , අපනයන කලාපයේ මෙහෙයුම් ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති කලාපයේ සේවා ප්‍රදේශයේ පිහිටි ඉඩම් කැබලි වේ. ප්‍රාග්ධන වියදම්ද සමඟ අවශ්‍ය සියළු යටිතල පහසුකම් සැපයීමට ආයෝජන මණ්ඩලයට සිදු විය. විධායක අධ්‍යක්ෂ (කලාප) විසින් 2006 ජනවාරි මාසයේදී සිදු කරන ලද පරීක්ෂණයකට අනුව, මෙම ප්‍රදේශයේ කර්මාන්ත කරුවන්ට සහ විශාල කර්මාන්තශාලා සේවක සංඛ්‍යාවට සේවා පහසුකම් සැලසීම සඳහා ආයෝජන මණ්ඩලය සතු වෙනත් ඉඩම් නොමැති බැවින් ඒ සඳහා මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීම

පිණිස මෙම තීරණය සමාලෝචනය කරන ලදී. එබැවින් විකල්ප ඉඩම සහ කර්මාන්තශාලා පරිශ්‍රය එම කර්මාන්ත දෙක ස්ථානගත කිරීම සඳහා පිරිනමන ලදී. ඒ අනුව පළමු බදු කරුගේ පරිශ්‍රයන් වෙත මෙම කර්මාන්ත දෙක ගෙන යාම සඳහා ආයෝජන මණ්ඩලයට වලංගු හා පිළිගත හැකි හේතුවක් තිබේ.

(ඊ) හොරණ අපනයන සැකසුම් කලාපයේ සිට කළුගඟ දක්වා ඇතිරීමට යෝජිතව තිබූ treated effluent disposal line සඳහා මාර්ග ප්‍රතිසංස්කරණ ගාස්තු වශයෙන් ගෙවීමට තිබූ මුදල වශයෙන් රුපියල් 1,301,584.23ක මුදලක් හොරණ ප්‍රාදේශීය සභාව වෙත මුදා හරින ලදී. බැහැර කිරීමේ ස්ථානය හොරණ කඳන ප්‍රදේශයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජලය රැස් කිරීමේ ඉහළ ජලාධාර ප්‍රදේශයේ පිහිටා තිබූ බැවින් නල මාර්ග ඇතිරීමේදී විරෝධතාවන්ට ලක්වීමට සිදු විය. එබැවින් නල මාර්ග ඇතිරීමේ යෝජනාව ක්‍රියාත්මක නොකරන ලදී. වගවත්ත යෝජිත කර්මාන්ත කලාපයේ සිට යෝජිත මඟින් treated effluent disposal line සමඟ නල මාර්ග සම්බන්ධ කිරීමේ අරමුණ ඇතිව නල මාර්ග වගවත්ත දක්වා සැලසුම් කිරීමට පසුව පියවර ගන්නා ලදී. මෙම යෝජිත treated effluent disposal line ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජලය එක්රැස් කිරීමේ ප්‍රදේශයෙන් පහල පිහිටි ප්‍රදේශයක් දක්වා අතුරනු ඇත.

එබැවින්, නව මාර්ගයේ මාර්ග ප්‍රතිසංස්කරණ පිරිවැය දැනුම් දෙන ලෙස හොරණ ප්‍රාදේශීය සභාවට දැනුම් දෙන ලද අතර දැනටමත් මුදාහැර ඇති මුදල් නව නල මාර්ග අනුරේඛණය සඳහා වැය කිරීමට නියමිතය. නව ඇස්තමේනතුව හා මුදාහැර ඇති මුදල් ප්‍රමාණය අතර වෙනසක් වේ නම් ඉතිරි මුදල අයකර ගැනිමට හෝ කිසියම් අතිරේක මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය සභාව වෙත එය මුදා හැරීමටත් පියවර ගනු ඇත.

(උ) (i) රු. 54,802,152.44 ක මුදලකින් යුත් ජල බිල්පත්, බිම් කුලිය සහ බංගලා කුලිය නොගෙවීම හේතු කොට ගෙන MDF Board නිෂ්පාදන සමාගමක් වෙත සැපයූ සේවාවන් 2006.07.29 වන දින ආයෝජන මණ්ඩලය විසින් නවතා දමන ලදී. මේ සම්බන්ධයෙන් එම සමාගම අංක 14521- JB යටතේ ICC බේරුම්කරණය සඳහා අයදුම් කරන ලද අතර ඒ අනුව සතුටුදායක ප්‍රදානයක් එම සමාගමට ලැබුණි. 2003.03 .03 දිනැති අතිරේක ගිවිසුම මඟින් ආයෝජන මණ්ඩලය එම සමාගමට ලබා දී තිබූ අක්කර 437 ක ඉඩමේ භෞතික සන්තකය භාර දෙන ලෙස එහිදී ඔවුන්ට දැනුම් දෙන ලදී.

ඉහත කී බේරුම්කරණ ප්‍රදානය අවලංගු කර ගැනීම පිණිස ආයෝජන මණ්ඩලය විසින් අංක HC(Arb) 2012/ 10/A යටතේ කොළඹ මහ අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. එම නඩුව තවමත් මහ අධිකරණයේ විභාග වෙමින් පවතින අතර ඊළඟ නඩු දිනය 2013.09.26 වන දිනට යෙදී ඇත.

(ii) මෙම ව්‍යාපෘති යෝජනාව රබර් සංවර්ධන අධිකාරියෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්ගේ මට්ටමින් සළකා බලා අනුමත කර ඇති බව නිරීක්ෂණය වේ.

ආයෝජන මණ්ඩලය විසින් දැනට අනුගමනය කරනු ලබන නව ආයෝජන අනුමත කිරීමේ ක්‍රමය, විගණකාධිපති විසින් වාර්තා කර ඇති පරිදි සමාන ආකාරයේ අතපසු වීම් වැළැක්වීම සඳහා දැඩි පාලනයක් අන්තර්ගත කර ඇති අතර ආයෝජනය සඳහා ආයෝජන මණ්ඩලය විසින් අනුමැතිය ලබාදීමට පෙර අදාළ අධිකාරීන්ගෙන් හා ආයතන යනාදීයෙන් අවශ්‍ය අනුමැතින් ලබා ගැනීම සහතික කර ඇත.

(iii) දැනට විභාග වෙමින් පවතින නඩු හේතු කොට ගෙන අදාළ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකිවී ඇත.

(ඌ) (i) Perth Estate කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2006.09.08 දින පැවති රැස්වීමේ දී දෙන ලද නියමයන්ට අනුව, හොරණ Perth Estate හි ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2006 වසර තුළදී සිදු කරන ලදී.

(ii) ආයෝජන මණ්ඩලය විසින් ඉල්ලීම් කිහිපයක් සිදුකල ද Perth Estate හි 2007.ජනවාරි සිට අගෝස්තු දක්වා වන කාලපරිච්ඡේදය වෙනුවෙන් විගණනය කරන ලද ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මේ වන තෙක් ඉදිරිපත් කර නොමැත.

(iii) 2007.ජනවාරි සිට අගෝස්තු දක්වා වන කාලපරිච්ඡේදය වෙනුවෙන් විගණනය කරන ලද ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව වෙතින් ලැබුන පසු රාජ්‍ය වැව්ලි සංස්ථාවෙන් ලැබීමට නියමිත නිවැරදි මුදල් ප්‍රමාණය හඳුනා ගත හැකි වනු ඇත.

(iv) සාකච්ඡා කටයුතු සිදු කරමින් පවතී.

4.3 <u>වත්කම් කළමනාකරණය</u>

(අ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහාධිපත්‍ය ඒකක

(i) මෙහි 6 වන මහලෙහි ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ වුවද නවීකරණ කටයුතු වසර 2ක් තිස්සේ ප්‍රමාද වී ඇත. අධිකරණ අමාත්‍යාංශය සමඟ ආයෝජන මණ්ඩලය ගිවිසුමකට එළඹ ඇති අතර ඔවුන් විසින් අදාළ කුලී මුදල 2013 පෙබරවාරි මාසයේ දී ගෙවන ලදී.

අලුතින් ස්ථාපිත කරන ලද ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ කටයුතු ආරම්භ වීමෙන් පසුව එම අමාත්‍යාංශය ස්ථාපිත කිරීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් ඉඩකඩ ලබා ගැනීමට අවශ්‍ය වූ අතර එබැවින් 6වන මහලෙන් කොටසක් ඒ සඳහා භාවිත කරන ලදී.

එහිදී, අධිකරණ අමාත්‍යාංශය සමඟ අත්සන් තැබූ කුලී ගිවිසුම ආයෝජන මණ්ඩල විසින් නතර කරන ලද අතර මණ්ඩලය වෙත ගෙවන ලද කුලී මුදල් නැවත අධිකරණ අමාත්‍යාංශය වෙත ගෙවන ලදී.

ආයෝජක සේවා දෙපාර්තමේන්තුව දැනට කොළඹ 01 හි ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවතෙහි පිහිටි වසර සීයකට වඩා පැරණි ගොඩනැගිල්ලක ස්ථාන ගතව ඇත. මෙම ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදු කිරීම අත්‍යවශ්‍යවී තිබේ. සිවිල් ඉංජිනේරු උපදේශක වරුන්ගේ නිරීක්ෂණයන්ට අනුව, මෙම ගොඩනැගිල්ලට මහා පරිමාණ නවීකරණ කටයුතු හැකි ඉක්මනින් කළ යුතුව ඇත. ඊට අමතරව, මෙම ගොඩනැගිල්ලේ නඩත්තු පිරිවැය ඉතාමත්ම අධිකය. ( පසුගිය වසර කිහිපයක වියදම් සළකා බැලීමේ දී) එබැවින්, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 6 වන මහලෙහි ඉතිරිව පවතින බිම් ප්‍රදේශයෙහි ආයෝජක සේවා දෙපාර්තමේන්තුව ප්‍රතිස්ථාපනය කිරීමට ආයෝජන මණ්ඩලය තීරණය කරන ලදී.

(ii) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ආයෝජන මණ්ඩලය පිහිටි මහල් වල නියෝජ්‍ය අමාත්‍ය කාර්යාල ස්ථාපිත කිරීමට ගරු. ආර්ථික සංවර්ධන අමාත්‍ය තුමා විසින් උපදෙස් ලබා දුන් අතර ගරු. ලක්ෂ්මන් යාපා අබේවර්ධන සහ ගරු. මුත්තු සිවලිංගම් යන නියෝජ්‍ය අමාත්‍ය වරුන්ගේ කාර්යාල පිළිවෙලින් 25 සහ 27 යන මහල් වල ස්ථාපිතව ඇත. අමාත්‍යාංශය විසින් භාවිත කරනු ලබන බිම් ප්‍රමාණය සඳහා ඉන්වොයිස්පත් සහ බදු ගිවිසුම් ආයෝජන මණ්ඩලය විසින් යවා ඇති නමුත් ඒ සඳහා ඔවුන් ප්‍රතිචාර දක්වා නොමැත. ඉතිරි මුදල ලබා ගැනීම සඳහා තවමත් කටයුතු කරමින් පවතී.

කෙසේ වුව ද ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමෙන් අනතුරුව 25 සහ 27 යන මහල් වල අමාත්‍යාංශය විසින් භාවිත කරනු ලබන බිම් ප්‍රදේශය කුලියට දීම පිණිස අමාත්‍යාංශය සමඟ ආයෝජන මණ්ඩලය විසින් බදු ගිවිසුම් අත්සන් තබා ඇත.

27 වන මහලෙහි ගරු. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය මුත්තු සිවලිංගම් මහතා විසින් භාවිත කරන බිම් ප්‍රදේශය සඳහා බදු ගිවිසුම් අත්සන් තැබීම පිණිස අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

4.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) 2012.12.31 දිනට කාර්ය මණ්ඩලයේ විවිධ කාණ්ඩයන්හි පුරප්පාඩු 110 ක් පැවති බව සඳහන් කර ඇත. කෙසේ වුවද ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය හේතු කොට ගෙන 2012.12.31 දිනට පුරප්පාඩු 49 ක් නැවත පිරවීමක් සිදු නොකරණ බව අවධානයට ගතයුතුව ඇත. තවද, අනියම් සේවකයන් 6ක් සහ ද්වීතියන පදනම මත සිටි සේවකයෙක් විගණන විමසුමේ දී සළකා බලා නොතිබුණි. ඊට අමතරව අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු නොමැතිව විධායක කාර්ය මණ්ඩලයේ 7 දෙනෙකු සිටින අතර මෙම තනතුරු

ඔවුන්ටම පෞද්ගලික වන සේ පවත්වාගෙන යනු ලැබේ. එම තනතුරු එම නිලධාරීන් විශ්‍රාම ගිය පසු නැවත පුරවනු නොලැබේ. තවද, කළමනාකරණ සහකාර කාණ්ඩයේ සහ ප්‍රාථමික මට්ටම් කාණ්ඩයේ සේවකයන් 20 ක් අනුමත කාර්ය මණ්ඩලයට වඩා සිටින අතර ඔවුන්ගේ තනතුරු සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු නිසිපරිදි ඇති වූ අවස්ථාවකදී නියමානුකූල කරනු ඇත. ඒ අනුව, 2012.12.31 දිනට පවතින සැබෑ පුරප්පාඩු සංඛ්‍යාව 81 කි. එසේ වුවද ඉහත පුරප්පාඩු 81 න් පුරප්පාඩු 8 ක් 2013 වසරේ දී දැනටමත් පුරවා ඇති අතර තවත් පුරප්පාඩු 25 ක් පිරවීමේ කටයුතු සිදු කරමින් පවතී. දැනට පවතින පුරප්පාඩු එකී පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාව මත යථා කාලයේ දී පුරවනු ඇත. තවද, පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ගතවනුයේ ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාව මෙන්ම ආයෝජන මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුවත්පත් දැන්වීම් පලකිරීම මඟින් අභ්‍යන්තර හා බාහිර වශයෙන් අයදුම්පත් කැඳවීමෙ අවශ්‍යතාව පවතින බැවිනි.

(ආ) ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැනීම් හේතුකොට ගෙන ඇතිවූ පුරප්පාඩු පිරවීම සඳහා විධිවිධාන නොමැත. එම යෝජනා ක්‍රමයට අනුව යටපත් කරන ලද තනතුරු පහත පරිදි වේ.

| තනතුර | ස්වෙච්චෙන් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ලත් සේවකයන් සංඛ්‍යාව |
|---|---|
| විධායක අධ්‍යක්ෂ | 1 |
| අධ්‍යක්ෂ | 1 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 5 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 3 |
| විධායක සහකාර | 4 |
| ඉංජිනේරු ~~~ 1 ශ්‍රේණිය | 1 |
| පරිගණක ක්‍රියාකරු ~~~ 1 ශ්‍රේණිය | 1 |
| ලේකම් ~~~ 1 ශ්‍රේණිය | 1 |
| යතුරු ලේඛක ~~~ 1 ශ්‍රේණිය | 4 |
| ගබඩා පාලක ~~~ 1 ශ්‍රේණිය | 1 |
| ආරක්ෂක නිලධාරී | 2 |
| ආරක්ෂක පරීක්ෂක | 2 |
| ආරක්ෂක නියාමක | 2 |
| කළමනාකාර සහකාර | 8 |
| රියැදුරු | 4 |
| කාර්යාල සහයක | 5 |
| කම්කරු | 4 |
| එකතුව | 50 |

එබැවින්, අදාළ සේවකයා විශ්‍රාම ගියපසු එකී පුරප්පාඩුව නැවත පිරවීම අවශ්‍ය නොවන හෝ එම පුරප්පාඩුව ඒ සඳහා මුදාහැරිය හැකි වෙනත් අයෙකු මඟින් පිරවිය හැකි තනතුරු සඳහා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය පිරිනමන බව 2011.03.23 දිනැති අංක EC/12/EST/188 දරණ චක්‍රලේඛනයෙහි සඳහන්ව ඇත. රජයේ ආර්ථික සංවර්ධන ක්‍රමෝපාය සමඟ අනුගත වන පරිදි ප්‍රතිව්‍යුහ ගත කිරීමෙ ක්‍රියාවලියක් සමගාමීව දියත් කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන, ප්‍රවර්ධන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තු ඒකාබද්ධ කොට අංශ කණ්ඩායම් පිහිටුවන ලදී. එබැවින්, මුදල් දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව දෙපාර්තමේන්තු කිහිපයක කටයුතු කලාප අතර විමධ්‍යගත කිරීමට යෝජනා විය. ඒ අනුව, කලින් සිටි විධායක අධ්‍යක්ෂ (මුදල්) විසින් ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැනීම සඳහා කරන ලද ඉල්ලීම සඳහා හිටපු සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබා දෙන ලද අතර මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ (මුදල්) වෙත බලය පවරන ලදි.

4.5 හඳුනාගනු ලැබූ අලාභ

පුත්තලම ප්‍රාදේශීය ලේකම්ගේ විෂය පථය යටතේ පවතින අක්කර 250 ක වපසරියකින් යුත් ඉඩම භාවිත කිරීම සඳහා ආයෝජන මණ්ඩලය දැන් තීරණය කර ඇත. එම ඉඩම භාවිතා කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන විකල්පයන් 2 ක දැනට සාකච්ඡාවට ලක් කරමින් පවතී.

* ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය යටතේ උසස් අධ්‍යාපන අංශයේ ආයෝජන ව්‍යාපෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා හැකියාව පවතින භූමියක් වශයෙන් මෙම ඉඩම ප්‍රදානය කිරීම.

* ඉහත සඳහන් පරිදි ආයෝජන ව්‍යාපෘතියක් සඳහා කැමැත්ත දක්වන ආයෝජකයෙකු හඳුනාගැනීමට නොහැකි වුවහොත්, මෑතකදී වැලිවේරිය ප්‍රදේශයේ කම්හලක සිදුවූ සිද්ධිය සැළකිල්ලට ගෙන, කර්මාන්ත සඳහා ඉඩ සැලසීම පිණිස තවත් කර්මාන්ත පුරවරයන් ස්ථාපිත කිරීමට රජය විසින් දී ඇති මඟ පෙන්වීම් සළකා බලමින් කර්මාන්ත පුරවරයක් වශයෙන් මෙම ඉඩම භාවිත කිරීම.

## 5. වගවීම සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2013 - 2017 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචනයට ලක් වන වර්ෂය ඇතුළත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම තාක්ෂණික සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා වන අනුමැතිය 2013.02.19 දින ලබා ගන්නා ලදී.

5.3 විගණන කමිටුව

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/ 12 හි දක්වා ඇති පරිදි විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා පියවර ගෙන ඇත.

5.4 අයවැය පාලනය

ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්ගෙන් එකක් වශයෙන් කළමනාකරණ පාලනය සඳහා ඵලදායී ආකාරයට අයවැය භාවිත කොට නොමැති බව පැවසීම නිවැරදි නොවේ. වියදම් පාලන සහ අදායම් ඉලක්ක සපුරාගැනීම සඳහා වන ක්‍රියාමාර්ගයක් වශයෙන් අප අනිවාර්ය ලෙසම අයවැය භාවිත කොට ඇත.

## 6. ක්‍රමවේදයන් සහ පාලනයන්

(අ) නීති, රීති සහ රෙගුලාසි පිළිපැදීම.

කරුණාකර ඉහත 2.2.4 සඳහා දී ඇති පිළිතුර බලන්න.

(ආ) ව්‍යාපෘති අධීක්ෂණය .

හඳුනාගනු ලැබූ ගැටළු නැවත සිදුවීම වැළැක්වීම සඳහා අදාළ අංශයන්හි ව්‍යාපෘති නිලධාරීන් මඟින් ව්‍යාපෘති සමීප ලෙස අධීක්ෂණය කිරීම හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් මෑතකදී පිහිටුවන ලද අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් පියවර ගෙන ඇත.

(ඇ) ණය එකතු කිරීම

බිම් කුලීය සහ වාර්ෂික ගාස්තු සඳහා සෑම වර්ෂයකම ජනවාරි පළවන දා වන විට සියළු ව්‍යවසායකයන් වෙත මණ්ඩලය විසින් ඉන්වොයිස්පත් යවනු ලැබේ. ගිවිසුමට අනුව, වාර්ෂික ගාස්තු සහ බිම් කුලිය එක් එක් වර්ෂයේ ජනවාරි 10 වන දිනට පෙර ගෙවීයයුතුව ඇත.

නියමිත කාලසීමාවන් තුළදී සිහිකැඳවීම් යැවීම මඟින් අදාළ ආයතනයන්ගෙන් අයවිය යුතුව ඇති මුදල් එක් රැස් කර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.

ලැබීමට ඇති මුදල් අයකර ගැනීම කඩිනම් කිරීම සඳහා අධීක්ෂණ ඒකකයක් 2013.05.01 දින සිට වෙනමම පිහිටුවා ඇති අතර එහි ප්‍රගතිය පහත දක්වා ඇත.

* වාර්ෂික ගාස්තු - 1995 - 2011 දක්වා වාර්ෂික ගාස්තු වශයෙන් සමාගම් විසින් ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතුව ඇති සම්පූර්ණ හිඟ මුදල

| ආයතනයන් හි තත්වය | ආයතන සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|
| වාණිජමය මෙහෙයුම් වල යෙදී සිටින ආයතන | 344 | 79,112,717.84 |
| අවලංගු කරන ලද ආයතන | 355 | 119,622,171.85 |
| එකතුව | 699 | 198,734,889.69 |

* බිම් කුලීය - බිම් කුලිය වශයෙන් 2011 වසරේ සහ ඊට පෙර සිට ආයතන විසින් ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතුව ඇති සම්පූර්ණ හිඟ මුදල

| | |
|---|---|
| ආයතන සංඛ්‍යාව | 48 |
| හිඟ මුදල | රු. 74,900,722.36 |

* හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය

| | | |
|---|---|---|
| ගෙවීම් පැහැරහැර ඇති සම්පූර්ණ ආයතන සංඛ්‍යාව | 699<br>48 | 198,734,889.69<br>74,900,722.36 |
| ලැබීමට ඇති සම්පූර්ණ හිඟ මුදල(2011 සහ ඊට පෙර) | 747 | 273,634,612.20 |
| දක්වා ඇති හිඟ මුදල්<br>(1995 – 2007 ජුලි අතර ගෙවීම් පැහැර හැර ඇති වාර්ෂික ගාස්තු) | 216 | 95,653,636.11 |
| තවමත් විස්තර කර නොමැති හිඟ මුදල්<br>වාර්ෂික ගාස්තු<br>බිම් කුලීය<br>විස්තර කොට නොමැති සම්පූර්ණ හිඟ මුදල | <br>ආසන්න වශයෙන් 430<br>ආසන්න වශයෙන් 53 | <br>88,623,107.66<br>74,900,722.36<br>163,523,830.02 |
| නීති දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | | |
| යවන ලද සම්පූර්ණ එන්තරාවාසි සංඛ්‍යාව (2008 2012) | 262 | |
| නිරවුල් කරන ලද (ඉහත 262 න් ) | 91 | |
| යවන ලද සම්පූර්ණ එන්තරාවාසි සංඛ්‍යාව( 2008 – 2013 අගෝස්තු 31) | 388 | |
| බාර නොගෙන ආපසු පැමිණි එන්තරාවාසි සංඛ්‍යාව (2008 2013 අගෝස්තු) | ආසන්න වශයෙන් 77 | |
| පැහැර හැර ඇති ආයතන වලට එරෙහිව 2009 දී ගොනු කරන ලද නෛතික ක්‍රියාමාර්ග | 5 | |
| නෛතික ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව නිරවුල් කරන ලද | 2 | |
| 2013 ජුනි 20වන දින ගොනු කරන ලද නෛතික ක්‍රියාමාර්ග | 4 | |
| 2013 ජුනි මාසයේ දී පැවරීමට නියමිතව ඇති නෛතික ක්‍රියාමාර්ග (ආයෝජන මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුවට අනුව) | 18 | |
| සමථ මණ්ඩලයට යොමු කරන ලද ( රු. 250,000/ ට අඩු මුදල් සඳහා ) | 46 | |

<u>අධීක්ෂණ ඒකකය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

ඉහත හිඟ මුදල් සම්බන්ධයෙන් පහත දැක්වෙන පියවරයන් ගැනීම පිණිස අධීක්ෂණ ඒකකය කටයුතු කරමින් සිටී.

* එන්තරාවාසි යැවීමේදී සහ හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගැනීමට නියමිත පියවරයන් පිළිබඳව නීති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීමයි. මේ වන විට, ගෙවීම් පැහැර හැර ඇති ආයතන 27 කට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ තවත් ආයතන 19 කට එන්තරාවාසි යැවීමට අධීක්ෂණ ඒකකය විසින් නීති දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර ඇත.

* හිඟ මුදල් අංශ මට්ටමින් සහ කලාප මට්ටමින් කාණ්ඩගත කිරීම සහ ඒවා පසුවිපරම් කිරීම සඳහා අදාළ අංශ සහ කලාප කාර්යාල වෙත ඉදිරිපත් කිරීම.

* යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව, ගෙවීම් පැහැරහැර ඇති ආයතන වෙතින් ලැබුනු ප්‍රතිචාර සම්බන්ධයෙන් නීති, මුදල් හා ආයෝජන අංශ කණ්ඩායම් අංශ සමඟ සාකච්ඡා කිරීම.

* වාණිජමය මෙහෙයුම් සිදු කරන ආයතන වෙත ලිපි යැවීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම. මේ දක්වා ලිපි 52 ක් යවා ඇත. අවලංගු කරන ලද ආයතන සම්බන්ධයෙන් සලකා බලන විට ඔවුන් වෙත එන්තරාවාසි යැවීමේ ක්‍රියාවලියෙහි නීති දෙපාර්තමේන්තුව නියුක්තව සිටින අතර අදාළ ආයතන විසින් එකී මුදල් ගෙවනු නොලැබුවහොත් නීති දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම හෝ අදාළ හිඟ මුදල රු. 250,000/- ට අඩු නම් ඒවා සමථ මණ්ඩලය වෙත යොමු කිරීම.

  මෙම ක්‍රියාමාර්ග තවදුරටත් කඩිනම් කිරීම පිණිස පෞද්ගලික ණය එකතු කිරීමේ ආයතනයක් පත් කිරීම සඳහා ඉහළ කළමනාකාරීත්ව මට්ටමින් සාර්ථක සාකච්ඡා කිහිපයක් පවත්වමින් සිටී.

<u>අධීක්ෂණ ඒකකය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ලැබුණ ගෙවීම්</u>

* ආයතන 11 ක් විසින් රු.මි. 18.8 ක ගෙවීමක් සිදු කර ඇත.

* තවත් ආයතන 8ක් පොලී රහිතව වාරික පදනම මත ගෙවීමට එකඟ වී ඇත. පොලිය කපා හැරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගනිමින් පවතී.

(ඈ) පිරිස් කළමනාකරණය

කරුණාකර ඉහත 4.4 සඳහා දී ඇති පිළිතුර බලන්න.

(ඉ) වත්කම් කළමනාකරණය

කරුණාකර ඉහත 4.3 සඳහා දී ඇති පිළිතුර බලන්න.

# විගණන කමිටු වාර්තාව

1999.11.19 අංක ඡෑරැ/ජ්ඡ 3 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව ස්ථාපිත කරන ලද විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | ඒෂන ද සිල්වා මහතා<br>(ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 2. | සාමාජික | - | සංජීව වික්‍රමනායක මහතා<br>(ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 3. | සාමාජික | - | අනුර ජයසිංහ මහතා<br>(ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 4. | සාමාජික | - | එස්.ආර්. ආටිගල මහතා<br>(භාණ්ඩාගාර නියෝජිත) |
| 5. | නිරීක්ෂක | - | ජී.එල්.ආර්. වසන්ත මහතා<br>(ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී) |

විගණන කමිටුවෙහි ලේකම්/ කැඳවුම්කරු ලෙස වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා (අභ්‍යන්තර විගණන) කටයුතු කරන ලදී.

විගණකාධිපති නියෝජනය කරමින් රාජ්‍ය විගණන අධිකාරීවරයාද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙහි නියෝජිතයකුද විගණන කමිටු රැස්වීම් වලදී නිරීක්ෂකයන් දෙදෙනෙකු වශයෙන් සහභාගී වන ලදී.

සමාලෝචිත වර්ෂය සඳහා විෂය පථය වගකීම් තීරණය කිරීම සහ විගණන වැඩසටහන සකස් කිරීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණක සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණයෙන් යුතුව විගණන කමිටුව කටයුතු කරන ලදී.

තවදුරටත්, අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණකාධිපති ගේ වාර්තා සමාලෝචනය කළ කමිටුව විසින් නිවැරදි කිරීමේ සහ මගහැරවීම් පිළිබඳ උපදෙස් දී එවැනි වාර්තාවන්හි ගෙනහැර දක්වන ලද කරුණු පිළිබඳව ඉදිරි කටයුතු සම්බන්ධයෙන්ද ක්‍රියාමාර්ග සඳහා උපදෙස් දෙන ලදී.

රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව කමිටුව මගින් සමාලෝචනය කරනු ඇති කරුණු සම්බන්ධයෙන් විගණන කමිටුව විසින් සිය අදහස් දක්වන ලද අතර ඒ සඳහා වන පෙර සූදානම පිළිබඳවද උපදෙස් දෙන ලදී.

විගණන කමිටුවේ අදහස වනුයේ කමිටුව සඳහා වන නියමයන් සහ නිර්දේශයන් හැකි සෑම ආකාරයකින් ඉටුකොට ඇති බවයි.

# ඇමුණුම්

# කාර්යසාධනයේ සුවිශේෂී අවස්ථා
## සංඛ්‍යාලේඛනාත්මක සාරාංශය 2011 ට සාපේක්ෂව 2012

| ප්‍රධාන දර්ශක ව්‍යාපෘති තත්ත්වය මත පදනම්ව | | 2011 | 2012* | 2011/2012 % වෙනස |
|---|---|---|---|---|
| *ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති* | | | | |
| අ. ලැබුණු අයදුම්පත් | | | | |
| අයදුම්පත් ගණන | | | | |
| | *නව* | 176 | 263 | 49 |
| | *ව්‍යාප්තීන්* | 43 | 36 | -16 |
| | *එකතුව* | **219** | **299** | 37 |
| ආ. අනුමත කිරීම් | | | | |
| අනුමත ව්‍යාපෘති ගණන | | | | |
| | *නව* | 121 | 193 | 60 |
| | *ව්‍යාප්තීන්* | 39 | 39 | 0 |
| | *එකතුව* | **160** | **232** | 45 |
| | | | | |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 277,655 | 467,107 | 68 |
| | *- දේශීය (රු. මි.)* | 147,215 | 229,299 | 56 |
| | ***-එකතුව (රු. මි.)*** | **424,870** | **696,406** | 64 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | | **48,868** | **55,120** | 13 |
| ඇ. අත්සන් කරන ලද ගිවිසුම් | | | | |
| ගිවිසුම් ගණන | | | | |
| | *නව* | 128 | 128 | 0 |
| | *ව්‍යාප්තීන්* | 37 | 35 | -5 |
| | *එකතුව* | **165** | **163** | -1 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 238,852 | 273,008 | 14 |
| | *- දේශීය (රු. මි.)* | 133,573 | 132,485 | -1 |
| | ***-එකතුව (රු. මි.)*** | **372,425** | **405,493** | 9 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | | **45,056** | **37,929** | -16 |
| ඈ. ආරම්භ කළ ක්‍රියාත්මක කිරීම් | | | | |
| ව්‍යාපෘති ගණන | | | | |
| | *නව* | 93 | 105 | 13 |
| | *ව්‍යාප්තීන්* | 0 | 4 | - |
| | *එකතුව* | **93** | **109** | 17 |
| | | | | |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 105,886 | 88,976 | -16 |
| | *- දේශීය (රු. මි.)* | 45,099 | 46,977 | 4 |
| | ***-එකතුව (රු. මි.)*** | **150,985** | **135,953** | -10 |
| | සේවා නියුක්ති ධාරිතාව (ප්‍රමාණය) | **16,235** | **17,176** | 6 |
| | | | | |
| ඉ. ආරම්භ කරන ලද වාණිජ මෙහෙයුම් | | | | |
| ව්‍යාපෘති ගණන | | | | |
| | *නව* | 91 | 77 | -15 |
| | *ව්‍යාප්තීන්* | 4 | 3 | -25 |
| | *එකතුව* | **95** | **80** | -16 |
| | | | | |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 6,658 | **10,399** | 56 |
| | *- දේශීය (රු. මි.)* | 41,723 | **22,164** | -47 |
| | ***-එකතුව (රු. මි.)*** | 48,381 | **32,563** | -33 |
| සේවා නියුක්තිය (ඇස්තමේන්තු) (සංඛ්‍යාව) | | **17,303** | **16,876** | -2 |

| | | | | |
|---|---|---|---|---|
| ඊ. (දෙසැම්බර් මස අවසන් වන විට) වාණිජ ක්‍රියාකාරීත්වයෙහි නියුතු ව්‍යාපෘති සංඛ්‍යාව** | | | | |
| | මව් ව්‍යාපෘති/ ප්‍රධාන ව්‍යාපෘති | 1,577 | 1598 | 1 |
| | ව්‍යාප්තීන් | 163 | 173 | 6 |
| ඇගලුම් කම්හල් | 200 ව්‍යාපෘතිය | 115 | 113 | -2 |
| | එකතුව | **1,855** | **1,884** | 2 |
| උ. විදේශ සෘජු ආයෝජන (ජන දෙසැ.) | | | | |
| | *(ඇ.ඩො. මිලියන)* | **1,066** | **1,338** | 26 |
| | *(රු. මිලියන)* | **117,868** | **170,733** | 45 |
| | | | | |
| ඌ. අපනයන (ජන දෙසැ.) | | | | |
| එකතුව *(ඇ.ඩො. මිලියන)* | | **6,571** | 6,125 | -7 |
| එකතුව *(රු. මිලියන)* | | **726,594** | 781,613 | 8 |
| | | | | |
| එ. ආනයන (ජන දෙසැ.) | | | | |
| එකතුව *(ඇ.ඩො. මිලියන)* | | **4,399** | **4,603** | 5 |
| එකතුව *(රු. මිලියන)* | | **486,414** | **587,409** | 21 |
| | | | | |
| | භාණ්ඩ අනුව - *(රු. මිලියන)* | | | |
| | ප්‍රාග්ධන භාණ්ඩ | 98,128 | 124,816 | 27 |
| | අමුද්‍රව්‍ය | 382,663 | 453,669 | 19 |
| | අනෙකුත් ද්‍රව්‍ය | 5,623 | 8,924 | 59 |
| ඒ. දෙසැම්බරය අවසානය වන විට සේවා නියුක්තිය (සම්පූර්ණ) | | **450,913** | **457,986** | 2 |
| | | | | |
| ඔ. ව්‍යාපෘති ගණන*** | | | | |
| අවසන් කරන ලද/ වැසූ ව්‍යාපෘති | | 30 | 32 | 7 |
| නවතා දමන ලද ව්‍යාපෘති | | 5 | 9 | 80 |
| අවලංගු කරන ලද ගිවිසුම් | | 44 | 78 | 77 |
| එකතුව | | **79** | **119** | 51 |
| | | | | |
| *ආයෝජන මණ්ඩල නීතියෙහි 16වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති* | | | | |
| අ. අනුමැතිය ලබාදීම් | | | | |
| අනුමත ව්‍යාපෘති ගණන | | **23** | **32** | 39 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 2,517 | 3,644 | 45 |
| | *- දේශීය (රු. මි.)* | 1,136 | 348 | -69 |
| | *-එකතුව (රු. මි.)* | **3,653** | **3,992** | 9 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | | **594** | **2,170** | 265 |
| ආ. වාණිජ කටයුතු වල නියැලි ව්‍යාපෘතීන් (සම්පූර්ණ)** | | | | |
| ව්‍යාපෘති ගණන | | **771** | **712** | -8 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | | |
| | *- විදේශීය (රු. මි.)* | 19,421 | 19,841 | 2 |
| | *- දේශීය (රු. මි.)* | 10,087 | 10,386 | 3 |
| | *-එකතුව (රු. මි.)* | **29,508** | **30,227** | 2 |
| | සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | **37,029** | **33,425** | -10 |

| | 2011 | 2012 |
|---|---|---|
| විදේශ විනිමය අනුපාතය (ඇමරිකානු ඩොලර්) | ***110.57*** | 127.60 |

* තාවකාලික
ඉල්ලුම්පත්: ලැබුණු මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව (ප්‍රතික්ෂේප කළ ව්‍යාපෘති හා ඉල්ලා අස්කර ගත් ව්‍යාපෘති ඇතුළුව)
තක්සේරු කරන ලද ආයෝජන ප්‍රමාණයක්/ සේවා නියුක්තිය ව්‍යාප්ත කිරීම් වල වටිනාකම සහිතව අගයද ඇතුළුව

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (MIS- 2013 පෙබරවාරි 9, 2013 මාර්තු 25 වන දින සිට 28වන දින දක්වා, 2013 මැයි 22)
**
වාණිජ මෙහෙයුම් ආරම්භ කිරිමෙන් පසු අවලංගු කරන ලද / වසා දමන ලද අත්හිටවූ ව්‍යාපෘති හැර
***
වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු අවලංගු කරන ලද/ වසා දමන ලද /අත්හිටවන ලද ව්‍යාපෘති හැර (ව්‍යාප්ත කිරීම් හැර)
තාවකාලිකව නවතා දමන ලද ව්‍යාපෘති (ව්‍යාප්තීන් හැර)
(ව්‍යාපෘතිවල දැනට පවතින තත්ත්වයන් අනුව)
සම්පාදනය කළේ සංඛ්‍යාන ඒකකය/පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2012 වර්ෂයෙහි අනුමත ව්‍යාපාති වල සාරාංශය ආංශික වශයෙන් *

### (ආයෝජන මණ්ඩල නීතියේ 17 වන කොටස යටතේ අනුමත)

| අංශය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත ආයෝජනය (රු. මිලියන) | | | ආයෝජන කොටස % | රැකියා ධාරිතාව | රැකියාස්ථ කොටසේ ධාරිතාව % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| **නිෂ්පාදනය නව ව්‍යාපෘති** | **75** | **57,234.46** | **31,411.25** | **88,645.72** | **12.73** | **17,718.00** | **32.14** |
| ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනය | 14 | 21,360.10 | 14,703.93 | 36,064.02 | **5.18** | 1,994.00 | **3.62** |
| ආහාර නිෂ්පාදනය (සැකසුම්) | 16 | 18,460.33 | 2,959.20 | 21,419.53 | **3.08** | 1,934.00 | **3.51** |
| පාවහන් නිෂ්පාදනය | 2 | 6,110.40 | 4,471.17 | 10,581.57 | **1.52** | 1,514.00 | **2.75** |
| ඉලෙක්ට්‍රොනික හා විදුලි භාණ්ඩ | 5 | 4,534.65 | 879.30 | 5,413.95 | **0.78** | 818.00 | **1.48** |
| වෛද්‍ය හා ඖෂධවේදී නිෂ්පාදනය | 2 | 1,906.40 | 1,937.60 | 3,844.00 | **0.55** | 817.00 | **1.48** |
| අනෙකුත් නිපදවන ලද නිශ්පාදිත (N.E.S) | 4 | 694.79 | 1,459.74 | 2,154.52 | **0.31** | 360.00 | **0.65** |
| කාර්මික, රසායනික, පෙට්‍රෝලියම්, ගල්අඟුරු හා ප්ලාස්ටික් | 4 | 1,166.40 | 418.86 | 1,585.26 | **0.23** | 2,218.00 | **4.02** |
| ඇඟළුම් නිෂ්පාදනය | 5 | 230.89 | 1,166.20 | 1,397.08 | **0.20** | 3,567.00 | **6.47** |
| ධීවර බෝට්ටු | 2 | 1,095.00 | 85.40 | 180.40 | **0.17** | 263.00 | **0.48** |
| ප්‍රවාහන උපකරණ | 2 | 159.60 | 970.00 | 1,129.60 | **0.16** | 293.00 | **0.53** |
| රෙදිපිළි හා ඇඳුම් | 2 | 327.50 | 736.92 | 1,064.42 | **0.15** | 2,246.00 | **4.07** |
| පදම්කළ වානේ නිෂ්පාදනය | 4 | 433.22 | 174.78 | 608.00 | **0.09** | 238.00 | **0.43** |
| දැව නිෂ්පාදනය | 3 | 219.71 | 379.42 | 599.12 | **0.09** | 306.00 | **0.56** |
| ඇඟළුම් උපාංග | 1 | - | 473.10 | 473.10 | **0.07** | 46.00 | **0.08** |
| හම් භාණ්ඩ | 2 | 148.20 | 282.00 | 430.20 | **0.06** | 420.00 | **0.76** |
| PVC නිෂ්පාදනය | 4 | 189.77 | 79.13 | 268.90 | **0.04** | 119.00 | **0.22** |
| පාන හා දුම්කොළ | 1 | 104.52 | 104.52 | 209.04 | **0.03** | 382.00 | **0.69** |
| රබර් නිෂ්පාදනය | 1 | 3.00 | 130.00 | 133.00 | **0.02** | 152.00 | **0.28** |
| කොහු නිෂ්පාදනය | 1 | 90.00 | - | 90.00 | **0.01** | 31.00 | **0.06** |
| **කෘෂිකර්මය** | **7** | **8,136.73** | **1,231.81** | **9,368.54** | **1.35** | **987.00** | **1.79** |
| **සේවා/ යටිතල පහසුකම් නව ව්‍යාපෘති** | **111** | **399,582.53** | **182,413.14** | **581,995.67** | **83.57** | **29,280.00** | **53.12** |
| සාප්පු හා කාර්යාල සංකීර්ණ | 16 | 137,947.19 | 37,105.66 | 175,052.85 | **25.14** | 4,641.00 | **8.42** |
| හෝටල්, ආපන ශාලා සේවා සහ වින්දන සංකීර්ණ | 28 | 79,299.61 | 44,150.91 | 123,450.52 | **17.73** | 7,596.00 | **13.78** |
| කාර්මික වතු සංවර්ධන | 1 | 93,100.00 | - | 93,100.00 | **13.37** | 4,975.00 | **9.03** |
| නිවාස සහ දේපල සංවර්ධන | 14 | 26,983.97 | 19,754.52 | 46,738.49 | **6.71** | 4,439.00 | **8.05** |
| ඉන්ධන/ ගෑස්/ පෙට්‍රෝලියම් හා වෙනත් | 1 | - | 36,682.50 | 36,682.50 | **5.27** | 1,402.00 | **2.54** |
| දුරකතන හා සන්නිවේදන ජාල | 2 | 14,828.20 | 18,511.80 | 33,340.00 | **4.79** | 98.00 | **0.18** |
| අධ්‍යාපන සහ පුහුණු ආයතන හා පර්යේෂණ සංවිධාන | 6 | 21,829.80 | 387.00 | 22,216.80 | **3.19** | 1,674.00 | **3.04** |
| බලශක්ති උත්පාදන බලාගාර | 12 | 5,218.27 | 6,830.93 | 12,049.20 | **1.73** | 718.00 | **1.30** |
| කර්මාන්තශාලා හා ගොඩනැගිලි ඉදිකිරීම් | 1 | 9,138.24 | - | 9,138.24 | **1.31** | 62.00 | **0.11** |
| අනෙකුත් සේවා(N.E.S) | 5 | 2,487.68 | 5,047.20 | 7,534.88 | **1.08** | 870.00 | **1.58** |
| රෝහල් සේවා හා වෛද්‍ය මධ්‍යස්ථාන | 6 | 787.50 | 5,328.07 | 6,115.57 | **0.88** | 1,271.00 | **2.31** |
| නැව් අළුත්වැඩියා සහ නැව් කළමනාකරණ | 1 | 5,368.00 | 8.54 | 5,376.54 | **0.77** | 136.00 | **0.25** |
| බහාලුම් සේවා, ගුදම් සහ පැටවුම් ලබාදීම් | 4 | 277.02 | 2,825.49 | 3,102.51 | **0.45** | 380.00 | **0.69** |
| විවේක හා විනෝද සේවා | 2 | 1,498.50 | 1,535.28 | 3,033.78 | **0.44** | 116.00 | **0.21** |
| ගුවන් සේවා | 3 | - | 2,553.53 | 2,553.53 | **0.37** | 95.00 | **0.17** |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා | 2 | - | 1,438.84 | 1,438.84 | **0.21** | 158.00 | **0.29** |
| ඇමතුම් මධ්‍යස්ථාන/BPO සහ ආගන්තුක සත්කාර මධ්‍යස්ථාන | 4 | 772.95 | 56.91 | 829.85 | **0.12** | 422.00 | **0.77** |
| තොරතුරු තාක්ෂණික ශක්‍යතාව සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවා | 3 | 45.60 | 195.97 | 241.57 | **0.03** | 227.00 | **0.41** |
| **නව ව්‍යාපෘති උප එකතුව** | **193** | **464,953.72** | **215,056.20** | **680,009.92** | **97.65** | **47,985.00** | **87.06** |
| **පවත්නා ව්‍යාපෘති වල ව්‍යාප්ත කිරීම් වල උප එකතුව** | **39** | **2,153.74** | **14,242.72** | **16,396.46** | **2.35** | **7,135.00** | **12.94** |
| **මුළු එකතුව** | **232** | **467,107.46** | **229,298.92** | **696,406.38** | **100.00** | **55,120.00** | **100.00** |

* තාවකාලික

සටහන: අවලංගු කිරීම් ඇතුළත්ය

මූලාශ්‍රය: කළමනාකරණ තොරතුරු පද්ධතිය
ආයෝජන මණ්ඩලය (2013මැයි22 වන දින)

## 2012 වර්ෂයෙහි අනුමත ව්‍යාපාති වල සාරාංශය ආංශික වශයෙන් *

### (ආයෝජන මණ්ඩල නීතියේ 16 වන කොටස යටතේ අනුමත)

| අංශය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත ආයෝජනය (රු. මිලියන) | | | ආයෝජන කොටස % | රැකියා ධාරිතාව | රැකියාස්ථ කොටසේ ධාරිතාව % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| **නිෂ්පාදන – නව ව්‍යාපෘති** | **6** | **782** | **16** | **798** | **19.98** | **1,129** | **52.03** |
| පාන හා දුම්කොළ | 1 | 275 | - | 275 | 6.89 | 500 | 23.04 |
| ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනය | 1 | 78 | - | 78 | 1.95 | 25 | 1.15 |
| ආභරණ හා ආයිත්තම් | 1 | 29 | - | 29 | 0.71 | 14 | 0.65 |
| ඉලෙක්ට්‍රොනික හා විදුලි භාණ්ඩ | 1 | 280 | - | 280 | 7.01 | 300 | 13.82 |
| පදම් කළ වානේ නිෂ්පාදනය | 1 | 63 | 16 | 79 | 1.98 | 40 | 1.84 |
| ඇඟළුම් නිෂ්පාදනය | 1 | 57 | - | 57 | 1.43 | 250 | 11.52 |
| **කෘෂිකර්මය – නව ව්‍යාපෘති** | - | - | - | - | - | - | - |
| කෘෂිකර්මය | - | - | - | - | - | - | - |
| **සේවා / යටිතල පහසුකම් නව ව්‍යාපෘති** | **26** | **2,862** | **332** | **3,195** | **80.02** | **1,041** | **47.97** |
| අධ්‍යාපනික හා පුහුණු ආයතන හා පර්යේෂණ සංවිධාන | 2 | 180 | 0 | 179.50 | 4.50 | 22 | 1.01 |
| අපනයන/ ආනයන වෙළඳ මධ්‍යස්ථාන හා මිලදී ගැනීමේ කාර්යාල | 2 | 432 | 105 | 537.06 | 13.45 | 55 | 2.53 |
| හෝටල්, ආපන ශාලා සේවා සහ වින්දන සංකීර්ණ | 4 | 386 | 0 | 386.00 | 9.67 | 79 | 3.64 |
| නිවාස සහ දේපල සංවර්ධන | 1 | 85 | 0 | 84.50 | 2.12 | 12 | 0.55 |
| රෝහල් සේවා හා වෛද්‍ය මධ්‍යස්ථාන | 1 | 40 | 0 | 40.20 | 1.01 | 10 | 0.46 |
| ආයෝජන බඳු සමාගම් | 6 | 696 | 112 | 807.74 | 20.23 | 527 | 24.29 |
| මෘදුකාංග සංවර්ධන | 1 | 30 | 89.62 | 119.49 | 2.99 | 6 | 0.28 |
| කළමනාකරණ උපදේශන සමාගම් | 3 | 181 | 0 | 180.70 | 4.53 | 28 | 1.29 |
| රෙදිපිළි පරීක්ෂණ සේවා | 1 | 239 | 0 | 239.45 | 6.00 | 26 | 1.20 |
| කර්මාන්තශාලා හා ගොඩනැගිලි ඉදිකිරීම් | 3 | 511 | 26 | 537.45 | 13.46 | 260 | 11.98 |
| ආපනශාලා හා තානායම් | 1 | 44 | 0.00 | 43.80 | 1.10 | 6 | 0.28 |
| අනෙකුත් සේවා | 1 | 39 | 0.00 | 38.86 | 0.97 | 10 | 0.46 |
| මුළු එකතුව | **32** | **3,644** | **348** | **3,992** | **100.00** | **2,170** | **100.00** |

* තාවකාලික
සටහන: අවලංගුකිරීම් ඇතුළත්ව
මූලාශ්‍රය: කළමනාකරණ තොරතුරු පද්ධතිය ආයෝජන මණ්ඩලය (2013 මැයි 23)

# ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය

**ප්‍රධාන කාර්යාලය (ලෝක වෙළඳ සංකීර්ණ කාර්යාලය)**
05, 06, 08, 09, 19, 24, 25 සහ 26 මහල්
බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
තැ.පෙ. 1768, ඇචිලන් චතුරශ්‍රය,
කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2434403-5, 2435027, 2447531, 2385972-6, 2346131-3
ෆැක්ස් : (+94 11) 2447995, 2430512, 2329795, 2422407
වි.තැපැල් : infoboi@boi.lk

**ප්‍රධාන කාර්යාලය (SBJM කාර්යාලය)**
නො. 14, සර් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2435407-9, 2445779, 2331909 2331910-3, 2342404
ෆැක්ස් : (+94 11) 2430625, 2399891
වි.තැපැල් : infoboi@boi.lk

**කටුනායක අපනයන සැකසුම් කලාපය**
කටුනායක, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2252364-5, 2252140, 2252038, 4833737, 4833741, 4833774, 4833779, 4833817, 4833819
ෆැක්ස් : (+94 11) 2253207
වි.තැපැල් : kepz@boi.lk

**බියගම අපනයන සැකසුම් කලාපය**
වල්ගම, මල්වාන, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2465206-09
ෆැක්ස් : (+94 11) 2465227
වි.තැපැල් : bepz@boi.lk

**හොරණ අපනයන සැකසුම් කලාපය**
බොරළුගොඩ, පෝරුවදණ්ඩ, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 34) 2269296, 2269752, 2258077
ෆැක්ස් : (+94 34) 2255687, 2258029
වි.තැපැල් : hepz@boi.lk

**මීරිගම අපනයන සැකසුම් කලාපය**
මහයායවත්ත, ලෝලුවගොඩ, මීරිගම, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2274657, 2276626, 2276393
ෆැක්ස් : (+94 33) 2274657, 2276393
වි.තැපැල් : mepz@boi.lk

**වතුපිටිවල අපනයන සැකසුම් කලාපය**
වතුපිටිවල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2281381, 2281604
ෆැක්ස් : (+94 33) 2282364
වි.තැපැල් : wepz@boi.lk

**මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය**
තිහාරිය, නිට්ටඹුව, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2288826, 2296166, 2296620
ෆැක්ස් : (+94 33) 2288826
වි.තැපැල් : mepp@boi.lk

**සීතාවක අපනයන සැකසුම් කලාපය**
අවිස්සාවේල්ල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 36) 2231082
ෆැක්ස් : (+94 36) 2231083
වි.තැපැල් : sip@boi.lk

**දකුණු කලාප කාර්යාලය**
කොග්ගල අපනයන සැකසුම් කලාපය
කොග්ගල, හබරාදූව, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 91) 2283425
ෆැක්ස් : (+94 91) 2283370
වි.තැපැල් : kgepz@boi.lk

**මධ්‍යම කලාප කාර්යාලය**
මහනුවර කර්මාන්ත උද්‍යානය, කෙන්ගල්ල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 81) 2420019, 2420025, 2423992, 2423994
ෆැක්ස් : (+94 81) 2420091, 2423995
වි.තැපැල් : kip@boi.lk

**වයඹ කලාප කාර්යාලය**
MAS ෆැබ්‍රික් උද්‍යානය, කුරුණෑගල පාර, තුල්හිරිය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2277037, 2277038
ෆැක්ස් : (+94 37) 2277036
වි.තැපැල් : nwro@boi.lk

**පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය**
කෑගල්ල පාර, පොල්ගහවෙල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2244657 / 41526
ෆැක්ස් : (+94 37) 2244657
වි.තැපැල් : pwepz@boi.lk

**මාවතගම අපනයන සැකසුම් කලාපය**
ඩෙනේවර් වතුයාය, මහනුවර පාර, මාවතගම, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2298147
ෆැක්ස් : (+94 37) 2296041
වි.තැපැල් : mwepz@boi.lk

**මධ්‍යම සත්‍යෙක්ෂණ පර්යන්තය**
සිලෝන් ෂිපිං ලයින්ස් අංගනය
අංක 70, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2547485, 4411591, 4978969
ෆැක්ස් : (+ 94 11) 2547485, 4411592, 026-2233002

**ගුවන් භාණ්ඩ සත්‍යෙක්ෂණ ඒකකය**
බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ,
කටුනායක, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2252155, 4833834, 2265183
ෆැක්ස් : (+94 11) 2252155

**ආයෝජන මණ්ඩලයේ විශේෂ ආර්ථික කලාපය - ත්‍රිකුණාමලය**
ප්‍රීමා කම්හල් පාර, චයිනා බේ, ත්‍රිකුණාමලය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 26) 2233003
ෆැක්ස් : (+94 26) 2233002

**ආයෝජන මණ්ඩලයේ මිරිජ්ජවිල කාර්මික උද්‍යානය, මිරිජ්ජවිල**
හම්බන්තොට, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 47) 2221596

**හම්බන්තොට කලාප කාර්යාලය**
කාමර අංක 302, පරිපාලන සංකීර්ණය, රුණු මාගම්පුර,
සිරිබෝපුර, හම්බන්තොට, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 47) 2256800
ෆැක්ස් : (+94 47) 2256800

**යාපනය කලාප කාර්යාලය**
NHDA ගොඩනැගිල්ල, චන්ද්‍රකුලි, යාපනය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 21) 2221336, 2222130
ෆැක්ස් : (+94 21) 2221336

BOI
SRI LANKA

26 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01.
Level 26, West Tower, World Trade Centre, Echelon Square, Colombo 01.

දුරකථන/Tel: (94) 11 2434403-5, 2435027, 2447531, 2385972-6, 2346131-3
ෆැක්ස්/Fax: (94) 11 2447995, 2329795
ඊ-මේල්/E-mail: infoboi@boi.lk    වෙබ් අඩවිය/Website: www.investsrilanka.com